wijeya newspapers

Follow us on @lankadeepa | www.facebook.com /lankadeepa | subscribed :lankadeepa online | www.lankadeepa.lk

අඛණ්ඩවම 16 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

★★★

32 වැනි කාණ්ඩය | 62 වැනි පත්‍රය | පිටු 12 යි | විජය ප්‍රකාශනයකි | 2022 නොවැම්බර් මස 21 වැනිදා සඳුදා | මිල රුපියල් 60.00 යි

## බස්නාහිර පළාත් කෘෂි අමාත්‍යාංශ ගබඩාවෙන් කඩදාසි බණ්ඩල් 300 ක් පන්නලා

5 පිටුව බලන්න

සේවකයෝ දෙදෙනෙක් අත්අඩංගුවට

# අරාබිකරයට කතුන් විකුණන ජාවාරමාත් ගෝලයාත් රිමාන්ඩ්

## එක්කෙනා ලක්ෂ දහය විස්ස ගාණේ විකුණලා

■ කටුනායක ටී.කේ.ජී. කපිල, මීගමුව අධිකරණ ඩබ්ලිව්. කීර්ති සහ ඉන්දිකා රාමනායක

කාන්තාවන් ඩුබායි, ඕමානය සහ අබුඩාබිය යන රාජ්‍යයන් වෙත සංචාරක වීසාමත රැගෙන ගොස් එරට ධන කුවේරයන් ඇතුළු විවිධ පුද්ගලයන්ට රුපියල් ලක්ෂ ගණනින් අලෙවි කරමින් මිනිස් ජාවාරමේ නිරත වූ බව කියන ප්‍රධාන ජාවාරම්කරුවෙක් සහ ඔහුගේ ජාවාරම්වල දේශීය නියෝජිතයෙක් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබ සිටිති.

6 වැනි පිටුවට

# කෝටි අට ලක්ෂයක ආයෝජනවලින් කෝටි පන් ලක්ෂයක්ම බහිරවයා ගිලලා

## විගණන වාර්තාවක් කියයි

■ මුදිතා දයානන්ද

රජය විසින් 2006 සිට 2021 වසර දක්වා කරන ලද රුපියල් කෝටි අටලක්ෂ විසිදහසක ආයෝජනවලින් රුපියල් කෝටි පන්ලක්ෂ හතළිස් එක්දාහක වත්කම් හඳුනාගත නොහැකිවී ඇති බව විගණන වාර්තාවකින් අනාවරණය වේ.

මෙය ප්‍රතිශතයක් ලෙස ගතහොත් එම කාලය තුළ ආයෝජනවලින් සියයට 66ක් බවද එහි දැක්වේ.


6 වැනි පිටුවට

## කෝටි 12 ක් වංචා කළ අක්ක - නගෝ අත්අඩංගුවට

7 පිටුව බලන්න

## ඉඩම් ගැටලු විසඳන්න පළාත් මට්ටමින් කමිටු 8 ක්

ජනපති රනිල් කියයි



■ අංජුල මහික වීරරත්න, මඩුකන්ද - සිතුම් චතුරංග සහ වන්නි - රොමේෂ් මධුසංඛ

ඉඩම් ගැටලු නිරාකරණය කිරීමට පළාත් මට්ටමින් කමිටු 8ක් පත් කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවැසීය.


6 වැනි පිටුවට

## මෙරට දරුවෝ 56,000 ක් උග්‍ර මන්දපෝෂණයෙන්

වයස 5 ට අඩු දරුවන්ට වහා ප්‍රතිකාර ඕනෑ

යුනිසෙෆ් අලුත්ම වාර්තාව කියයි

5 පිටුව බලන්න



## බැසිල් යළි එයි

මැති ඇමැති පිරිසක් පිළිගන්න ගිහින්

5 පිටුව බලන්න

## ග්ලයිෆොසේට් තහනම ඉවතට

■ අංජුල මහික වීරරත්න

ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය තීරණය කර තිබේ.

මීට අදාළව ගැසට් පත්‍රය මුද්‍රණය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ අත්සනින් යුතුව රජයේ මුද්‍රණාලයට බාර දුන් බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස සමරසිංහ මහතා පැවැසීය.

6 වැනි පිටුවට

## හාම්පුතා කුඩුවේ: බල්ලා දොර ළඟ මුරට



පවුල් ආරවුලක් සම්බන්ධයෙන් බුලත්සිංහල පොලිසිය මගින් අත්අඩංගුවට ගත් බුලත්සිංහල ප්‍රදේශයේ පුද්ගලයකු සිරමැදිරියේ රඳවා සිටියදී ඔහුගේ නිවසේ ඇතිකරන සුනඛයා ද පැමිණ සිරමැදිරිය ඉදිරියට වී සිට ඇත. "බිංදු" නමැති එම සුනඛයා සිරමැදිරිය ඉදිපිටට වී සිටි අයුරු ඡායාරූපයේ දැක්වේ.

## රුමේනියා රැකියා පෙන්වා සම්මුඛ පරීක්ෂණ කළ පිටරැටියකු ඇතුළු 4 ක් අත්අඩංගුවට

■ යොහාන් හාසුර

රුමේනියාවේ රැකියා ලබාදෙන බවට සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ විදේශිකයකු ඇතුළු පුද්ගලයන් සිවුදෙනකු වියේ (20) පස්වරුවේ අත්අඩංගුවට ගත් බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උසස් නිලධාරියෙක් පැවසීය.

6 වැනි පිටුවට

## දුම්රිය කාලසටහන මුළුමනින්ම වෙනස් කෙරේ

අවසන් තීරණය අද

## ඉඩම් සංස්ථාව කෝටි 27 ක ඉඩමක් අතයට විකුණලා

විගණන වාර්තාවෙන් හෙළිවෙයි

■ සුජිත් හේවාජුලිගේ

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රුපියල් කෝටි 27කට වැඩි වටිනා ඉඩමක් නියමිත අනුමැතිය ලබා නොගෙන විකුණා ඇතැයි ජාතික විගණන කාර්යාලය පවසයි.

6 වැනි පිටුවට

පණ්කජ රුවින්දගේ සරදම්





## රුපියල් 475 මාස්ක් 2050 ගාණේ 1,080 ක් අරන් රජයට ලක්ෂ 17 ක් පාඩුකරලා

■ මුදිතා දයානන්ද

රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාවෙන් එකක් රුපියල් 475 කට මිලදී ගත හැකිව තිබියදී රාගම ශික්ෂණ රෝහලේ කළමණාකාරිත්වය 2020 වසරේදී එකක් 2050 බැගින් එන් 95 මුහුණු ආවරණ 1080ක් මිලදී ගැනීමෙන් රජයට රුපියල් දාහත් ලක්ෂයක පාඩුවක් සිදුකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන ලෙස විගණකාධිපති

විධිමත් පරීක්ෂණයකට විගණකාධිපතිගෙන් අමාත්‍යාංශයට නිර්දේශ

දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශයට නිර්දේශ කර ඇත.

6 වැනි පිටුවට

## ජ'පුර සරසවිය අසලදී පොලිස් නිලධාරීන්ටත් ජල ප්‍රහාරයක්


5 පිටුව බලන්න

## ග්‍රෑන්ඩ්පාස් වෙඩි තැබීමකින් 'මන්නා රමේෂ්' ට බරපතළ තුවාල

5 පිටුව බලන්න

## කුරුණෑගල ෆිනෑන්ස් සමාගමක කෝටි 991 ක් පිල්ලි ගහලා

තැන්පත්කරුවන්ගෙන් පොලිස්පතිට පැමිණිලි



# ලබන වසරේ සිට රටපුරා සිසුන්ගෙන් අඩකට දිවා ආහාරය

## - ඇමැති සුසිල් කියයි

■ රංජන් කස්තූරි

**ලබන වසරේ (2023) සිට රට පුරා සියලු ප්‍රදේශ නියෝජනය වන පරිදි පාසල් සිසුන්ගෙන් සියයට 50කට පමණ දිවා ආහාරය ලබා දෙන බව අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා පැවැසීය.**

මේ වසරේ (2022) පාසල් දිවා ආහාර වැඩසටහන යටතේ පාසල් සිසුන්ගෙන් සියයට 21කට පමණක් දිවා ආහාරය ලැබුණු බව ද සුසිල් ප්‍රේමජයන්ත මහතා සඳහන් කළේය.

ලබන වසරේ පාසල් දිවා ආහාර වැඩසටහන සඳහා රුපියල් මිලියන 19,100ක මුදලක් වෙන් කර තිබෙන බව ද ඇමැතිවරයා කීය.

පාසල් දිවා ආහාර වැඩසටහන සඳහා මේ වසරේ වෙන් කර තිබුණේ, රුපියල් මිලියන 4,000ක පමණ මුදලක් පමණක් බව ද සුසිල් ප්‍රේමජයන්ත මහතා පැවැසීය.

# තාක්ෂණ-කාර්මික ඩිප්ලෝමා ප්‍රදාන උළෙල හෙට

**තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාලවල සිසුන් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය හෙට (22) කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්.ඩබ්. රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එස්.සී. ජගත් මහතාගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන එම උත්සවයේදී සිසු සිසුවියෝ 2438 දෙනෙක් ඩිප්ලෝමා සහතික ලබති.


කෘෂිකර්ම, තොරතුරු හා සන්නිවේදන, මෙකාට්‍රොනික්, මෝටර් රථ වාහන, විදුලි සංදේශ, බේකරි හා සූපවේදී, ප්‍රමාණ සමීක්ෂණ, මැණික් හා ස්වර්ණාභරණ, ගොඩනැගිලි ඉදිකිරීම් හා සේවා, නාවික හා සැපයුම් සේවා කළමනාකරණ, මූල්‍ය හා ගිණුම් ක්ෂේත්‍ර ආදී පාඨමාලා රැසක් සිසු සිසුවියෝ එම ඩිප්ලෝමා සඳහා සුදුසුකම් ලබා සිටිති.

# තුන්මංසල

| | |
|---|---|
| කුසගිනි වැඩි විටදි යහගුණය | නොතකති |
| නොහොබින වැඩවලට සමහරුද | පෙළඹෙති |
| අල්ලාගත් පසු දුක්බර දිවිය | නොසොයති |
| දඬුවම් දෙන්න නීතියෙ පොතම | පෙරළති |

තිලක

# තිස්ස හේවාවිස්සගේ හිනා වැස්ස



# ලුහුඬු දැන්වීම්

## රථ වාහන

### ඕනෑකර තිබේ

**ෆිනෑන්ස්** ඇරියස් සහ සීස් කළ වාහන බේරා දෙන අතර, මිලදී ගැනීම, වාහන තබා මුදල් දීමද කරනු ලැබේ. JKR එන්ටර්ප්‍රයිස්. 0714111267 L385469-1

### මෝටර් සයිකල් උවමනාය

**යතුරුපැදි** ෆිනෑන්ස් පියවා ඉහළ මිලට. Hero, TVS, Bajaj, Honda, CT 100, Platina, Diskavery, Scooty. 0716-222339, 0773-680594 L384657-1

## ගේ දොර ඉඩකඩම්

### විකිණීමට

**90%ක්** සම්පූර්ණ කර ඇති පර්චස් 11.7ක දෙමහල් නිවසක් විකිණීමට ඇත. (පන්නිපිටිය) අමතන්න 0773-283568 L385222-1

**කඩුවෙල** මාලඹේ නිල්පලාවත්ත තාප්ප ගැසූ පර්චස් 39 1/2ක කුඹුරකට මායිම් වූ හිස් ඉඩම පර්චසය රු. ලක්ෂ අටහමාරයි. 0767536042, 0713290185 L377027-4

**නුගේගොඩ** පාගොඩ පාරට සහ දේවාල පාරට මුහුණලා 20.50 පර්චස් ඉඩම විකිණීමට ඇත. අමතන්න: 0777360802, 0741110360. L378301-1

**මොරටුව** රාවතාවත්ත හන්දියට විනාඩි 5 දුරින් සියලු පහසුකම් සහිතව ලුනාව කලපුවට මුහුණලා. අමතන්න: 0718007888, 0712557888. L378305-1

**ගැලනිගම** අධිවේගී පිවිසුමට විනාඩි 5න් බස් පාරට 150m. අමතන්න: 0741110360, 0718007888. L378174-1

**මොරගහහේන** උඩුව බස් පාරෙන් තල්ගහවිල හන්දියට 300m දුරින් සියලු පහසුකම් සහිතව විකිණීමට. අමතන්න: 0741110360, 0718007888. L378300-1

## වෙළඳ

### විවිධ දේ උවමනාය

**ලිට්රෝ** සහ ලාෆ් (Litro/ Laughs) හිස් ගෑස් සිලින්ඩර් මිලදී ගනු ලැබේ. ඕනෑම ප්‍රමාණයෙන් ඔබ ප්‍රදේශයටම පැමිණ ලබාගන්නෙමු. 0760677678 L379791-1

## පුද්ගලික

### නම් වෙනස් කිරීම

**කුලියාපිටිය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුලියාපිටිය වලහුන්දූව මුල්ල, රෙරුකන පාරේ පදිංචි බෝගොඩගේ ... යන නමින් ... පටන් ... යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් දන්වා සිටිමි. L385048-1

**කෑගල්ල** දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 18A ... ග්‍රාම නිලධාරී වසමේ අංක B/100/3A, ... ගොවි ... හතුරුසිංහ ... නිරෝෂන් ... යට, ... නිලංකා ... භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, ... දන්වා සිටිමි. L385507-1

**කෑගල්ල** දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 30A ... අංක 21/1, ... විරූ ... නයේ ... ඉදිරියට ... යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L385508-1

**කොළඹ** දිස්ත්‍රික්කයේ 546 වෙනිකන්ද ග්‍රාමසේවා වසමේ 34 ... පදිංචි ... මම, ... ඉදිරියට ... යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L385045-1

**කොළඹ** දිස්ත්‍රික්කයේ ... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 8/1 ... 906675 ... මෙයින් දැනුම් දෙමි. L382777-1

**කුරුණෑගල** දිස්ත්‍රික්කයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 773 ... ග්‍රාම නිලධාරී වසමේ ... ඉදිරියට ... යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් ... සිටිමි. L384440-1

**කුරුණෑගල** දිස්ත්‍රික්කයේ ... ලේකම් කොට්ඨාසයේ ... නිලධාරී වසමේ 246/53, මීගමු පාර, කුරුණෑගල ලිපිනයේ පදිංචි රණවක ආරච්චිගේ අරුණි උත්පලා වන මාගේ නම මින් ඉදිරියට රණවක ආරච්චිගේ අරුණි උත්පලා රණවක ලෙස භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L385475-1

**ගම්පහ** දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 272 මීගහවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පදිංචි නදිනි චංචලා ජයමිණි හපුආරච්චි වන අපගේ දියණිය මෙදින පටන් හපුආරච්චිගේ නදිනි චංචලා ජයමිණි යනුවෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L384390-1

**ගම්පහ** දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 34 ග්‍රාම නිලධාරී වසමේ 101 අංකයෙහි පදිංචි සේනාදිරි අතාඋදගේ ධනුක ප්‍රභාශ්වර සේනාරත්න වන මම මෙතැන් පටන්, සේනාදිරි අතාඋදගේ දිනුක මනුරංගන සේනාරත්න යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. මෙයට, සේනාදිරි අතාඋදගේ දිනුක මනුරංගන සේනාරත්න. L385509-1

**ගාල්ල** දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 176 කොට්ටව ග්‍රාම නිලධාරී වසමේ 207/A/1, දෙරපෙගෙදර, කොට්ටවගම ලිපිනයේ පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 688530695V හිමි හේවමානගේ සේනානි නමින් හැඳින් වූ මා මෙතැන් පටන්, හේවමානගේ සේනානි මල්ලිකා යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L1022621642-1

**දෙහිඅත්තකණ්ඩිය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 221, මුරුතගස්පිටිය පදිංචි ඇලගාව ගෙදර ලහිරු චමිල්ක සඳරුවන් යනුවෙන් භාවිතා කළමා මින් ඉදිරියට පොද්දල්වෙල ගොඩමුන්න වලව්වේ ලහිරු චමිල්ක සඳරුවන් යනුවෙන් භාවිතා කරන බව රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L384730-1

**මතුගම** ඉද්දගොඩ 806 බටහිර ග්‍රාමසේවා වසමේ පදිංචි කොඩිතුවක්කු ආරච්චිගේ නීතා ස්ටෙලා විජයන්ති වන මම මෙතැන් සිට කොඩිතුවක්කු ආරච්චිගේ නීතා ස්ටෙලා විජයන්ති ලෙස භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජන පාර්ශවයන්ටත් දන්වා සිටිමි. කොඩිතුවක්කු ආරච්චිගේ නීතා ස්ටෙලා විජයන්ති L384428-1

**මහනුවර** දිස්ත්‍රික්කයේ පස්බාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නො 31/3/A, වීකන්ද පතන, නාවලපිටිය දරණ ලිපිනයේ පදිංචි අබේරත්න වන මම, මාගේ නම අද පටන් ඇතුගල්පුර ගෙදර අබේරත්න යනුවෙන් වෙනස්කොට භාවිතා කරන බවත්, මින් ඉදිරියට සෑම ලියවිල්ලකම ඒ.ජී. අබේරත්න යනුවෙන් අත්සන් තබන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියළු දෙනා වෙතත් මෙයින් දැනුම් දෙමි. ඒ.ජී. අබේරත්න. L384826-1

**සබරගමු** පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන මැතිවරණ කොට්ඨාසයේ අංක 201/B කත්ලාන ග්‍රාම සේවා වසමේ පදිංචි කෝදාගොඩ හෙට්ටිගේ පියසේන වන මාගේ නම උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇත්තේ, පියසේන යනුවෙනි. එය කෝදාගොඩ හෙට්ටිගේ පියසේන යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, ලක්වාසීන්ටත් මෙයින් දැනුම් දෙමි. L385487-1

**සබරගමුව** පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන මැතිවරණ කොට්ඨාසයේ අයගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ අංක 194/A පිඹුර ග්‍රාම සේවා වසමේ පදිංචි ඇල්ලලගොඩ ගමගේ සෙනාදි දනුල්යා විජයතිලක වන මම මෙතැන් පටන්, ඇල්ලලගොඩ ගමගේ ඔහස්නා අකේලි දනුල්යා විජයතිලක යන නම භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, ලක්වාසීන්ටත් මෙයින් දැනුම් දෙමි. L385477-1

## රැකියා

### රියදුරන්

**අලුවිට** කාර්මික කලාපීය නිෂ්පාදන ආයතනයකට ... රියදුරන් ... වැටුප 75,000/- . 0776-093922 L384446-1

**සැහැල්ලු** වාහන රියදුරන් ... 0717-206949 L384572-2

### හෝටල් සහ බේකරි

**අප** බේකරියට පාන් ... මාසික පඩිය 75,000/- ... 0777371584 L385504-1

**දක්ෂ** බේකරි බාස් කෙනෙකු සහ ... 0777673690 L377500-2

**බේකරියට** නැවතී වැඩ කළ හැකි බාස්වරයෙක් ... 0771675478, 0719794818. L379184-2

**මාදිවෙල** හෝටලයට ... 75,000/- ... 0773729628 L385486-1

**රයිස්** ඇන්ඩ් කරි සහ කොත්තු ... 0789563915 L385185-1

**රයිස්** හා කොත්තු ... 0772446156 L385042-1

**හොරණට** ... 0757-971970, 0762-906675 L384621-2

### මේසන්වරු සහ වඩුබාස්වරු

**0717657353** කොළඹ අවට ... 0719-312215, 0717-657353 L384681-1

**දක්ෂ** වඩු බාස්වරු ... 2500/- ... 0717-206949 L384573-2

### ගෘහ සේවකයෝ

**කෑම** පිසීමට සහ ගෙදර දොර ... 0772920580 L384957-1

**මිරිහානේ** වෛද්‍යවරයකුගේ නිවසේ නැවතී සේවය කිරීමට වසර 2 පලපුරුද්ද ඇති (වයස 40 - 50 අතර) කාන්තාවක් අවශ්‍යයි. බ්‍රෝකර්වරු අනවශ්‍යයි. වැටුප: 35.000. 0777704887. L384713-1

### කාර්මිකයෝ

**0772331409** විදුලි කාර්මිකයින් ත්‍රීජේස් 3000/- සිංගල්ජේස් 2700/- නුපුහුණු 2000/- (පාඨමාලා හැදෑරූ) දිනපතා මුදල්. නවාතැන් ඇත. L379894-2

### ආරක්ෂක සේවා

**0766392057,** 0772205009 ආරක්ෂක නිලධාරී වැටුප් රු. 45,000/- වැඩියෙන්. අපාර්ට්මන්ට් - බොරැල්ල, රාජගිරිය, බම්බලපිටිය, දෙහිවල, කම්පැනි - පැපිලියාන, කැලණිය. L384967-1

**ආරක්ෂක** ඇබෑර්තු වහාම පිරවීමට පෞද්ගලික බැංකු සහ රාජ්‍ය ආයතන සඳහා සේවයේ යෙදවීමට ගම්පහ, මිනුවන්ගොඩ, මීගමුව, කටුනායක ප්‍රදේශවලින් ඇබෑර්තු. වැටුප රු. 45,000 ඉක්මවා. ආහාර නවාතැන් ආයතනය මගින් සපයේ. වහාම අමතන්න. කුමාර මහතා 0716825981. L384824-1

**ආරක්ෂක** සේවා ඇබෑර්තු: කොළඹ (0760957781/ 0760957782/ 0760957784), ගම්පහ (0778890283/ 0760957785), කළුතර (0778889847), ගාල්ල/ මාතර (0778887813), කුරුණෑගල (0778889936/ 0777637094), මාතලේ (0778886433), කෑගල්ල (0778859576) යන දිස්ත්‍රික්කයන්හි පවතින පුරප්පාඩු සඳහා ආරක්ෂක නිලධාරීන්/ නිලධාරිනියන් බඳවාගැනේ. ප්‍රධාන කාර්යාලය විමසීම් (0777709997/ 0778890264) සහන රැසක් සමගින් ඉහළ වැටුප් අපෙන්. ඒස් ෆ්‍රන්ට් ලයින් සෙකියුරිටි සොලුයුෂන්ස් (පුද්) සමාගම. L379290-3

**ආරක්ෂක** නිලධාරීන් S.S.O., O.I.C., L.S.O. කොහිලවත්ත, රාජගිරිය, කොල්ලුපිටිය, වත්තල ප්‍රදේශ. 137/A, රාජගිරිය පාර. 0777326024, 0115219419, 0759733007 L384615-2

**දියගම** (කොට්ටාව) විශ්වවිද්‍යාලය සඳහා ආරක්ෂක සේවා රැකියා ඇබෑර්තු ඇත. ඉතා ඉහළ වැටුප්. නවාතැන් පහසුකම් නොමිලේ. සලාක ක්‍රමයට ආහාර සපයනු ලැබේ. විමසීම්- 0702564159, 0714773879. L384821-1

**බියගම** කලාපයට අවු. 55 අඩු ආරක්ෂක නිලධාරීන්ද මාකොලට රාත්‍රියට පමණක් අයෙක්ද මොරටුවට රාත්‍රියට සහ දවල්ටද ආරක්ෂකයින් අවශ්‍යයි. 0777-186087 L384383-1

### කොණ්ඩා සැකසුම් රූපලාවන්‍ය

**පිලියන්දල** A/C සැලොනයට පිරිමි කොණ්ඩා රැවුල් කැපීමට දක්ෂයන් අවශ්‍යයි. ඉතා ඉක්මණින්. වැටුප් 2500/- අමතර කොමිස්. නවාතැන් ඇත. අමතන්න 0772-343292, 0773-155219 L384623-2

**සැලූන්** එකකට දක්ෂ අය අවශ්‍යයි. වැටුප රු. 75000 සිට. රාත්‍රී ආහාර සමඟ නවාතැන් නොමිලේ. Tel. 0713685744. L377807-1

### විවිධ

**0** පවිත්‍රතා සේවක/ සේවිකාවන් බඳවාගනු ලැබේ. සේවා කාලයේ දී කෑම බීම නොමිලේ. කොළඹ අවට ඇබෑර්තු රාශියක්! 0703566887, 0717532075, 0703566222 L381918-1

**අපගේ** ස්පා ආයතනයට පුහුණු/ නුපුහුණු තෙරපිවරියන් අවශ්‍යයි. ඉහළ ආදායමක්. සෙත්සඳ ස්පා 40/A, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත. 0771196704 L382459-1

**පිරිසිදු** කිරීමේ සේවාව සඳහා සේවිකාවන් ගම්පහ, කිරිබත්ගොඩ, යක්කල අවටින් අවශ්‍යයි. දුරකථන- 0718367100, 0333160777. L1022621586-1


## සංවර්ධන වාසනාව

සෙනසුරාදා | දිනය : 2022-11-19 | දිනුම් වාරය : 546 | වර්ණය : රතු

| ඉංග්‍රීසි අක්ෂරය | ජයග්‍රාහී අංක | දෛව අංකය |
|---|---|---|
| B | 05 08 21 | 01 |

මීළඟ සුපිරි ජයමල්ල රු. 14,364,380/-

* මේ වන විට සුපිරි ජයමල්ල දිනාගෙන ඇත්නම් වලංගු වන්නේ එදිනට පවතින ජයමල්ල වේ.

දිනා ඇති මුළු මුදල රු. 1,973,120/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය | සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 2. තක්ෂණික ඇමතුම් : 011 4 824 824 | ප්‍රතිඵල සක්‍රීය ඇමතුම : 011 2 333 778 | ස්වයංක්‍රීය තොරතුරු අංකය : 011 4 825 825 | www.dlb.lk

ජයග්‍රාහී ටිකට්පත් මාස 6 ක් වලංගුවේ.

## සසිරි - රට දිනවන වාසනාව

සිකුරාදා | දිනය 2022.11.18 | දිනුම් වාරය 250 | ලා දුඹුරු

ජයග්‍රාහී අංක: 33 34 38

දිනා ඇති මුළු මුදල රු. 2,346,300/-

අද බිහිවූ ලක්ෂපතියන් ගණන 12

ඳම්, ලා දුඹුරු හා කොළ ලොතරැයිපත් පිළිවෙළින් වලංගු වන්නේ අඟහරුවාදා, සිකුරාදා හා ඉරිදා යන දින සඳහා වේ. ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ. | www.dlb.lk

## SUPER BALL - සුපර් බෝල්

දිනුම් වාරය 1918 | වර්ණය රෝස | දිනය 2022.11.18 | දවස සිකුරාදා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක: K 09 17 41 77

මීළඟ සුපිරි ජයමල්ල රු. 82,756,550.40

සුපර් Chance: රු.500/- තෑගි සඳහා 4759 | රු.100/- තෑගි සඳහා 324

දිනා ඇති මුළු මුදල රු. 3,302,460/-

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ. | www.dlb.lk

## SUPER BALL - සුපර් බෝල්

දිනුම් වාරය 1919 | වර්ණය නිල් | දිනය 2022.11.19 | දවස සෙනසුරාදා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක: K 11 23 32 46

මීළඟ සුපිරි ජයමල්ල රු. 82,832,514.40

සුපර් Chance: රු.500/- තෑගි සඳහා 4683 | රු.100/- තෑගි සඳහා 642

දිනා ඇති මුළු මුදල රු. 3,001,420/-

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ. | www.dlb.lk

## ලග්න වාසනාව

සිකුරාදා | දිනය : 2022.11.18 | දිනුම් වාරය : 3630 | වර්ණය : නිල්

දිනා ඇති මුළු මුදල රු. 9,288,240/-

දිනුම් අංක: 02 34 46 47 | කුම්භ

මීළඟ සුපිරි ජයමල්ල රු. 2,539,914.80

## ලග්න වාසනාව

සෙනසුරාදා | දිනය : 2022.11.19 | දිනුම් වාරය : 3631 | වර්ණය : ලා නිල්

දිනා ඇති මුළු මුදල රු. 8,863,140/-

දිනුම් අංක: 23 25 42 59 | වෘශ්චික

මීළඟ සුපිරි ජයමල්ල රු. 2,711,888.80

## 27 කප්රුක

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක: G 19 09 25 31 67 | දිනුම් වාරය 1094 | වර්ණය දම් | දිනය 2022.11.18 | සිකුරාදා

දිනා ඇති මුළු මුදල රු. 3,731,640/-

මීළඟ සුපිරි ජයමල්ල රු. 278,408,669.80

## 27 කප්රුක

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක: D 16 25 39 53 57 | දිනුම් වාරය 1095 | වර්ණය රතු | දිනය 2022.11.19 | සෙනසුරාදා

දිනා ඇති මුළු මුදල රු. 3,361,760/-

මීළඟ සුපිරි ජයමල්ල රු. 278,684,501.80

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ. | www.dlb.lk

## අද කෝටිපති - ADA KOTIPATHI

සිකුරාදා | දිනය : 2022.11.18 | දිනුම් වාරය : 1744 | වර්ණය : දම්

මීළඟ සුපිරි ජයමල්ල රු. 65,457,730/- | දිනා ඇති මුළු මුදල රු. 3,875,520/-

ජයග්‍රාහී අංක: 66 67 68 75 | ඉංග්‍රීසි අක්ෂරය: T

## අද කෝටිපති - ADA KOTIPATHI

සෙනසුරාදා | දිනය : 2022.11.19 | දිනුම් වාරය : 1745 | වර්ණය : කහ

මීළඟ සුපිරි ජයමල්ල රු. 65,554,491.20 | දිනා ඇති මුළු මුදල රු. 3,828,460/-

ජයග්‍රාහී අංක: 08 10 24 41 | ඉංග්‍රීසි අක්ෂරය: G

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

## ශනිදා - Shanida

සිකුරාදා | දිනය : 2022.11.18 | දිනුම් වාරය : 4079 | වර්ණය : තැඹිලි

ජයග්‍රාහී අංක: 09 34 41 53 | ඉංග්‍රීසි අක්ෂරය: P

දිනා ඇති මුළු මුදල රු. 3,989,840/- | මීළඟ සුපිරි ජයමල්ල රු. 30,140,949/-

## ශනිදා - Shanida

සෙනසුරාදා | දිනය : 2022.11.19 | දිනුම් වාරය : 4080 | වර්ණය : කොළ

ජයග්‍රාහී අංක: 13 27 55 65 | ඉංග්‍රීසි අක්ෂරය: S

දිනා ඇති මුළු මුදල රු. 3,643,840/- | මීළඟ සුපිරි ජයමල්ල රු. 30,276,279.90

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

| ලොතරැයිය | වාරය / විස්තර | ජයගත් අංක |
|---|---|---|
| සසිරි | 251 වැනි වාරය, නොවැ: 20 වැනිදා | 01-06-48 |
| ජයෝදා | 1871 වැනි වාරය, නො: 16 වැනිදා, ඉංග්‍රීසි අකුර - Y | 08-13-17-70 |
| අද කෝටිපති | 1746 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ඉංග්‍රීසි අකුර - H | 26-54-55-66 |
| කප්රුක | 1096 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ඉංග්‍රීසි අකුර - H, සුපිරි අංකය - 09 | 06-31-46-66 |
| සංවර්ධන වාසනාව | 546 වැනි වාරය, නොවැ: 19 වැනිදා, දෛව අංකය - 01, ඉංග්‍රීසි අකුර - B | 05-08-21 |
| හඳහන | 254 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ලග්නය: ධනු | 34-36-38-41 |
| ශනිදා වාසනාව | 4081 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ඉංග්‍රීසි අකුර - V | 09-26-37-65 |
| ජාතික සම්පත | 1400 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ජයග්‍රාහී ලග්නය - වෘෂභ | 3-1-9-7-6-8 |
| ධන නිධානය | 975 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ජයග්‍රාහී අක්ෂරය - F | 42-44-64-71 |
| මහජන සම්පත | 4945 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ඉංග්‍රීසි අකුර - S | 0-3-3-9-2-4 |
| ලග්න වාසනාව | 3632 වැනි වාරය, නොවැ:20 වැනිදා, ලග්නය - වෘශ්චික | 09-25-49-62 |
| සුපර් බෝල් | 1920 වැනි වාරය, නොවැ:20 වැනිදා, ඉංග්‍රීසි අකුර - D | 15-28-73-76 |
| මෙගා පවර් | 1293 වැනි වාරය, නොවැ: 20 වැනිදා, සුපිරි අංකය: 01, ඉංග්‍රීසි අකුර - L | 07-12-13-56 |
| ගොවිසෙත | 3187 වැනි වාරය, නොවැ: 20 වැනිදා, ඉංග්‍රීසි අකුර - T | 03-07-16-80 |

# පාසලේ ගෝරි දැමූ ගුරුන්ට දරුවන්ගෙන් යස පාඩමක්

දෙයියෝ සාක්කි

■ කරන්දෙණිය එම්. සුසිල් පියන්ත

**තමන් ගෝරි දමා ගත් විටදී මෙන් පාසලේ දී ගෝරි කරගත් ගුරුවරුන් දෙදෙනකුගේ මවුපියන් පාසලට කැඳවීමට දිවගිය සිසු පිරිසක් පිළිබඳ අපූරු පුවතක් අම්බලන්ගොඩ ප්‍රධාන පාසලකින් අසන්නට ලැබේ.**

ගුරු විවේකාගාරයේ දී විවේක වේලාව තුළ මෙම සිදුවීම වී තිබුණි.

විදුහලේ සිසු නායක, නායිකා මණ්ඩලය තෝරාපත් කර ගැනීම මුල්කර ගනිමින් මේ විදුහලේ ගුරුවරුන් දෙදෙනෙකු අතර කතා බහක් ඇති වූයේ සුළුවෙනි. ටික ටික එහි උණුසුම වැඩි වූයේ සිය මතය නිවැරදි යන්න දෙදෙනාම තර්ක, විතර්ක කිරීමත් සමගමය.

උණුසුමේ කෙළවර ගිනි ගැනීමෙන් මේ ගුරුවරුන් දෙදෙනාගේ තර්ක, විතර්කය ගහ මරා ගන්නා තැනටම උණුසුම් විය. දෙගුරුන්ට තැන නොතැන අමතක වූහ. මේ දෙන්නාගේ ගහ මරා ගැනීම පාසල් සිසු, සිසුවියෝ ද දුටහ.


ඔවුනට දෙවියන් බුදුන් සිහිවූයේ අර්ථයෙන් ධර්මයෙන් තමන්ට නිරන්තරයෙන් උපදෙස් දෙමින් තමන් දෙවියන් බුදුන් මෙන් සලකන ගුරුවරුන් දෙදෙනකුගේ මේ නොහොබිනා හැසිරීම දුටුවිටය. එය දුටු සිසු පිරිසක් ගාල කඩා ගත් හරක් මෙන් දිව යන දුටු තවත් ගුරුවරයෙක් "මොකෝ මේ කොහේද දුවන්නේ" යැයි ඇසුවේ මේ සිද්ධිය පාසලේ මුල් පුටුවට වාර්තා කරන්න යන්නේ දැයි දැන ගැනීමටය.

"නැහැ සර් අපි ස්කෝලේදී ඔහොම ගහමරා ගත්තාම අපේ ගෙවල්වල අම්මා තාත්තා ගෙන්වනවානේ. අපි මේ යන්නේ අපේ ඇස් ඉදිරිපිට ගහා මරා ගත්ත මේ ගුරුවරුන් දෙදෙනාගේ අම්මා, තාත්තාට දන්වා ඒ අය පාසලට ගෙන්වාවත් මේ ප්‍රශ්නය විසඳන්න" යැයි සිසුන් කීවිට ගුරුවරයාට පොළව පලාගෙන යන්න සිතුනාලු.

මේ සම්බන්ධයෙන් එම විදුහලේ අනෙක් ගුරුවරුන් පැවසුවේ සිසු නායකයන් දිවුරුම්දීම අවස්ථා හතරකදීම කල් ගිය බවත් සිසු නායක, නායිකාවන් පත් කිරීමේ ගැටලු රැසක්ම නිර්මාණයවී තිබීම නිසා එය එසේ සිදුවූ බවත් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ගුරු, සිසු අතර ද ගහමරා ගැනීම් නොවැළැක්විය හැකි බවත්ය.

දකුණට බර අතකට බෙලි ගෙඩියක් වැටුණු පළාතක් ලු. දම්සක් කාර්යාලයේ ලොක්කාට තරුවක් සමඟ ඔටුන්නක් දාගන්න ලොකු දොල දුකක් ලු. ඊට වාසල නියෝජනය කරන පිය පුතු දෙපළක් කියන කියන ඕන දෙයක් කරනවා ලු. වැටලීම් කරන පොඩි උන්ට තහංචියක් ලු. ගමේ බඩු නම් අල්ලන්න එපා කියනවා ලු. කුඩු ඇල්ලුවාට ගැටලුවක් නෑ ලු. වාසල ඇත්තන්ගේ කැමැත්ත ඉටු කරනවා ඇරෙන්න වෙන රාජකාරියක් නෑ ලු. මේ ලොක්කා ඉන්නේ රෙදි ඇඳ ගෙන දැයි පොඩ්ඩන්ට ප්‍රශ්නයක් ලු.

පුෂ්පකුමාර මල්ලවආරච්චි

# පොහොසත් මිනිස්සු

මිනිසෙකුගේ පොහොසත්කම මනින්නට බොහෝ දෙනා හුරු වී තිබෙන්නේ ඔහු හෝ ඇය සතු මිල මුදල් ප්‍රමාණයෙන්. නමුත් අතීතයේ පටන් සංස්කෘතික වටිනාකම්වලින් සහ අගනා ගුණ දහමින් පෝෂණය වී සිටින ලාංකේය අපට, පොහොසත්කම යනු හුදෙක් මිල මුදලින් ධනවත් වීම නොවේ.

එය ශ්‍රී ලාංකිකත්වයෙන් පොහොසත් සම්පත් බැංකුවේ අපි කොයි මොහොතකවත් අමතක කළේ නෑ.

ගනුදෙනුවකට එහා ගිය බැඳීම් සමුදායක්

සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි

0112 30 30 50 www.sampath.lk සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.

Dialog PREPAID TV

පුංචි රීලෝඩ් එකකින් ගෙදර හැමෝටම කැමති විදිහට TV බලන්න

දින 7 ක් සඳහා

රු.160/- චැනල් 58 ක්

රු.235/- චැනල් 68 ක්



කොන්දේසි සහිතයි

Activate කිරීම රීලෝඩ් මගින්

ශ්‍රී ලංකාවේ #1 ටෙලිවිෂන් රසාස්වාදය

Dialog TELEVISION

කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237
ෆැක්ස් : 2438039, 2479240, 5383240
බෙදාහැරීම් : 2479625
ෆැක්ස් : 2479650
දැන්වීම් : 2479540, 5383383, 5330330,
ෆැක්ස් : 2314864, 2479595

wijeyanewspapers

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත

- වෙබ් අඩවිය -
www.lankadeepa.lk


# පොල් ඉඩම් කැඩීමට වැට බැඳීම වැදගත්

දැනට පවතින නීතිමය ප්‍රතිපාදන යටතේ හෙක්ටයාර් 04කට වඩා අඩු පොල් ඉඩම් පවා කැබලි කිරීමට ලබදී ඇති ඉඩකඩ වසා දමා පොල් ඉඩම් කැබලි කිරීම අක්කර 01කට හෝ ඊට අඩු පොල් ඉඩම් සඳහා පමණක් සීමා කිරීමට මෙවර අයවැයෙන් යෝජනා කර තිබේ. මේ රටේ පොල් නිෂ්පාදනයට ඉඩම් කැබලි කිරීම හරහා සිදුවන විනාශය වළක්වා ගැනීමට එය යහපත් ප්‍රවේශයකි. එවැනි යෝජනාවක් දැනට තිබෙන පොල් ඉඩම් සංවර්ධනයටද පොල් නැවත වගා කිරීම දිරිගැන්වීම සඳහා ද හේතු වනු ඇතැයි අපේක්ෂිතය.

පොල් ඉඩම් විශාල වශයෙන් කට්ටි කර විකිණීම පසුගිය කාලය පුරාවටම අසීමිතව සිදුවෙමින් පැවතිණි. එයින් ලැබිය හැකි අහිතකර ප්‍රතිඵල සම්බන්ධයෙන් කෘෂි විද්‍යාඥයන් ඇතුළු බොහෝ පිරිස් අනතුරු ඇඟවූ නමුත් එම ක්‍රියාවලිය නැවතුණේ නැත. ඒ මගින් බොහෝ සාරවත් පොල් ඉඩම් කොන්ක්‍රීට් වනාන්තර බවට පෙරළිණි. ඒ ඇතැම් ඉඩම් දේශපාලන ව්‍යාපෘති බවටද පත් විය. වරක් එක් හිටපු අමාත්‍යවරයෙක් මීගමුව ප්‍රදේශයේ ඉතා සරුසාර පොල් ඉඩමක් තම දේශපාලන ආධාරකරුවන් පිරිසකට රිසි සේ බෙදගැනීමට අවසර දුන්නේය. ඒ ගැන විශාල විරෝධයක් පැන නැගුණත් දේශපාලන බලපෑම් හමුවේ ඒ විරෝධතා යටපත් විය. එය දේශපාලනඥයන්ගේ පූර්ණ ආශිර්වාදයෙන් සරුසාර පොල් ඉඩම් ප්‍රබල දූෂණයකට ලක් වූ එක් අවස්ථාවක් පමණි. මෙවැනි කතා මෑත කාලීන දේශපාලන ඉතිහාසය තුළ යළි යළිත් ලියැවී තිබේ.

වාර්ෂික පොල් නිෂ්පාදනය අඩාල වීමට එවැනි ආකාරයේ පොල් ඉඩම් විනාශ කිරීම එක් ප්‍රබල හේතුවකි. පොල් සම්බන්ධයෙන් බොහොමයක් ජනතාවට දිවාමය ආහාරයක් බවට පත්ව තිබෙන මේ විදෙළු අධික කාලයේ පොල් එලදාව පහළ යාම බරපතළ ගැටලු ඇතිවීමට පාර කපන්නකි. රටේ බොහොමයක් දූ දරුවන් මන්දපෝෂණ තත්ත්වයකට මුහුණ දෙමින් සිටින බවට එක්සත් ජාතීන්ගේ සංවිධාන වාර්තාවලින් පවා උපුටා දක්වන විට පොල් එලදාව අඩුවීම ආහාර වේලට තීරණාත්මක ලෙස බලපාන සාධකයක් විය හැකි බව අමතක නොකළ යුතුය. මොනම තත්ත්වයක් යටතේ වුවද රටේ ජනතාවගේ ආහාර වේල සකස් කර ගැනීමේදී පොල් අත්‍යවශ්‍යම අංගයක් බැවිනි.

අපේ රට පමණක් නොව මුළු ලෝකයම මේ වනවිට ආහාර සුරක්ෂිතතාව අහිමි පසුවන්නේ අවදානම් අවධියකය. ලෝකයට වඩා අපේ රටේ තත්ත්වය ඊ අහිත වඩාත් උග්‍ර. සංකීර්ණය. මේ නිසා ලෙහෙසියෙන් පිළිතුරක් සෙවිය නොහැකි ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ගැටලුවේදී පොල් වගාවට හිමිවන්නේ ඉහළ ප්‍රමුඛත්වයකි. එසේ තිබියදීත් පොල් ඉඩම් හිතේ හැටියට කැබලි කර විකිණීමට ඉඩ සැලසෙන පරිදි නීතියක් රටේ තිබීමෙන් සිදුවන්නේ අවැඩකි. එම නීතිය සංශෝධනය කර කැබලි කළ හැකි පොල් ඉඩම අක්කරයකට සීමා කිරීමට ගෙන එන යෝජනාවට කිසිවකුටත් විරුද්ධ විය නොහැකි බව අපගේ විශ්වාසයයි.

පොල් ඉඩම් කැබලි කිරීමට තහංචි දැමීමෙන් පමණකින් නොනැවතී මේ රටේ සමස්තයක් වශයෙන් කෘෂි බෝග වගාව වර්ධනය සඳහා දීර්ඝකාලීන ස්ථාවර වැඩපිළිවෙළක අවශ්‍යතාව දැන් රටට තදින්ම දැනෙමින් තිබේ. රසායනික පොහොර තහනම වැනි රටේ කෘෂි කර්මාන්තය ඔලුවෙන් සිටුවන අදූරදර්ශී තීන්දු ගැනීම වැළැක්විය හැක්කේ එවැනි ස්ථාවර ප්‍රතිපත්ති සහිත වැඩපිළිවෙළකින් පමණි. එවැනි වැඩපිළිවෙළක් සැකසීම සඳහා ජාතික මට්ටමේ විශේෂඥ කමිටුවක් පිහිටුවීමද වැදගත් වනු ඇත. පොල් ඉඩම් කට්ටි කිරීම සීමා කිරීමට පනවන නීති ඒ ආකාරයටම ක්‍රියාත්මක වනවා දැයි එවැනි කමිටුවකින් අධීක්ෂණය කිරීමද පහසු වනු ඇත.

අප එසේ කියන්නේ මීට පෙරද පොල් ඉඩම් කට්ටි කිරීම අධෛර්වත් කිරීමට ගෙන ආ යෝජනා බොහොමයක් එළිය නොදැකම අභාවයට යාම හේතුවෙනි. එවැනි නීති ක්‍රියාත්මක වීම දේශපාලන බලපෑම් හමුවේ නිශ්ක්‍රීය වන්නේ නම් නීති පැනවීමෙන් පමණක් සරුසාර පොල් ඉඩම් බේරාගැනීමට හැකියාවක් නැත. අපේ රටේ බොහොමයක් තීන්දු තීරණ දේශපාලන බලපෑම් හේතුවෙන් වෙනස් වන බව ප්‍රසිද්ධ රහසකි. මෙවර අයවැයේ යෝජනාව ක්‍රියාත්මක වී නීතියක් හැදුවත් නිසි අන්දමින් පසුවිපරමක් සිදු නොවුණහොත් ආණ්ඩුවේ ආධාරකරුවන්ගේ පොල් ඉඩම්වලට එක් නීතියකුත් ආණ්ඩුවේ නොවන පුද්ගලයන්ගේ ඉඩම්වලට තවත් නීතියකුත් ක්‍රියාත්මක වීමට හොඳටම ඉඩ තිබේ. එවැනි බහුබූත වැඩ අපේ රටේ හිඟ නැත.

රටේ පොල් ඉඩම් හිතුමතේ කැබලි කිරීමෙන් සිදුවන විනාශය නැවැත්වීම කෙරෙහි රජයේ අවධානය යොමුවීම ඉතා වැදගත් යෝජනාවක් බව සඳහන් කළ යුතුය. සතුන් විසින් එලදාවට සිදු කරන විනාශය හේතුවෙන් වාර්ෂික පොල් නිෂ්පාදනය සැහෙන ප්‍රතිශතයකින් අඩුවන තත්ත්වයක් තුළ තිබෙන පොල් ගස් ප්‍රමාණය ආරක්ෂා කර ගනිමින් වර්ධනය කිරීමට පියවර ගැනීම රජයේ වගකීමය. අලුත් යෝජනාව රජයේ එම වගකීම ඉටු කිරීමට තැබූ ඉදිරි පියවරක් වශයෙන් අපි සලකමු.




# නව ගමනකට අය වැයෙන් පාර කැපුවාද?



කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය **සිරිමල් අබේරත්න**

**2025 වසර වන විට ජාතික ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක මට්ටමකට ගෙන එන බවත් එම වසර වන විට සියයට දෙකකට වැඩි ප්‍රාථමික අතිරික්තයක් පවත්වා ගෙන යන බවත් අයවැයෙහි සඳහන්ය. එම ඉලක්ක සපුරා ගැනීමට නම්, අප සැපිරිය යුතු කොන්දේසි කිහිපයක් තිබේ. පළමුවැන්න වන්නේ, ඉහළ ආර්ථික වර්ධන වේගයක් අත් කර ගැනීමය. දෙවැන්න, බදු එකතු කර ගැනීම පිණිස විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීමය.**

ශ්‍රී ලංකා ඉතිහාසයේ වැඩි වශයෙන් ඉදිරිපත් කර ඇත්තේ සහන අයවැය ලේඛනය. තමන්ට ලැබෙන සහන කවරේද යන කාරණය මත ජනතාව අයවැය පිළිබඳ උනන්දු විය. ප්‍රමාණවත් ආදායමක් නොතිබුණද බලයේ සිටි ආණ්ඩු අයවැය මගින් සහන ලබා දෙන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. එහෙත් ඊට සාපේක්ෂව රාජ්‍ය ආදායම් ඉහළ නොගියේය. එබැවින් ණය ලබා ගෙන රට දුවවන ආර්ථික පිළිවෙතක් අනුගමනය කළ අතර එහි අවසන් ප්‍රතිඵලය දැන් අපි භුක්ති විඳිමින් සිටිමු. එනම්, විදේශ විනිමය හිඟ වීම නිසා උද්ගත වූ ආර්ථික අර්බුදයයි. 2023 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සුවිශේෂ වන්නේ එමගින් පවතින ආර්ථික අර්බුදයට සම්පූර්ණ වශයෙන් නොවුණද ආමන්ත්‍රණය කර තිබීම නිසාය. එසේම බදු පදනම පුළුල් කරමින් සහ බදු වැඩි කරමින් රාජ්‍ය ආදායම් පාර්ශවය යම් පමණකට කළමනාකරණය කර ගැනීමට ද උත්සාහ දරා ඇති බවක් පෙනේ.

අයවැය පරතරය පාලනය කර ගත යුතුය යන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද අවධාරණය කර ඇති නිර්දේශයකි. ඒ අරබයා කළ යුත්තේ කුමක්ද යන්න ගැන එම ආයතනය පැහැදිලි කර නැති අතර එම ඉලක්කය සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න රජය තීරණය කළ යුතුය. **රාජ්‍ය වියදම් පාර්ශවය පාලනයට අදාළ ශක්තිමත් යෝජනා මෙවර අයවැයෙහි අන්තර්ගත නොවන බව මගේ නිරීක්ෂණයයි. එවැනි යෝජනා ඇතුළත්ව තිබුණේ නම්, අයවැය පාලනය සම්බන්ධ ආණ්ඩුවේ ප්‍රවේශය මීට වඩා ඉදිරිගාමී එකක් වීමට ඉඩ තිබිණි.**

**අයවැය කතාව කරමින් ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ, ශ්‍රී ලංකාව රාජ්‍ය ආයතන සහ රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසාය 420 කට වැඩි ගණනක් නඩත්තු කරන බවත් ඒවායෙන් රාජ්‍ය ව්‍යවසාය 52 ක් එක් වසරක් ඇතුළත වාර්තා කර ඇති අලාභය රුපියල් බිලියන 86 ක් බවත්ය.**


එවැනි ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැදගත්කම ද ඔහු එහිදී පෙන්වා දුන්නේය. රාජ්‍ය වියදම් පාර්ශවය පැත්තෙන් ගත් විට මා දකින ප්‍රධාන දුර්වලතාව තිබෙන්නේ ද මෙහිය. **මෙරට රාජ්‍ය ආයතන සහ ව්‍යවසාය 420 කට වැඩි ගණනක් තිබුණද ඉන්දියාවේ තිබෙන්නේ 192 ක් පමණි.** ඒ අනුව, මෙම ආයතන ගණන රටේ ආර්ථිකයට විශාල බරකි. ඒවායෙන් බොහොමයක් 1960 සහ 70 දශකවල ආරම්භ කළ අතර තවමත් ක්‍රියාත්මක වේ. එවැනි පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය ආර්ථිකය ඇතුළත පවතින්නේ ඇයි ද යන්නවත් සාධාරණීකරණය කළ නොහැකි තරමට ඒවා පිරිහී තිබේ. ඒවා පවත්වා ගෙන යෑම පිණිස රාජ්‍ය ආදායම් වැඩි වශයෙන් යෙදවුවද රජයට ප්‍රතිලාභ නොලැබේ.

## පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය ආර්ථිකයට පටවන බර

පාඩු ලබන සහ ආර්ථිකයට ඍජු දයකත්වයක් නැති බොහොමයක් රාජ්‍ය ව්‍යවසාය වසා දැමීමට පිළිවන. වසා දැමීමේදී ඒවායෙහි සිටින සේවකයන්ගේ රැකියා පිළිබඳ ප්‍රශ්න මතු වන්නේ නම්, විකිණිය හැකිය. එහිදී උද්ගත විය හැකි ප්‍රශ්නය වන්නේ, මෙවැනි අකාර්යක්ෂම ආයතන මිලදී ගැනීමට ආයෝජකයන් ඉදිරිපත් වේද යන්නය. පාඩු ලබන බොහෝ රාජ්‍ය ආයතන ඇතැම් දේශපාලනඥයන් විසින් භාවිත කරනු ලැබුවේ ඔවුන්ගේ ඥාතීන්ට සහ ආධාරකරුවන්ට රැකියා ලබා දීම සඳහාය. එබැවින් එවැනි රාජ්‍ය ආයතනවල ප්‍රමාණය ඉක්මවා ගිය සේවක පිරිසක් සිටිති. තවද බොහෝ රාජ්‍ය ආයතන ස්ථාපිත කර තිබෙන්නේ පාර්ලිමේන්තුව සම්මත කළ අණ පනත් මගිනි. පනත් වෙනස් කරමින් මෙම ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමට යම් කාලයක් ගත වේ. එසේම එය තරමක් සංකීර්ණ කර්තව්‍යයකි. මේ ආකාරයේ රාජ්‍ය ආයතන සහ ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් ආයතන ව්‍යුහයක් සකස් කර තිබිණි. "පර්ක්" යනු එවැනි එක් ආයතනයකි. එහෙත් පසුගිය දශක එකහමාරක කාලය ඇතුළත එම ආයතන ද වසා දැමිණි. එවැනි පසුබිමක ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා ආයතන සහ හැකියාව සහිත මානව සම්පත්හි හිඟයක් ද උද්ගතව ඇත.

අද වනවිට ලංකාවේ උද්ගතව තිබෙන ආර්ථික අර්බුදයට දේශපාලනඥයන්ට පමණක් චෝදනා කළ නොහැකි අතර අඩුවැඩි වශයෙන් පුරවැසියන් ද ඊට දයක වී තිබේ. **තවදුරටත් පැරණි ක්‍රමයට ආර්ථිකය ඉදිරියට ගෙන යා නොහැකි බව පැහැදිලිය. එවැනි පසුබිමක අයවැය මගින් වැටුප් හා දීමනා වැඩි කළ නොහැකිය. පවතින උද්ධමන තත්ත්වය හමුවේ රාජ්‍ය සේවකයන්ට වඩා පෞද්ගලික අංශයේ සේවකයෝ පීඩාවට පත්ව සිටිති.** එම අංශයේ ඇතැම් සේවකයන්ගේ වැටුප් කප්පාදු කර තිබෙන අතර තවත් සමහරුන්ට රැකියා අහිමි වී තිබේ. මෙවැනි සන්දර්භයක රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමක් ගැන සිතිය නොහැකිය. රාජ්‍ය අංශයේ සිටින්නේ මෙරට ජනගහනයෙන් ලක්ෂ 15ක පිරිසක් පමණි. එහෙත් පෞද්ගලික අංශයද ඇතුළත්ව වැඩ කරන ජනතාව ලක්ෂ 85ක පමණ පිරිසක් සිටිති.

සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් ගොඩ නගන බවත් ඒ ඔස්සේ සියයට 7ත් 8ත් අතර ආර්ථික වර්ධනයක් අත් කර ගැනීමට අපේක්ෂා කරන බවත් අයවැය කතාවේදී ජනාධිපතිවරයා ප්‍රකාශ කළේය. එහිදී සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් යන්නෙන් අදහස් වන්නේ ජර්මනියේ ක්‍රියාත්මක වන ආර්ථික මොඩලයයි. එම ජර්මන් ආර්ථික මාදිලිය ඇතුළත එරට ආණ්ඩුවේ ආදායම ඉහළ අගයක පවතින අතර සමාජ ආරක්ෂණ දැල වඩාත් සක්‍රීය මට්ටමක පවතියි. ඒ යටතේ, සමාජ සුබසාධනය ද මනා ලෙස ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ ද සුබසාධන සංකල්පය අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ යටතේ විවිධ සහනාධාර වැඩසටහන් පුළුල් වශයෙන් දියත් විය. කෙසේවෙතත් 1978 වන විට රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන් අවධියේ පැවති පරිසරය හා අවශ්‍යතා අද වෙනස් වී තිබේ. එම වෙනස්කම්වලට අප හැඩගැසිය යුතුය යන්න මෙම සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් යන්නෙන් අදහස් කර ඇත. ඊට අදළ ප්‍රධාන සංරචක තුනක් ගැන අයවැයෙන් අදහස් දක්වා තිබිණි. **පළමුවැන්න, අපනයන ආර්ථිකයයි. එය 1977 සිටම පැවති ආර්ථික ක්‍රමයයි. දෙවැනුව හරිත ආර්ථිකය නමැති සංකල්පයත් තෙවැනුව ඩිජිටල් ආර්ථිකයත් ඊට එක් කර තිබේ. අපේ ආර්ථිකය තරගකාරී මට්ටමකට ගෙන ඒමටත් ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීමටත් මෙම අංග ක්‍රියාත්මක කළ යුතුය.**



සියයට 7 ත් 8 ත් අතර ආර්ථික වර්ධනයක් එක්වර අත් කර ගත නොහැකිය. මේ වසරේදී අපේ ආර්ථිකය ඍණ සියයට 10 (-10%) ක ප්‍රමාණයකින් හැකිළෙනු ඇති බවට පුරෝකථනය කර තිබේ. 2023 වසරේදී ආර්ථික වර්ධන වේගය ධන අගයකට ගෙන ආ හැකිද යන්න ගැන පැහැදිලි අවබෝධයක් නොමැත. එහෙත් වසර කිහිපයකදී හෝ ධන ආර්ථික වර්ධනයක් කරා ළඟා වීමට හැකි වුවහොත් ප්‍රස්තුත ආර්ථික වර්ධන වේගය සාක්ෂාත් කර ගත හැකි වනු ඇත. අප ආර්ථික ප්‍රතිසංස්කරණ කෙතරම් වේගයකින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න මත එය තීරණය වනු ඇත. අපට එම ඉලක්කය කරා ළඟා වීමට හැකියාව පවතින බව මගේ අදහසයි. එවැනි ප්‍රගතියක් අත් කර ගත් රටවල් ඕනෑ තරම් ආසියානු කලාපයේ ඇත. එලෙස ලබා ගන්නා ආර්ථික වර්ධන වේගය වසර 20 ක් 25 ක් වැනි දිගු කලක් තිස්සේ පවත්වා ගැනීම ද වැදගත්ය. ජනාධිපතිවරයා පැවසූ පරිදි 2048 වන විට ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයක තත්ත්වයට දියුණු කිරීමට හැකි වන්නේ එවිටය.

2025 වසර වන විට ජාතික ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක මට්ටමකට ගෙන එන බවත් එම වසර වන විට සියයට දෙකකට වැඩි ප්‍රාථමික අතිරික්තයක් පවත්වා ගෙන යන බවත් අයවැයෙහි සඳහන්ය. එම ඉලක්ක සපුරා ගැනීමට නම්, අප සැපිරිය යුතු කොන්දේසි කිහිපයක් තිබේ. පළමුවැන්න වන්නේ, ඉහළ ආර්ථික වර්ධන වේගයක් අත් කර ගැනීමය. දෙවැන්න, බදු එකතු කර ගැනීම පිණිස විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීමය. පුරවැසියන්ගේ ආදායම් සහ වත්කම් පිළිබඳ තොරතුරු රජය සතුව නොමැත. වාර්තා වන තොරතුරුවලට අනුව මෙරට ඇති ආදායම් ලිපි ගොනු ප්‍රමාණය ලක්ෂ තුනකට ආසන්නය. එම අගය මීට වඩා වැඩි විය යුතුය. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේද යොද ගනිමින් වඩාත් හොඳ බදු කළමනාකරණ ක්‍රමවේදයකට යෑමට සිදු වේ. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට අවැසි හැකියාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව පවතින්නේ ද යන්න ප්‍රශ්නාර්ථයකි.

## අපනයන නැංවීමට අවශ්‍ය කරන වෙනස්කම්

2023-2032 කාලයේ නව අපනයන ඔස්සේ වාර්ෂිකව ඩොලර් බිලියන 3 ක මුදලක් අපේක්ෂා කරන බවද අයවැය කතාවේදී ජනාධිපතිවරයා සඳහන් කළේය. ඒ අරබයා අප නව අපනයන ක්ෂේත්‍ර කරා යොමු විය යුතුද යන්න තීරණය කරන්නෝ ව්‍යාපාරිකයෝය. දැනට ලංකාවේ සිටින ව්‍යාපාරිකයන්ද ඇතුළුව අලුතින් ලංකාවට පැමිණෙන ආයෝජකයන් ඊට අයත්ය. එය නව අපනයන, භාණ්ඩ හා සේවා යන දෙඅංශයෙන්ම සමන්විත විය හැකිය. අපනයන ප්‍රවර්ධන පරිසරයක් ඇති කළ විට ව්‍යාපාරිකයන්ට ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත හැකිය.

අපනයන දුර්වල කරන ප්‍රතිපත්ති සහ රෙගුලාසි ඉවත් කර ස්ථාවර ආර්ථිකයක් පිළිබඳ සහතිකය ලෝකයට ලබා දුන් පසු මෙරටට විදේශ ආයෝජන පැමිණෙනු ඇත. ලෝකයේ සෙසු රටවල අපනයන ආදායම් සමග සැසඳීමේදී අවුරුදු පතා ඩොලර් බිලියන 3 ක අපනයන ආදායමක් යනු සුළු අගයකි. අයවැය කතාව ආරම්භයේදී ජනාධිපතිවරයා ගෙනහැර පෑ වියට්නාම් උදහරණයෙන්ම එය පැහැදිලි කළ හැකිය.

එහිදී ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ ඔහු කර්මාන්ත අමාත්‍යවරයාව සිටියදී 1991 වසරේ දී වියට්නාමයේ කර්මාන්ත ඇමතිවරයා ලංකාවට පැමිණි බවත් මෙරට විවෘත ආර්ථික ව්‍යුහය සහ කාර්මීකරණ මූලෝපාය හදරන්නට ඔහුට අවශ්‍ය වූ බවත්ය.


එහෙත් එම අවධියේදී ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 2.1 ක් වන විට වියට්නාමයේ එය ඩොලර් බිලියන 1.3 ක් වශයෙන් දැක්වුණ බවත් **2021 වසර වන විට වියට්නාමයේ විදේශ සංචිත ඩොලර් බිලියන 109.4 ක් වන විට ශ්‍රී ලංකාවේ එම අගය ඩොලර් බිලියන 3.1 ක් පමණක් බවත්ය. වියට්නාමය අපනයන වෙළෙඳපොළ ආර්ථිකයට අවතීර්ණ වූයේ 1986 දීය. වියට්නාමය ඔවුන්ගේ විදේශ සංචිත වර්ධනය කර ගනු ලැබුවේ අපනයනවලිනි. පසුගිය වසරේදී (2021) ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 12.5 ක අපනයන ආදායමක් උපයන විට වියට්නාමය ඩොලර් බිලියන 335 ක අපනයන ආදායමක් ඉපැයීය.**

සමාජ සුබසාධනය සම්බන්ධයෙන් ද මෙවර අයවැයෙන් අවධානය යොමු කර තිබේ. එය කර තිබෙන්නේ ආණ්ඩුවේ අයවැය ධාරිතාව අනුව නිසා එම අංශ සඳහා වෙන් කළ මුදල් අඩු අගයක් විය හැකිය. වැඩි මුදල් ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වෙන් කළ යුතුව තිබිණි යැයි මම ද විශ්වාස කරමි. එහෙත් ප්‍රශ්නය නම්, ඒ සඳහා ආණ්ඩුවට ප්‍රමාණවත් ආදායමක් තිබෙන්නේ ද යන්නය. ආදායම නොතකා සමාජ සුබසාධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට ගියේ නම් සිදු වන්නේ පැරණි පඹ ගාලේම යළි පැටලීමකි. මා ඉහතදී සඳහන් කළ පරිදි ජනතාවගේ ආදායම් සහ වත්කම් පිළිබඳව රජය සතුව නිවැරදි තොරතුරු නොමැති සේම දුප්පත්කම, විරැකියාව, ආදායම් අහිමි වීම, පරිභෝජන මට්ටම් කඩාවැටීම යනාදී කාරණා ගැන ඒ අවස්ථාවේ දත්ත තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් නැත. එයද දත්ත පදනමේම තිබෙන ප්‍රශ්නයකි. එබැවින් මේ තත්ත්වයද නිවැරදි කර ගැනීම අවශ්‍යය.

සාකච්ඡා සටහන - **උපුල් වික්‍රමසිංහ**

### පෝය ලබන ගෙවෙන වේලාවන්

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| නොවැ:23 | අමාවක | පෙ.ව.06.53 | 24 දා පෙ.ව.04.26 |
| නොවැ:30 | පුර අටවක | පෙ.ව.08.58 | 01 දා පෙ.ව.07.21 |
| දෙසැ:07 | පසළොස්වක | පෙ.ව.08.01 | 08 දා පෙ.ව.09.37 |
| දෙසැ:16 | අව අටවක | පෙ.ව.01.39 | 17 දා පෙ.ව.03.02 |



**ආහාර හිඟයට මුහුණ දෙමු: හැම බිම් අඟලේම වගාකරමු**



01 වැනි පිටුවෙන්...

# සිංහල දෙමළ මුස්ලිම් ඒකතුකර උතුරේ ප්‍රශ්නයට විසඳුම් දෙනවා

## ජනපති රනිල් වික්‍රමසිංහ වවුනියාවේදී කියයි

■ අංජුල මහික වීරරත්න, මඩුකන්ද - සිතුම් චතුරංග සහ වන්නි- රොමේෂ් මධුශංක

**සිංහල, දෙමළ, මුස්ලිම් සියලුම ජනතාව ඒකරාශී කර ගනිමින් උතුරේ ප්‍රශ්නයට විසඳුම් ලබාදීමට තමන් සූදානම් අතර 75 වන නිදහස් දින උළෙලේදීවත් මෙරට සියලු ජනතාවට එක මවකගේ දරුවන් ලෙස ජීවත්වීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වවුනියාවේදී පැවසීය.**

ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක කෙරෙන උතුරු පළාත් සංවර්ධන විශේෂ ඒකකයේ උපකාර්යාලය වවුනියාවේදී විවෘත කරමිනි.

බොහෝ කලක් උතුරේ මෙන්ම දකුණේ ජනතාව විවිධ හේතු නිසා දුක් වින්ද බව කී ජනාධිපතිවරයා ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට කඩිනමින් කටයුතු කරන බව පැවැසීය.

වවුනියා දිස්ත්‍රික්කයේ රජයේ සේවක නිවාස යෝජනා ක්‍රමයේ නිවාසලාභීන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම සහ උතුරේ යුද්ධය නිසා දේපළ අලාභ හානි සඳහා වන්දි හිමිකම් ලැබූවන්ට මුදල් පිරිනැමීමද ජනාධිපතිවරයා අතින් සිදුවිය.

වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා පොහොර බෙදදීම සංකේතවත් කරමින් ගොවීන් කිහිප දෙනකුට පොහොර බෙදදීමද මෙහිදී කෙරිණි.

වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මෙසේද කීය.


ත්‍රස්තවාදයෙන් ඇති වූ ප්‍රශ්න සහ උතුරේ ජනතාවට තිබෙන ප්‍රශ්නවලට විසඳුම් දියයුතුයි. මුස්ලිම් ජනතාවට ශ්‍රී ලංකා සමාජයේ තමන්ට තිබෙන අයිතිය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. කඳුකරේ ජනතාවටත් විවිධ ප්‍රශ්න තිබෙනවා. මෙම ප්‍රශ්න සියල්ල විසඳිය යුතුයැයි සමාජ මතයක් තියෙනවා.

මේ සියලු ගැටලුවලට විසඳුම් ලබාදෙන්න මේ හොඳම කාලයයි. මෙම ප්‍රශ්නවලට ක්‍රමානුකූලව විසඳුම් ලබාදිය යුතුයි. මේ ගැන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සමඟ සාකච්ඡා කරන්න මම බලාපොරොත්තුවනවා. රට බෙදන්නේ නැතුව ප්‍රශ්නවලට විසඳුම් දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

පළමුව ජනතාවට තිබෙන සැකය දුරු කළ යුතුයි. අපි සියලුදෙනා එක්ව වැඩ කිරීමේදී එම සැකය දුරු වී යාවී. යුද්ධය නිසා දුක් වින්ද ජනතාවට සැනසුමක් ලැබේවි. 83 ඉඳන් අපි ලොකු දුරක් ඇවිල්ල තිබෙනව. ඒ වගේම 2009 සිට ලොකු දුරක් ඇවිල්ලා තිබෙනවා. මට ජාතික ගීයේ වචන පෙළක් මතක් වුණා. ඒ "එක මවකගේ දරුවන් ලෙස ජීවත්වීම" යන්නයි. 75 වන නිදහස් උළෙලේදීවත් එක මවකගේ දරුවන් ලෙස ජීවත් වෙන්න හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද ,පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛක්කලනාදන්, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහත්වරු ද මෙහිදී කතා කළහ.

නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ, ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය කාදර් මස්තාන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන කුලසිංහ තිලීබන්, උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් ත්‍යාගරාජ්, ජනාධිපති ලේකම් සමන් ඒකනායක, වව්නියාව දිස්ත්‍රික් ලේකම් පී.ඒ. සරත්චන්ද්‍ර යන මහත්ම මහත්මීහු ඇතුළු රාජ්‍ය නිලධාරීහුද මෙම අවස්ථාවට එක්ව සිටියහ.



ජනපති වවුනියා දිස්ත්‍රික්කයේ රජයේ සේවක නිවාස යෝජනා ක්‍රමයේ නිවාසලාභීන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය කළ අයුරු. ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද හා පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ සුමන්තිරන් මහත්වරු ද මෙහි සිටිති.

# බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ගබඩාවෙන් කඩදාසි බන්ඩල් 300ක් පන්නලා

## සේවකයෝ දෙදෙනෙක් අත්අඩංගුවට

■ ඉන්දිකා රාමනායක

**බත්තරමුල්ලේ පිහිටි බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ කාර්යාල ගබඩාවේ තිබූ ඡායා පිටපත් කඩදාසි බණ්ඩල් 300ක් සොරාගැනීම සම්බන්ධයෙන් එහි සේවකයන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බව තලංගම පොලිසිය කියයි.**

සැකකරුවන් දෙදෙනා එහි කාර්යාල කාර්ය සහායකයන් බවද පොලිසිය සඳහන් කරයි.

මෙලෙස සොරාගෙන ගොස් ඇත්තේ කඩදාසි 500 බැගින් අඩංගුව තිබූ බණ්ඩල් 300ක් බවට එහි ගණකාධිකාරිවරයා සිද්ධිය සම්බන්ධයෙන් තලංගම පොලිසියට ඉකුත් (16) කළ පැමිණිල්ලකට අනුව පොලිසිය පරීක්ෂණ පවත්වා සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත.

එම විගණන නිලධාරීන් ඉකුත් මාර්තු 30 දින සිදුකළ විගණනයේදී එහි ගබඩාවේ කඩදාසි බණ්ඩල්වල අඩුවක් තිබී නොමැති අතර, නොවැම්බර් මස 11 වැනිද සිදුකළ විගණනයේදී මෙම කඩදාසි බණ්ඩල්වල අඩුවක් හෙළිවීමෙන් පසුව ඔහු පොලිසියට පැමිණිලි කර තිබේ.

මෙම ගබඩාව මුද්‍රා නොතබා ඉතා අනාරක්ෂිතව පවතින බවටත්, එහි විවෘතව තැබෙන කවුළුවකින් සැකකරුවන් ගබඩාවට ඇතුළු වී මෙම සොරකම සිදුකර ඇති බවටත් පොලිසිය තොරතුරු හෙළි කරගෙන ඇත.

එම කවුළුවෙන් ඇතුළු වී කඩදසි බණ්ඩල් 10ක් සොරාගෙන ඒවා බත්තරමුල්ල ප්‍රදේශයේ වෙළෙඳසලකට අලෙවි කර ඇති බවට ඔවුන්ගෙන් කළ ප්‍රශ්න කිරීමකදී තොරතුරු හෙළි වූ බවද පොලිසිය පවසයි.

සැකකරුවන් එහි සේවකයන් කාර්යාලයෙන් පිටව යනතෙක් කාර්යාලයේ රැඳී සිටින බවත්, පසුව ඔවුන් කවුළුවෙන් ගබඩාවට ඇතුළු වී එහි කඩදසි බණ්ඩල සොරාගෙන පාසල් බෑගයක පුරවාගෙන රැගෙන යන අයුරු සී..සී.ටී.වී කැමරාවල සඳහන් වී ඇති බවත් පොලිසිය කියයි.

සොරාගන්න ලද සියලු කඩදසි බණ්ඩල්වල වටිනාකම මෙතෙක් පොලිසියට ලැබී නොමැත.

මෙම සොරකමට එහි තවත් සේවකයන් සම්බන්ධ බවට සැකකරන බවද උසස් පොලිස් නිලධාරියෙක් කීය.

මෙම සිද්ධියට සම්බන්ධ සෙසු සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් පරීක්ෂණ ආරම්භ කර ඇත.

බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ කාර්යාලය පිහිටා ඇත්තේ බත්තරමුල්ලේ පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ හත් වැනි මහලේය.

තලංගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අනිල් ජයන්ත මහතාගේ මෙහෙයවීමෙන්, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පී.ජී. එන්. ලක්ෂිත, පොලිස් සැරයන්වරුන් වන (27855) බන්දුල, (48874) රුවන්, කොස්තාපල්වරුන් වන (12489) නවරත්න, (99853) කුමාර, (92511) වින්තක, (22161) විතාන යන මහත්වරුන් පරීක්ෂණ පවත්වා සැකකරුව අත්අඩංගුවට ගත්හ.

# ග්‍රෑන්ඩ්පාස් වෙඩිතැබීමකින් 'මන්නා රමේෂ්'ට බරපතළ තුවාල

■ ඉන්දිකා රාමනායක

**යතුරුපැදියකින් පැමිණි දෙදෙනකු ග්‍රෑන්ඩ්පාස් නවගම්පුර ප්‍රදේශයේදී පෙරේදා (19) පෙරවරුවේ සිදුකළ වෙඩි තැබීමකින් පුද්ගලයකු බරපතළ තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇති බව පොලිසිය කියයි.**

සිද්ධියෙන් තුවාල ලබා ඇත්තේ මාරිමුත්තු ගනේෂරාජා හෙවත් "මන්නා රමේෂ්" නමැති සංවිධානාත්මක අපරාධකරුවකු බව පොලිසිය පවසයි.

මෙම පුද්ගලයා නවගම්පුර මාර්ගයේ පයින් ගමන් කරමින් සිටියදී පෙරේද පෙරවරු 9.45 ට පමණ යතුරුපැදියකින් පැමිණි දෙදෙනකු ඔහුට වෙඩි තබා පලාගොස් ඇතැයි පොලිසිය කියයි.

සිද්ධියෙන් බරපතළ තුවාල ලැබූ සැකකරු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත.

තුවාල ලැබූ 'මන්නා රමේෂ්' නමැත්තා මිනීමැරුම් ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ පුද්ගලයකු බවත්, බූස්ස බන්ධනාගාරයේ රඳවා සිටින මාලිගාවත්තේ සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයකු බව කියන කංජිපානි ඉම්රාන් නමැත්තාගේ පියා මීට මාස කිහිපයකට පෙර මාලිගාවත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධවලින් පහරදී ඝාතනය කිරීම ඇතුළු අපරාධ රැසක් සම්බන්ධයෙන් ඔහු බන්ධනාගාර ගතව සිට මීට සති කිහිපයකට පෙර ඇපමත මුදා හැර සිටි බවද පොලිස් ආරංචි මාර්ග පවසයි.


වෙඩි ප්‍රහාරයට ලක් වූ පුද්ගලයා සංවිධානාත්මක අපරාධකරුවකු බව කියන පූකුඩු කන්නා නමැත්තාගේ ඥාතියකු බවද පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

සිද්ධියේ සැකකරුවන් මෙතෙක් හඳුනාගෙන නොමැත.

කොළඹ උතුර සහකාර පොලිස් අධිකාරි නලීන් ජයසුන්දර මහතාගේ උපදෙස් මත, ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තාරක විජේසිංහ මහතාගේමෙහෙයවීම යටතේ, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිශ්ශංක විජේරත්න මහතා ප්‍රමුඛ පොලිස් කණ්ඩායමක් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

# නීති විද්‍යාල ශිෂ්‍ය ගාස්තු 60,000 කිරීම වහා නවතනු

## විපක්ෂ නායක සජිත් ඉල්ලයි



■ සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න

**නීති විද්‍යාල ශිෂ්‍ය ගාස්තු රුපියල් 15,000 සිට 60,000 දක්වා වැඩි කිරීමට යන බව ආරංචි වන හෙයින්, එය වහා නතර කරන ලෙස විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී පෙරේදා (19) ඉල්ලීමක් කළේය.**

ඔහු එසේ ඉල්ලා සිටියේ, කතානායකවරයාගේ අවසර ඇතුව විශේෂ ප්‍රකාශයක් කරමිනි.

මේ අවස්ථාවේදී විශාල මුදලකින් ගාස්තු වැඩි කිරීම එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දැරිය නොහැක්කක් බව ද ඔහු සඳහන් කළේය.

එසේම, නීති විද්‍යාලය අලුත් ආකාරයට පැවැත්වීමට යන විභාග වැඩපිළිවෙළ වසර තුනකට කල් දමන්නැයි ද විපක්ෂ නායකවරයා ඉල්ලා සිටියේය.

ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ප්‍රතික්ෂේප නොකරන නමුත්, ගහෙන් ගෙඩි එන්නා සේ එය එක පාරටම දැමීම සුදුසු නොවන බව පැවැසූ විපක්ෂ නායකවරයා, ස්ව භාෂාවෙන් අධ්‍යාපනය හැදෑරූ තමාට විදේශයේදී එකවරම ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමේදී ඇති වූ අපහසුතාව සිහිපත් වන බව ද ප්‍රකාශ කළේය.

# කුරුණෑගල ෆිනෑන්ස් සමාගමක කෝටි 991ක් පිල්ලි ගහලා

## තැන්පත්කරුවන්ගෙන් පොලිස්පතිට පැමිණිලි

■ වාරණ - ආනන්ද ඉ. ජයකොඩි

**ත්‍රිවිධ හමුදා හා පොලිසියේ විශ්‍රාමිකයන් විශාල පිරිසක් මූල්‍ය ආයතනයක තැන්පත් කර තිබූ රුපියල් කෝටි නවසිය අනූ එකක මුදලක් වංචා කර ඇති බවට එහි තැන්පතුකරුවන් පිරිසක් පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාට පැමිණිලි කර ඇත.**

කුරුණෑගල පවත්වා ගෙන ගොස් ඇති එම මූල්‍ය ආයතනයට ශ්‍රී ලංකා මහ බැංකුව ඉකුත් 2020 වසරේ ජුලි 10 වැනිද මුද්‍රා තැබීමෙන් අනතුරුව තමන්ගේ රුපියල් කෝටි නවසිය අනූ එකක තැන්පතු මුදලක් එහි හිමිකරු විසින් වංචා කරන ලද බවට පොලිස්පතිවරයාට කර ඇති එම පැමිණිල්ලේ සඳහන් කර ඇත.

මෙම මහා පරිමාණ මුදල් වංචාව නිසා මුදල් අහිමි වූ විශ්‍රාමිකයන් එම ආයතනයේ ගනුදෙනුකරුවන්ගේ සුබසාධක සංගමය නමින් සංවිධානයක් පිහිටුවා ගත් බවද එහි ලේකම් යුද හමුද විශ්‍රාමික බී.ආර්. දිසානායක මහතා පැවැසීය.

තම සංගමයේ වැඩි වශයෙන් සිටිනුයේ ත්‍රිවිධ හමුද හා පොලිස් විශ්‍රාමිකයන් බවත්, එම ආයතනයේ හිමිකරු මාසිකව සියයට හයක පොලියක් ලබා දෙන බවට පොරොන්දු වීම හේතුවෙන් තම සංගමයේ සාමාජිකයින් 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ මුදල් තැන්පත් කළ බවත් ඔහු කීවේය.

එම පැමිණිල්ල අධිකරණ අමාත්‍ය ආචාර්ය විජයදස රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි සිදුකර ඇතැයිද හෙතෙම සඳහන් කළේය.

# අයවැයේ ගොඩක් යෝජනා හොඳයි

## රාජිත කියයි

■ සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න

**මෙවර අයවැය යෝජනාවලියේ බොහෝ යෝජනා හොඳ බව සමගිජන බලවේගයේ කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා පාර්ලිමේන්තුවේ දී පෙරේදා (19) පැවසීය.**

දුෂ්කර පාසල්වලට පරිගණක ලබාදීමේ වැඩපිළිවෙළ අගමැතිවරයා ලෙස සිටිය දී ඉටුකර ගැනීමට නොහැකි වූවත් ජනාධිපතිවරයා ලෙස එය නැවත ක්‍රියාත්මක කිරීමට උත්සාහ දැරීම හොඳ දෙයක් යැයි ද ඔහු ප්‍රකාශ කළේය.

ත්‍රෛලෝක විජය පත්‍ර අපනයනයට අවසර ලබාදීම ද හොඳ දෙයක් බව පැවසූ මන්ත්‍රීවරයා කංසා ශ්‍රී ලංකාවේ සංස්කෘතිය බවද සුද්ද දුම්කොළ හඳුන්වා දී කංසා නැති කළ බවද පැවසුවේය.

සේනාරත්න මහතා එසේ පැවසුවේ අයවැය දෙවැනි වර කියවීමේ විවාදයේදීය.

# බැසිල් යළි එයි

## මැති ඇමැති පිරිසක් පිළිගන්න ගිහින්

■ කටුනායක ටී.කේ.ජී. කපිල

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා ඊයේ (20) පෙරවරුවේ යළි දිවයිනට පැමිණියේය.**

රාජපක්ෂ මහතා මීට මාසයකට පමණ පෙර ඇමෙරිකා එක්සත් ජනපදය වෙත ගොස් සිටියේය.

බැසිල් රාජපක්ෂ මහතා ඊයේ (20) උදේ 8.30ට ඩුබායි සිට එමිරේට්ස් ගුවන් සේවයේ ඊ.කේ. 650 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ සිටියේය.

රාජපක්ෂ මහතා පිළිගැනීම සඳහා රෝහිත අබේගුණවර්ධන, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ගාමිණී ලොකුගේ, පවිත්‍රා වන්නිආරච්චි, ශාන්ත බණ්ඩාර, එස්.එම්. චන්ද්‍රසේන, ප්‍රසන්න රණවීර, සනත් නිශාන්ත යන මැති ඇමැතිවරුන් ඇතුළු පිරිසක් ද කටුනායක ගුවන් තොටුපොළ විශේෂ අමුත්තන්ගේ මැදිරිය වෙත පැමිණ සිටියහ.

මෙහිදී ගුවන් තොටුපළෙන් පිටතට පැමිණි සනත් නිශාන්ත අමාත්‍යවරයා මාධ්‍යවේදීන් හමුවේ මේ පැමිණීම පිළිබඳව අදහස් දැක්වීය.

බැසිල් රාජපක්ෂ මහතා පක්ෂය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම පක්ෂයේ ඉදිරි කටයුතු කිරීම සඳහා මෙසේ පැමිණ තිබෙනවා. මෙම පැමිණීම පක්ෂයට ශක්තියක්. මන්ත්‍රීවරුන්ට ගමට ගිහින් ඡන්දෙ ගන්න රාජපක්ෂවරු අවශ්‍ය යැයිද පැවසීය.

# ජනපති වවුනියා සංචාරයේදී අතුරුදන්වූවන්ගේ ඥාතීහු විරෝධතාවක

■ වන්නි රොමේෂ් මධුෂංඛ

**ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ වවුනියාව සංචාරයට විරෝධය දක්වමින් හා යුද සමයේ අතුරුදන්වූවන් සොයාගැනීම සඳහා ජාත්‍යන්තර පරීක්ෂණයකට ඉඩ ලබාදෙන ලෙස ඉල්ලා වවුනියාව අතුරුදන්වූවන්ගේ ඥාතීහු වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට ඊයේ (19) විරෝධතාවක නිරත වූහ.**



අතුරුදන් වූවන්ගේ ඥාතීන් වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට දී විරෝධතාව සිදු කළ අයුරු.

අතුරුදන් වූවන්ගේ ඥාතීන් ජනාධිපතිවරයා පැමිණෙන මාර්ගය අසල විරෝධතාව පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර වවුනියාව පොලිස් නිලධාරීන් ඔවුන් ඉවත් කිරීමට කටයුතු කිරීමත් සමඟ දෙපාර්ශ්වය අතර උණුසුම් තත්වයක් ඇතිවිය.

ජනාධිපතිවරයා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති දිස්ත්‍රික් සංවර්ධන ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා පැමිණි අවස්ථාවේ දී අතුරුදන් වූවන්ගේ ඥාතීහු කළු කොඩි ඔසවමින් හා අතුරුදන්වූවන්ගේ ඡායාරූප පෙන්වමින් තමන්ගේ ගැටලුවට කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලා සිටියහ.

රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වීමෙන් අනතුරුව උතුරු පළාතේ සංචාරය කරන පළමු අවස්ථාව මෙය වන අතර එයට විරෝධය දක්වමින් අතුරුදන්වූවන්ගේ ඥාතීහු එලෙස විරෝධය දැක්වූහ.

වව්නියාව පොලිස් නිලධාරිනියන් ගෙන්වා විරෝධතාකරුවන් එක්තැනකට රැස්කොට ඔවුන්ට විරෝධතාව සිදුකිරීමට අවස්ථාව ලබාදුන් අතර ජනාධිපතිවරයා ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණ ආපසු පිටත්ව ගියේය.

# ජ'පුර සරසවිය අසලදී පොලිස් නිලධාරීන්ටත් ජලප්‍රහාරයක්

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අසල පිහිටි රාජ්‍ය බැංකුවක් ඉදිරිපිට රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරීන් දෙදෙනකුට විශ්වවිද්‍යාල සිසුන් බව කියන තරුණයන් පිරිසක් විසින් ඉකුත් 18 වැනිදා රාත්‍රියේ ජල ප්‍රහාරයක් එල්ල කරනු ලැබ ඇතැයි මිරිහාන මූලස්ථාන පොලිසිය පවසයි.**

ජල ප්‍රහාරය එල්ල වීමත් සමඟ පොලිස් නිලධාරීන් දෙදෙනා එම ස්ථානයෙන් ඉවත්ව ගොස් ඇතැයි පොලිස් ආරංචි මාර්ගවලින් දැන ගැනීමට ඇත.

පොලිතින් උරවලට ජලය පුරවා විශ්වවිද්‍යාල නේවාසිකාගාර භූමියේ සිට පොලිස් නිලධාරීන්ට මෙම ප්‍රහාරය එල්ල කර ඇතැයිද මිරිහාන මූලස්ථාන පොලිසියේ නිලධාරියෙක් ලංකාදීපයට පැවැසීය.

පොලිස් නිලධාරීන් දෙදෙනා විශ්වවිද්‍යාල සිසුන් ගමන් ගත් යතුරුපැදි නවත්වා පරීක්ෂා කර බලා ඇති අතර ඊට විරෝධය පෑමක් වශයෙන් මෙම ජල ප්‍රහාරය එල්ල කරන්නට ඇති බවට පොලිසිය සැකකරයි. මිරිහාන මූලස්ථාන පොලිසියේ රථවාහන අංශයේ නිලධාරීහු කණ්ඩායමක් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වති.

# දුම්රිය කාලසටහන මුළුමනින්ම වෙනස් කෙරේ

■ යොහාන් භාසුර

**දුම්රිය කාල සටහන සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමට තීරණය කර ඇති බවත් ඒ පිළිබඳ අවසන් තීරණය අද (21) ගැනීමට නියමිත බවත් දුම්රිය සාමාන්‍යාධිකාරී ඩබ්ලිව්. ඒ. ඩී. එස්. ගුණසිංහ මහතා 'ලංකාදීප'යට පැවසීය.**

දුම්රිය මාර්ගය අබලන්වීම නිසා වේගසීමා පැනවීමෙන් දුම්රිය ප්‍රමාදයන් පිළිබඳව අවධානය යොමුකර මීට පෙර වෙරළබඩ දුම්රිය මාර්ගයේ කාලසටහන වෙනස් කළ බවත් ඒ ආකාරයෙන්ම සෙසු මාර්ගවල ද දුම්රිය ධාවන වේලාවේ වෙනසක් කරන බවත් ගුණසිංහ මහතා කීය.

මෙම වෙනසත් සමඟ ගමන් වේලාව සුළු වශයෙන් වෙනස් වීමෙන් ගමන් වේලාවේ දීර්ඝ වීමක් වන බව කී දුම්රිය සාමාන්‍යාධිකාරිවයා සඳහන් කළේ දුර ගමන් දුම්රියට එම වෙනස එතරම් අදාළ විය නොහැකි බවය.

### අවසන් තීරණය අද

ඇතැම් විට මෙම කාලසටහනේ වෙනස අදියරෙන් අදියර කිරීමට හැකි බවත් කෙසේ වෙතත් මගීන්ට දුම්රිය ස්ථානවලට ළඟාවීම සඳහා පහසුකම් සපයන ලංකා ගමනා ගමන මණ්ඩලයට ද දුම්රිය කාලසටහනේ වෙනස දැනුම් දෙන බවත් ඒ මහතා කීය.

දුම්රිය ප්‍රමාද වීම නිසා කාර්යාල සේවක සේවිකාවන්ට නියමිත වේලාවට සේවා ස්ථානයට වාර්තා කිරීමට නොහැකි වීම ගැටලුවක් බවට පත්ව ඇති බවත් ඒ හේතුවෙන් ජනතාවගෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල අප්‍රසාදයක් එල්ල වී තිබෙන බවත් ගුණසිංහ මහතා සඳහන් කළේය.

# හාම්පුතා පොලිස් කූඩුවේ: බලු සුරතලා මුරට

■ බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

**පවුල් ආරවුලක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයකු සිර මැදිරියේ රඳවා සිටියදී ඔහුගේ නිවසේ ඇතිකරන සුනඛයා ද පැමිණ සිරමැදිරිය ඉදිරියට වී සිටි පුවතක් බුලත්සිංහල පොලිසියෙන් වාර්තා වේ.**

බුලත්සිංහල ප්‍රදේශයේ නිවසක පවුල් ආරවුලක් ඇති වී තිබෙන බවට, බුලත්සිංහල පොලිසියට 119 පොලිස් හදිසි ඇමතුම් අංශයෙන් පෙරේද (19) ලද පණිවිඩයක් අනුව රාත්‍රී ජංගම සංචාරයක නිරත පොලිස් නිලධාරීන් වහා ක්‍රියාත්මක වී එම නිවසේ සිටි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන රැගෙනවිත් සිරමැදිරියේ රඳවා තබා ඇත.

විනාඩි කිහිපයක් ගතවෙද්දී සිරමැදිරිය අසල සුනඛයකු වැතිරී සිටින අයුරු දුටු පොලිස් නිලධාරීන් එම සුනඛයා අවස්ථා කිහිපයකදීම පිටතට එළවා දමා ඇතත්, සුනඛයා යළිත් හොර රහසේ සිර මැදිරිය අසලටම පැමිණි බව බුලත්සිංහල පොලිසියේ නිලධාරියෙක් පැවසීය.

පසුව සොයා බැලීමේදී එහි සිට ඇත්තේ අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයා නිවසේ ඇති දැඩි කළ "බිංදු" නමැති සුනඛයා බවත්, මෙම සුනඛයා බුලත්සිංහල මෝල්කාව පාරේ නිවසේ සිට ජීප් රථය පසුපස කිලෝමීටරයකටත් අධික දුරක් පැමිණ සිරමැදිරිය ඉදිරිපිට රැඳී සිටිමින් යකඩ කූරු අතරින් තම ස්වාමියා දෙස බලමින් නගුට වනමින් සිටි බවත් එම පොලිස් නිලධාරියා සඳහන් කළේය.

සුනඛයාට ආහාර ද ලබාදී ඇති පොලිස් නිලධාරීන් පසුදින උදෑසන එහි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චමින්ද සිල්වා මහතාට ද මේ බව දැනුම් දී ස්ථානාධිපතිවරයාගේ උපදෙස් මත සිරමැදිරියේ දොර විවර කිරීමත් සමඟම සුනඛයා සිය ස්වාමියා අසලට දිව ගොස් ස්වාමියාගේ කකුල් දෙකට තම ඉදිරි ගාත් දෙක තබා නගුට වන්නට වූ බව ද එම පොලිස් නිලධාරියා කීවේය.

පසුව පොලිස් නිලධාරීන් එම පුද්ගලයා ස්ථානාධිපතිවරයා වෙත යොමු කර ඇති අතර ස්ථානාධිපතිවරයා උපදෙස් දැඩි අවවාද කර ඔහුට පොලිස් ඇප මත මුදාහැර ඇත. පසුව සුනඛයාද ඔහු සමඟ සතුටින් පිටව ගොස් ඇත.



# ඇල්ෆ්‍රඩ් පෙරේරා කලුරිය කරයි



**ප්‍රවීණ රංගන ශිල්පියකු මෙන්ම ගුවන් විදුලි නිවේදකයකු වූ ඇල්ෆ්‍රඩ් පෙරේරා මහතා අභාවප්‍රාප්ත විය.**

ඔහු මියයන විට 93 වන වියෙහි පසුවිය.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති නිවේදකයකු වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළ ඇල්ෆ්‍රඩ් පෙරේරා මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාෂා පරිවර්තකයකු වශයෙන් ද දීර්ඝ කාලයක් කටයුතු කර ඇත.

ඔහු කලක් පිලිපීනයේ මැනිලා නුවර වෙරිටාස් ගුවන්විදුලි සේවයේ සිංහල අංශය භාරව ද කටයුතු කළේය.

ගුවන් විදුලියේ ඉතා ජනප්‍රිය විනෝද සමය වැඩසටහනේ නිර්මාතෘවරයා මෙන්ම ආරම්භක නිවේදකයා ද වූ ඇල්ෆ්‍රඩ් පෙරේරා මහතා චිත්‍රපට ටෙලි නාට්‍ය ගණනාවකට රංගනයෙන් දායක විය.

දේහය මාකොළ සුප්‍රීම් අවමංගල්‍ය ශාලාවේ තැන්පත් කර ඇති අතර, අවසන් කටයුතු දළුගම දේවස්ථාන සුසාන භූමියේ දී හෙට (22) පස්වරු 3.30ට සිදු කෙරේ.

■ ඩයනා උදයංගනී

# රජයේ ඇතැමුන් රට මුහුණපා ඇති විපතත් සාක්කු පුරවා ගැනීමට යොදාගන්නවා

## කළුසල්ලි සුදුකරන දකුණු ආසියාවේ ප්‍රධාන තැන ලංකාව වෙලා

## උත්තර ලංකා සභාගයේ මහජන සමුළුවේදී විමල් වීරවංශ කියයි

■ ඩයනා උදයංගනී

**රජයේ ඇතැමුන් රට මුහුණ පා ඇති විපත ද තමන්ගේ සාක්කු පුරවා ගැනීමට භාවිත කරන බව උත්තර ලංකා සභාගයේ සභාපති, ජාතික නිදහස් පෙරමුණේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ මහතා පෙරේදා (19) පැවැසීය.**

සමහර නැව්වලට ප්‍රමාද ගාස්තු ගෙවීම ප්‍රමාද කරන්නේ ඩොලර් නැති නිසා නොව, ප්‍රමාද ගාස්තුවෙන් ද සියයට 40ක් නැවට දී ඉතිරි 60 ලබාගැනීමට බව කී වීරවංශ මහතා, එසේ කිරීමට ඉඩ දෙන අශ්ලීල නායකත්වයකට මෙවැනි තීරණාත්මක අවධියක් පසු කිරීමට නොහැකි බව ද සඳහන් කළේය.

ජාවාරම්කරුවන් උපයන කළු සල්ලි සුදු කරන දකුණු ආසියාවේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට ශ්‍රී ලංකාව පත්ව ඇතැයි කී වීරවංශ මහතා, ආණ්ඩුව මහා පරිමාණ ජාවාරම්කරුවන්ට අත නොතියා පොඩි මිනිහාගේ පිටටම බර පවටා අර්බුදයෙන් ගොඩ ඒමට උත්සාහ කරන බව ද ප්‍රකාශ කළේය.

විමල් වීරවංශ මහතා මේ බව පැවැසුවේ උත්තර ලංකා සභාගය මගින් කොළඹ, සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පෙරේද (19) පැවැත්වූ "කරව්! නැත්නම් පලයව්" මහජන සමුළුව අමතමිනි.

වත්මන් අර්බුදයෙන් ගොඩ ඒම සඳහා උත්තර ලංකා සභාගය යෝජනා කරන දෙළොස් වැදෑරුම් ප්‍රතිපත්තිය එළිදැක්වීම ද මෙහිදී සිදු විය.

විමල් වීරවංශ මහතා මෙසේ ද කීවේය.

"අපේ වත්මන් ජනාධිපති හා අගමැති ඉගෙන ගත්තේ කොළඹ රාජකීය විද්‍යාලයේ. විදුහල් පාඨය 'උගනිව්, නැතහොත් පිටවව්' යන්නයි. අපි අද 'කරව්, නැත්නම් පලයව්' තේමාව ගෙනාවේ ඒ පාඨය අනුවයි. මෙය වසර 74ක සාපයක් බව සමහරු කියනවා. එහෙනම් ප්‍රවාහනය ජනසතු කිරීම, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය ආදී සියල්ල වැරැදි ද? මේ රටේ අතීතයේ විවිධ ප්‍රගතිශීලී පාලනයන් රටේ අනාගතය ගැන සිතා ගත් බොහෝ පියවර තිබෙනවා. ඒ යුගවල මෙවන් අර්බුද ඇති වුණේ නෑ.

රනිල් වික්‍රමසිංහගේ යහපාලන කාලේ ඩොලර් බිලියන 12.5ක් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවලින් අධික පොලියට ගත්තා. සීතල වතුර නෑවේ රනිල් වික්‍රමසිංහ වුණත් හෙම්බිරිස්සාව හැදුණේ ගෝඨාභය රාජපක්ෂ මහතාටයි. අපි එය දැනී වහාම පෙර ක්‍රියාමාර්ග ගන්නා ලෙස කීවා. එසේ නොකළ නිසා අන්තිමේ එතුමාට තනතුර දමා යන්න සිදු වුණා. ඉන්දියාව 1991 දී මුහුණ පෑ අර්බුදය හරියට කළමනාකරණය කර ලෝකයේ තුන්වැනි ආර්ථික බලවතා වී තිබෙනවා.



උත්තර ලංකා සභාගයේ සභාපති, ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ, ජාතික සංවිධායක, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර යන මහත්වරු සමුළුව අතරතුර සුහද කතාබහක යෙදී සිටි අයුරු. එහි අනුශාසක, විජය ධරණී ජාතික සභාවේ නායක අතුරලියේ රතන හිමියෝ සහ ලේකම්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්, වෛද්‍ය ජී. වීරසිංහ, නියෝජ්‍ය සභාපති, පිවිතුරු හෙළ උරුමයේ නායක උදය ගම්මන්පිල, නියෝජ්‍ය සභාපති, ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රධාන ලේකම්, මහාචාර්ය තිස්ස විතාරණ, නියෝජ්‍ය ලේකම්, යුතුකම ජාතික සංවිධානයේ සභාපති ගෙවිඳු කුමාරතුංග යන මහත්වරු ද මෙහි වෙති. ඡායාරූප - ගයාන් අමරසේකර

ඒත් අපේ අය බලන්නේ අම්මාගේ මළමිනිය තවත් එම්බාම් කරමින් තියාගෙන වැඩිපුර බූරු ගහන්නයි. රනිල් වික්‍රමසිංහ මහතා ගෙනා අතුරු අයවැයේ විදේශ විනිමය පනත සංශෝධනය කරන බව ඇතත් මේ වන තුරු කර නැහැ. මේ රටට අයිති ඩොලර් බිලියන 35කට වැඩි විදේශ විනිමය වෙන රටවල ගාල් කර තිබෙනවා. අද කළු සල්ලි වෙළෙඳපොළට නැගෙන්න ඉඩ දී බලා ඉන්නවා. කළු සල්ලි සුදු සල්ලි බවට පත්කරන දකුණු ආසියාවේ ප්‍රධාන මධ්‍යස්ථානය හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හොයන කළු සල්ලි සුදු කරන ප්‍රධාන තිප්පල ශ්‍රී ලංකාව වෙලා. කළු සල්ලි මාෆියාවට වැඩෙන්න දී මේ අර්බුදයෙන් මිදෙන්න බෑ.

මේ දවස්වල රනිල් වික්‍රමසිංහට වැදගත් ආයතන නොව කුස්සියලු. ළිපට පිඟිනවාත් ඇති. පාඩු ලබන රාජ්‍ය ආයතන ගැන කියා මුට්ටිය දමා ලාබ ලබන රාජ්‍ය ආයතන විකුණන්න හදනවා. අබලි යකඩවලට විකුණන්න තිබුණු වාලච්චේන කම්හලේ එක් යන්ත්‍රයක් පණගන්වා ලාබ ලබන්න අපිට හැකි වුණා. පාඩු ලබන රාජ්‍ය ආයතන බලගැන්වීම මහ දෙයක් නෙවෙයි."

උත්තර ලංකා සභාගයේ ජාතික සංවිධායක, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර, නියෝජ්‍ය සභාපති, පිවිතුරු හෙළ උරුමයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහත්වරුද උත්තර ලංකා සභාගයේ අනුශාසක, විජය ධරණී ජාතික සභාවේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමියෝද, නියෝජ්‍ය සභාපති, ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රධාන ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණද මෙහිදී අදහස් දැක්වූහ.

උත්තර ලංකා සභාගයේ ලේකම්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්, වෛද්‍ය ජී. වීරසිංහ මහතා මෙහි පිළිගැනීමේ කතාව පැවැත්වීය. විධායක කමිටු සාමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් මුසම්මිල් මහතා අර්බුදයෙන් ගොඩ ඒම සඳහා වන දෙළොස් වැදෑරුම් ප්‍රතිපත්තිය සභාවට ඉදිරිපත් කළේය.

සභාගයේ නියෝජ්‍ය ලේකම්, යුතුකම ජාතික සංවිධානයේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග, ජාතික විධායක කමිටු සාමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ වෘත්තීය සමිති නායක අම්මාන් අල්ලුසාමි යන මහත්වරු ද අදහස් දැක්වූහ.

## ඉඩම් ගැටලු විසඳන්න පළාත් මට්ටමින් කමිටු 8 ක්

1 වැනි පිටුවෙන්

ඒ අනුව, උතුරේ සහ දකුණේ සියලු ඉඩම් ගැටලු නිරාකරණය කිරීමට හැකිවනු ඇතැයි ද ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කළේ, වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පෙරේදා (19) පැවැති දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමට සහභාගි වෙමිනි.

උතුරු පළාතේ වව්නියාව, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි මෙම සංවර්ධන කමිටු රැස්වීම කැඳවා තිබූ අතර, එම දිස්ත්‍රික්කයන්හි මහජන නියෝජිතයෝ සහ රාජ්‍ය නිලධාරීහු ඊට එක්ව සිටියහ.

පළාතේ ඉඩම්, නිවාස, පොළොව, වාරිමාර්ග සහ කෘෂිකර්ම යන ක්ෂේත්‍රයන්හි මතුව ඇති ගැටලු හා ඒවාට ලබා දිය හැකි විසඳුම් පිළිබඳව මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

උතුරු පළාතේ විවිධ ක්ෂේත්‍රයන්හි මතුව ඇති ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දෙමින් එම ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට පියවර ගන්නා බව පැවසූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා, ඒ සඳහා උතුරු පළාතේ සියලු මන්ත්‍රීවරුන්ගේ සහාය ද අපේක්ෂා කරන බව සඳහන් කළේය.

මෙතෙක් විසඳුම් ලැබී නොමැති ගැටලු රැසක් උතුරේ පවතින බවත්, සියලු පාර්ශ්වයන් සමග සාකච්ඡා කරමින් ඒවාට අවශ්‍ය විසඳුම් ලබා දීමට කටයුතු කරන බවත්, ජනාධිපතිවරයා සඳහන් කළේය.

1994 සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචි කළ දෙමළ ජනතාවට තවමත් ඉඩම් ලබා නොදීම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී චාල්ස් නිර්මලනාදන් මහතා ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කළේය.

සෙට්ටිකුලම ප්‍රදේශයේ ඉඩම් ගැටලුව මාස තුනක් ඇතුළත විසඳීමට මැදිහත් වී කටයුතු කරන ලෙස ජනාධිපතිවරයා වව්නියාව දිස්ත්‍රික් ලේකම්වරයාට උපදෙස් දුන් අතර, ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයෙන් සහ ඉඩම් අමාත්‍යාංශයෙන් කරුණු විමසන බව ද පැවසීය.

## කෝටි අට ලක්ෂයක ආයෝජනවලින් කෝටි පන් ලක්ෂයක්ම බහිරවයා ගිලලා

1 වැනි පිටුවෙන්

මෙම ආයෝජනවලින් ගිණුම් ගතව තිබෙන්නේ රුපියල් ලෙලක්ෂ අසූදහසකට ආසන්න වටිනාකමකින් යුත් මූල්‍ය හෝ මූල්‍ය නොවන වත්කම් පමණක් බවද එම වාර්තාවේ දැක්වේ.

එම වාර්තාවට අනුව මෙම කාල සීමාවේදී කළ රාජ්‍ය ආයෝජන ප්‍රමාණය රුපියල් කෝටි 8,19,900ක් වන අතර හඳුනාගත් වත්කම්වල වටිනාකම රුපියල් කෝටි 2,78,400ක් බවද එහි සඳහන් වේ.

රුපියල් කෝටි 5,41,500ක වත්කම් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නැතැයි ද එහි දැක්වේ.

2005 වසරේ සිට 2014 දක්වා කාලය තුළ නිකුත් කළ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කර නොතිබුණ බවද ඒවා ගිණුම් ගත කර තිබුණේ 2015 වසරේ සිට බවද එම වාර්තාවේ සඳහන් වේ.

මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සියල්ලේම වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු බවට විගණකාධිපති දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයට නිර්දේශ කර තිබේ.

මහාභාණ්ඩාගාරය 2021 දෙසැම්බර් 31 දින නිකුත් කළ රාජ්‍ය මූල්‍ය ප්‍රකාශනය ඇසුරෙන් සිදුකළ විගණන වාර්තාවක මේ බව සඳහන් වේ.

## රුමේනියා රැකියා පෙන්වා සම්මුඛ පරීක්ෂණ කළ පිටරැටියකු ඇතුළු 4 ක් අත්අඩංගුවට

1 වැනි පිටුවෙන්

අත්අඩංගුවට පත්ව සිටින විදේශිකයා ඉතාලි ජාතිකයකු බවත් සෙසු තිදෙනා ශ්‍රී ලාංකිකයන් බවත් ඔහු කීවේය.

මෙම පිරිස බදුල්ල ප්‍රදේශයේ හෝටලයක සංචාරක වීසා මත රැඳී සිටියදී අත්අඩංගුවට පත් වූ බවද එම නිලධාරියා කීය. සඳහන් කළේය.

මෙම පිරිස රුමේනියාවේ රැකියා ලබාදෙන බවට පවසමින් රට පුරා විවිධ ප්‍රදේශවල ප්‍රධාන හෝටල්වල සම්මුඛ පරීක්ෂණ පවත්වන බවට විදේශ සේවා නියුක්ති කාර්යංශයට තොරතුරු ලැබී තිබුණු බවත් ඔවුන් සමාජ මාධ්‍ය ජාලා කීපයකම මේ පිළිබඳව දැන්වීම් පළකර තිබූ බවත් එම නිලධාරියා කීය.

ජනතාවගෙන් ලැබුණු තොරතුරු සහ සමාජ මාධ්‍ය ජාල හරහා කළ විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස මෙම පුද්ගලයන් බදුල්ල ප්‍රදේශයේ සිටින බවට හෙළි කරගැනීමෙන් පසුව වැටලීමක් කර ඔවුන් අත්අඩංගුවට ගත් බව ද එම නිලධාරියා සඳහන් කළේය.

ඔවුන් බදුල්ල අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

## ඉඩම් සංස්ථාව කෝටි 27 ක ඉඩමක් අත යට විකුණලා

1 වැනි පිටුවෙන්

පනතේ අංක 3 හා 4 වගන්ති අනුව සංස්ථාව සතු ඉඩම් විකිණීමේදී ඒ සඳහා කර්මාන්ත, පළාත් පාලන අමාත්‍යවරුන්ගේ නිර්දේශය ලබාගත යුතු වුවත්, මෙම ඉඩම විකිණීමට 2019 වර්ෂයේදී එලෙස නිර්දේශයක් ලබා ගෙන නොතිබූ බව ද වාර්තාවේ දැක්වේ.

මේ අතර, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් විදේශ නීති ආයතනයකට කරන ලද ගෙවීමක් බාහිර ප්‍රද්ගලයකුගේ ගිණුමකට බැර වීමෙන් එම ආයතනයට රුපියල් ලක්ෂ 40කට වැඩි පාඩුවක් සිදු වී ඇතැයි විගණන අංශ පවසයි.

මුදල් ගෙවීමට පෙර ආදායකයාගේ අනන්‍යතාව නිවැරදිව තහවුරු කරගැනීමකින් තොරව මුදල් බැර කිරීම නිසා මෙම පාඩුව සිදු වී ඇති බව ද එම වාර්තාවේ දැක්වේ. මේ තොරතුරු සඳහන් වන්නේ, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2019 වාර්ෂික වාර්තාවට ඇතුළත් කරනු ලැබ ඇති විගණන වාර්තාවේය.

## රුපියල් 475 මාස්ක් 2050 ගානේ 1,080 ක් අරන් රජයට ලක්ෂ 17 ක් පාඩු කරලා

1 වැනි පිටුවෙන්

මේ බව සඳහන් වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන් 2021 වසරේ දෙසැම්බර් 31 දිනට සිදුකළ විගණන වාර්තාවේය.

මෙම මුහුණු ආවරණ මිලදී ගෙන තිබුණේ වෛද්‍ය සැපයුම් අංශය එම රෝහලට ප්‍රමාණවත් තරම් මුහුණු ආවරණ සපයා තිබියදී බවද එහි සඳහන් වේ.

වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබාදුන් මුහුණු ආවරණ රසායනාගාර සේවකයන්ගේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවට ක්ෂේද්‍රජීව විශේෂඥ වෛද්‍යවරිය දුන් නිර්දේශයකට හා ඇයගේ ඉල්ලීම පරිදි නව මිලදී ගැනීම සිදුකළ බව රෝහලේ කළමනාකාරීත්වය විගණනයට දැනුම් දී තිබේ.

මෙම භාණ්ඩ මිලදී ගැනීමේදී නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යටත්ව සිදුකර නැතිව තිබූ බවද එම ක්‍රියාවලියේ ගැටලු රැසක් ඇති බවද එහි සඳහන් වේ.

විගණන වාර්තාවට අනුව ප්‍රසම්පාදනයේදී ඉදිරිපත් කර තිබූ ලංසුවලින් එකක් ව්‍යාජ වේ. ලංසුකරුවන් තිදෙනකුට මෙම භාණ්ඩ සැපයුම සඳහා ලියාපදිංචිවූවන් නොවන බවද එහි දැක්වේ.

එසේම මෙම මිලදී ගැනීම සිදුකළ සැපයුම්කරුගෙන් සිදුකළ මිල ගණන් කැඳවීම් විගණනයට ඉදිරිපත් නොකළ අතර එය සිදුකළේ ෆැක්ස් මගින් බවට ද කළමණාකාරීත්වය දන්වා ඇතැයි ද එහෙත් එම වාර්තාවේ සඳහන් වේ.

ඒ සඳහා සාක්ෂිද ඉදිරිපත්ව නැතැයිද පසුව රෝහල් කණමණාකාරීත්වය කරුණු දක්වමින් සඳහන් කර තිබෙන්නේ හදිසි මිලදී ගැනීමක් නිසා දුරකතනයෙන් මිල ගණන් ලබාගෙන ගනුදෙනුව සිදුකළ බව යැයිද විගණන වාර්තාව පෙන්වා දෙයි.

## ග්ලයිෆොසේට් තහනම ඉවතට

1 වැනි පිටුවෙන්

ග්ලයිෆොසේට් තහනම තවදුරටත් පවත්වාගෙන යා යුතුද? නැද්ද? යන්න පිළිබඳව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා ගොවි නියෝජිතයන්, කෘෂිකර්ම විශේෂඥයන්, කෘෂි විද්‍යාඥයන් ඇතුළු විවිධ අංශවලින් කළ විමසීම් ගණනාවකින් අනතුරුව ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට තීරණය කළ බව කෘෂිකර්ම අමාත්‍යාංශය පවසයි.

පළමුවරට 2015 දී මෙරට ග්ලයිෆොසේට් තහනම් කරන ලද්දේ වල් මර්දනය සඳහා කිසිදු විකල්ප වැඩපිළිවෙළක් හඳුන්වා නොදෙමින් බවත් ඉන් අනතුරුව 2018 දී තේ හා රබර් සඳහා ග්ලයිෆොසේට් යෙදීම තහනම් කළ බවත් කෘෂිකර්ම අමාත්‍යාංශය කියයි.

එහෙත් ඇතැම් පුද්ගලයන් මුහුදු මාර්ගයෙන් මෙරටට තත්වයෙන් බාල ග්ලයිෆොසේට් හොර පාරෙන් ආනයනය කර ඉහළ මිල ගණන් යටතේ අලෙවි කරනු ලැබූ බව ද අමාත්‍යාංශය පවසයි.

එමනිසා තවදුරටත් ග්ලයිෆොසේට් තහනම පවත්වාගෙන යාම ඵලක් නැති තත්වයට පත්වී තිබූ බව ද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වල් මර්දනය සඳහා විකල්ප ක්‍රමවේදයක් මෙතෙක් නොතිබූ බැවින් අස්වනු අඩුවීමට එය ද හේතුවක් වූ බව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය. ඒ අනුව 2015 සිට වසර 07ක් තිස්සේ පැවැති ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට පියවර ගත් බව අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස සමරසිංහ මහතා පැවසීය.

## අරාබිකරයට කතුන් විකුණන ජාවාරමාත් ගෝලයාත් රිමාන්ඩ්

1 වැනි පිටුවෙන්

ප්‍රධාන සැකකරු කටුනායක ගුවන්තොටු පොළේ දී ආගමන විගමන නිලධාරීන් විසින් පෙරේද (19) අත්අඩංගුවට ගනු ලැබූ අතර ඔහුගේ තැරැව්කරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළෙඳාම ජාවාරම් විමර්ශන සහ සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාස විසින් කොළඹදී පෙරේද පස්වරුවේ අත්අඩංගුවට ගනු ලැබීය.

ප්‍ර ධාන සැකකරු වන මොහොමඩ් රිස්වි මොහොමඩ් ඉන්ෆාම් නමැත්තා ලබන 24 වැනිද දක්වා රිමාන්ඩ් බාරයට පත්කර ඇති අතර අනෙක් සැකකරු වන බාලක්‍රිස්නන් කුගනේෂ්වරන් නමැත්තා ලබන මස 1 වැනිද දක්වා රිමාන්ඩ් බාරයට පත්කර ඇත.

ප්‍රධාන සැකකරු වන මොහොමඩ් රිස්වි මොහොමඩ් ඉන්ෆාම් (44) නමැත්තා දෙහිවල පල්ලිය පාර ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර ඔහු ඩුබායි සිට පෙරේද (19) කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපොළට පැමිණ සිටිය දී පෙරේද අලුයම අත්අඩංගුවට ගෙන ඇත.

ඔහු ආගමන විගමන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධාරීන් වෙත බාර දෙනු ලැබීමෙන් අනතුරුව මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ වැඩබලන මහේස්ත්‍රාත් ප්‍රිමාල් අමරසිංහ මහතා වෙත පෙරේද පස්වරුවේ ඉදිරිපත් කිරීමෙන් පසුව ලබන 24 වැනිද දක්වා රිමාන්ඩ් බාරයට පත් කර ඇත. මෙම සැකකරු සම්බන්ධයෙන් හෙළි කරගත් තොරතුරු අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඔහු සම්බන්ධයෙන් ගුවන්තොටුපොළ ආගමන විගමන බලධාරීන් දැනුවත් කිරීමෙන් පසුව සැකකරු මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත.

සැකකරු ජනාධිපති ලේකම් කාර්යාලයේ තුන්වැනි ලේකම්වරයා වශයෙන් පෙනී සිටිමින් මෙම මිනිස් ජාවාරම මෙහෙයවා ඇති බවත්, ඔහු විවාහ දෙකක් කරගෙන ජාවාරමෙන් උපයාගන්නා මුදල්වලින් දෙහිවල පල්ලිය පාරේ සහ වත්තල ප්‍රදේශයේ සුඛෝපභෝගී නිවාස දෙකක සුඛෝපභෝගී දිවි ගෙවන බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය කියයි.

මේ අතර සැකකරු සම්බන්ධයෙන් හෙළි වූ තොරතුරු අනුව කාර්යාංශයේ නිලධාරීන් ඔහු අත්අඩංගුවට ගැනීමට මෙම නිවාස දෙක වෙත ගිය ද ඔහු ඒ වනවිට විදෙස් ගත වී සිටි බවද විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයේ කළමනාකරු කපිල කරුණාරත්න මහතා පැවසීය.

ඔහු බලපත්‍ර නොමැතිව මරදාන ප්‍රදේශයේ විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන ගොස් ඇති බවට ඔහු දිවයින පුරා පවත්වාගෙන යන තවත් රැකියා නියෝජිත ආයතන කිහිපයක් එක්ව සංචාරක වීසා මත කාන්තාවන් සහ ළාබාල තරුණියන් ඕමානය, අබුඩාබි ඇතුළු රටවල්වලට අලෙවි කර මිනිස් ජාවාරම සිදුකර ඇති බවටත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය තොරතුරු හෙළි කරගෙන ඇත.

ප්‍රධාන සැකකරු සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලැබුණු පැමිණිලි 8 ක් අනුව මේ පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර, විමර්ශන වල ප්‍රතිඵලයක් වශයෙන් ඔහු මෙරටට පැමිණි පළමු අවස්ථාවේදීම අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවත් විදේශ සේවා නියුක්ති කාර්යාංශ ආරංචි මාර්ග කියයි.

සංචාරක වීසා මගින් ඩුබායි, අබුඩාබි රැගෙන එන ඇතැම් කාන්තාවන් හා තරුණියන් බස්රථවල නංවා එම රටවල දේශ සීමා තරණය කරමින් ඕමානය වෙත ගෙන්වා ගෙන එහිදී රුපියල් ලක්ෂ 10ත් ලක්ෂ 20ත් අතර මුදලකට ගණිකා සේවය සඳහා අලෙවි කරන බවට ද විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් තොරතුරු හෙළි කරගෙන ඇත.

ඔහු විදේශ ගතකළ කාන්තාවන් නැවත ගෙන්වා දෙන ලෙසට භාරකරුවන් ඉල්ලා සිටි අවස්ථාවේ ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ ගණනින් මුදල් හා ලිංගික අල්ලස් ඉල්ලා ඇති බවට ද විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි ලැබී තිබේ.

කාන්තාවන් අලෙවි කිරීම සමබන්ධයෙන් ඔහුට එරෙහිව මැදපෙරදිග රටවල් කිහිපයක තානාපති කාර්යාල මගින් ද විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි ලැබී ඇති බව එම කාර්යාංශය පවසයි.

සැකකරු සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළෙඳම, ජාවාරම් විමර්ශන සහ සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාස අධ්‍යක්ෂවරයා ඇතුළු පොලිස් කණ්ඩායමක් ද මීට පෙර ඕමානය වෙත ගොස් විමර්ශන ආරම්භ කර තිබිණි.

මෙම මිනිස් ජාවාරමට ලක් වූ කාන්තාවන් රැසක් අබුඩාබි, ඕමානය, ඩුබායිහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට අනුබද්ධ රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින බවට කාර්යාංශ ආරංචි මාර්ග පවසයි.

ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමෙන් පසුව ඔහුට එරෙහිව තවත් පැමිණිලි රාශියක් ගොනු කිරීමට බලාපොරොත්තු වන බවද කාර්යාංශ ආරංචි මාර්ග කියයි.

මේ අතර ප්‍රධාන සැකකරුට මේ සඳහා ආධාර අනුබල ලබා දෙමින් ඔහුගේ මෙරට නියෝජිතයකු (තැරැව්කරුවකු) වශයෙන් කටයුතු කළ අනෙක් පුද්ගලයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තනැත්තන් වෙළෙඳම, ජාවාරම් විමර්ශන සහ සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු අවිස්සාවේල්ල පුවක්පිටිය ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි පුද්ගලයකු බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවසයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළෙඳම, ජාවාරම් විමර්ශන සහ සමුද්‍රීය අපරාධ විමර්ශන කොට්ඨාස අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමරකෝන් බණ්ඩා මහතාගේ අධීක්ෂණයට යටතේ විශේෂ කණ්ඩායමක් යොදා මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

මේ අතර ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගෙන මීගමුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කළ අවස්ථාවේ සැකකරු සමග මෙරටට පැමිණි කාන්තාවන් 19 දෙනකු මීගමුව අධිකරණයට අනවසරයෙන් පැමිණ ඇති අතර අත්අඩංගුවට ගත් සැකකරු නිර්දෝෂී බවටත් ඔහුගේ වියදමින් ඔවුන් ඕමානයේ සිට මෙරටට පැමිණි බවටත් පවසා ඇත.


ඔවුන් අනවසරයෙයන් අධිකරණය හමුවට පැමිණීම සම්බන්ධයෙන් විරෝධය දැක් වූ වැඩබලන මහේස්ත්‍රාත්වරයා එම කාන්තාවන් පිරිස අධිකරණ භූමියෙන් ඉවත්කරන ලෙසට පොලිසියට නියෝග කර ඇත. සැකකරු ඕමානයේ රැකියා ලබාදෙන බව කියා කාන්තාවන් සිව්දෙනකු සංචාරක වීසා මගින් ඩුබායි රාජ්‍ය වෙත රැගෙන ගොස් ඇති බවත්, එහිදී කාන්තාවන් ඕමානයට නොයවා බලහත් කාරයෙන් එහි ඒජන්සිකරුවන් හරහා අබුඩාබි රටේ රැකියා සඳහා යොමුකර ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ආරංචි මාර්ග පවසයි.

එරටේ අතරමං වූ කාන්තාවන් ඔවුන්ගෙන් ලංකාවට පැමිණ සිද්ධිය පොලිසියට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කළ පැමිණිල්ලකට අනුව විමර්ශන පවත්වා සැකකරු අත්අඩංගුවට ගත් බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ආරංචි මාර්ග කියයි.

සැකකරු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන මස 1 වැනිද දක්වා රිමාන්ඩ් භාරයට පත්කරනු ලැබීය.

## අනේද කියන්නෙ ! – තලන්

| | |
|---|---|
| පාර්ලිමේන්තු මහජන ගැලරියට | විනා |
| එන්නට නොහැකි අසුනක් කිසිවිටක | දිනා |
| 'කපුටා' කියූ විට හඳුනන සියලු | දෙනා |
| එතුමා ජනපතිට නැවතත් අවැසි | වුනා |



# කෝටි 12 ක් වංචා කළ අක්කා - නගෝ අත්අඩංගුවට

■ ඉන්දිකා රාමනායක

**ව්‍යාජ ලේඛන සකස් කර නෝර්වේ රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකිකයකුගෙන් රුපියල් කෝටි 12 කට අධික මුදලක් බැංකු 23කට බැරකරගෙන වංචා කළ යාපනය ප්‍රදේශයේ තරුණියෝ දෙදෙනෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් අත්අඩංගුවට ගනු ලැබූහ.**

මොවුන් ජාලගත අපරාධ කොටස්කරුවන් බවට සැකකරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සැකකරියන් යාපනය නාවත්තුරෙයි ප්‍රදේශයේ පදිංචි 34, 30 යන වයස්වල පසුවන එකම පවුලේ සහෝදරියන් දෙදෙනකු බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවසයි.

ව්‍යාපාරිකයකු වන තම මියගිය පියාට අයත් රුපියල් කෝටි 100ට අධික වටිනා මුදල් සහ රන් භාණ්ඩ විශාල ප්‍රමාණයක් පුද්ගලික බැංකුවක තැන්පත් කර ඇති බවත් එම මුදල් සහ රන් භාණ්ඩ නීතිමය වශයෙන් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ගැනීමට යැයි පවසා සැකකාරියන් ඉහත මුදල ගෙන්වාගෙන වංචා කර ඇති බවද එම ආරංචි මාර්ග සඳහන් කරයි.

නෝර්වේ රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකිකයා සැකකාරියන්ගේ මෙම වංචාවට හසුවී 2021 වසරේ ජනවාරි මස සිට ජූලි මස දක්වා කාලය තුළ වරින් වර මෙම මුදල් එවා ඇති බවත් බැංකු ගිණුම් 23 කට එම මුදල් බැර කර ඇති බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සැකකාරියන් එම මුදල් ලබාගෙන ඒවා වෙනත් පුද්ගලයන්ගේ ගිණුම්වල තැන්පත් කර ඇති බවද එම දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

තමන් මෙම සැකකාරියන්ගේ වංචාවට හසුව ඇති බව අනාවරණය වීමෙන් අනතුරුව නෝර්වේ රාජ්‍යයේ පදිංචි පුද්ගලයා මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත.

එම පැමිණිල්ල අනුව විමර්ශනය සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් ඉහත සැකකාරියන් දෙදෙනා ඉකුත් (18) දින අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරියන්ගේ නිවාස පරීක්ෂා කිරීමේදී ව්‍යාජ ලේඛන සහ මුද්‍රා රැසක් සොයා ගෙන ඇත.

යාපනය ප්‍රදේශයේ අධිකරණ විනිසුරුවරුන්ගේ, බැංකු කළමනාකරුවන්ගේ, නීතිඥවරුන්ගේ, ග්‍රාම නිලධාරීන්ගේ ඇතුළු රජයේ ආයතනවල නිලධාරීන්ගේ අත්සන් නිලමුද්‍රා ලිපි ශීර්ෂ යොදා සකස් කළ ලේඛන බැංකු පොත් රිසිට්පත් රැසක්ම තිබූ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවසයි.

අත්අඩංගුවට ගත් සැකකාරියන් දෙදෙනා ඊයේ (20) යාපනය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන මස (1) රිමාන්ඩ් භාරයට පත්කර ඇත.

මෙම සිද්ධියට සම්බන්ධයෙන් තවත් සැකකරුවන් කිහිප දෙනකු අත්අඩංගුවට ගැනීමට නියමිත බව ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ආරංචි මාර්ග වැඩිදුරටත් පවසයි.

# සීනි බදු අඩුකිරීමෙන් ජනතාවට නොලැබුණු සහනයෙන් යළි අයකර ගතහැකි උපරිමය සියයට 30 යි

## ඉරිදා ලංකාදීප සඳහන ගැන මුදල් රාජ්‍ය අමාත්‍යාංශය තතු පහදයි

**සීනි සඳහා පනවා තිබූ විශේෂ භාණ්ඩ බද්ද රුපියල් 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් ජනතාවට නොලැබුණ සහනය නැවත අයකරගත හැක්කේ සියයට 30ක උපරිමයකැයි මුදල් රාජ්‍ය අමාත්‍යාංශය සඳහන් කරයි.**

"සීනි බදු වංචාවේ සියලු මුදල් අයකරගත හැකියි" යනුවෙන් ඉරිද ලංකාදීප පුවත්පතේ ඊයේ (20) පළවූ ලිපිය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරමින් මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතාගේ මාධ්‍ය අංශය මේ බව සඳහන් කරයි.

රාජ්‍ය ඇමැතිවරයාගේ මාධ්‍ය අංශය කරුණු පැහැදිලි කරමින් එවා ඇති ලිපියේ මෙසේ ද සඳහන් වේ.

"දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ වාර්තාවට අනුව අදාළ ආයතනවලින් අයකරගත හැක්කේ නෛතික රාමුව අනුව සියයට 30ක උපරිමයකි. එය පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත කරන ලද ලිපියේ නිවැරැදිව සඳහන් වී ඇත. විගණකාධිපති වාර්තාව අනුව සම්පූර්ණ මුදලම අයකරගත හැකි බවක් ලිපියේ සඳහන් වුව ද විගණකාධිපති වාර්තාවේ එවැන්නක් නොමැත."





## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී

# ණයකර නිකුතුව

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී, සිය බාසල් III නියාමයන්ට අනුකූල ණයකර නිකුතුව නිවේදනය කරයි. **රුපියල් බිලියන 5 ක** මුදලක් දක්වා සිදුවන මෙම ණයකර නිකුතුව අධිදායක වුවහොත් අමතර **රුපියල් බිලියන 5 ක්** දක්වා නිකුත්කිරීමේ හැකියාව ඇත.

**නිකුත්කිරීම ආරම්භ වන දිනය: 2022 දෙසැම්බර් මස 01 වැනිදා**

| වර්ගය | කාලය | ස්ථාවර පොලී අනුපාතය (වාර්ෂික) | වාර්ෂික සඵල පොලී අනුපාතය | පොලී ගෙවීමේ වාර ගණන |
|---|---|---|---|---|
| A | වසර 5 | 28.00% | 29.96% | අර්ධ වාර්ෂික |
| B | වසර 7 | 27.00% | 28.82% | අර්ධ වාර්ෂික |
| C | වසර 10 | 22.00% | 23.21% | අර්ධ වාර්ෂික |

බාසල් III නියාමයන්ට අනුකූල - දෙවන පෙළ 2 (Tier 2), ලැයිස්තුගත, ශ්‍රේණිගත, සුරැකුම් රහිත, ද්විතීයික, නිදහස් කර ගත හැකි ශක්‍යතා නොමැති වීමකදී පරිවර්තනය කලහැකි ණයකර, 50,000,000ක්, වටිනාකම රු.100ක් බැගින්, මෙම ණයකර නිකුතුවේදී ඉදිරිපත් වෙයි. මෙම ණයකර නිකුතුව අධිදායක වූ අවස්ථාවකදී අමතර ණයකර 50,000,000ක් දක්වා නිකුත් කිරීමටද අවස්ථාව සලසා ඇත. එක අයදුමකදී, සුදුසුකම් ලත් තනිපුද්ගල ආයෝජකයන් විසින් සිදුකල යුතු අවම මිලදී ගැනීම රුපියල් මිලියන 5ක් වන අතර, අනෙකුත් සුදුසුකම්ලත් ආයෝජකයන් සඳහා රු.10,000/- ක අවම මිලදී ගැනීමේ සීමාවක් පවතී.

මෙම ණයකර, ෆිච් රේටින් ලංකා ආයතනය (Fitch Rating Lanka Limited) මගින් A(lka) සෘණාත්මක ලෙස ශ්‍රේණිගත කොට ඇත.

සංස්ථා ප්‍රකාශය සහ අයදුම් පත් www.combank.lk සහ www.cse.lk යන වෙබ් අඩවි තුලින් හා සියලුම කොළඹ කොටස් වෙළඳපොල නියෝජිත ආයතන (Trading Members/ Members) වෙතින් ලබාගත හැක.

**වැඩි විස්තර:**
**භාණ්ඩාගාර අංශය - කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී**
කොමර්ෂල් නිවස, නො. 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, තැ.පෙ. 856, කොළඹ 01.
දුරකතන: තිවංක දමුනුපොල +94 (0) 11 2 486 336, හේමාල් ජයසේකර +94 (0) 11 2 486 347, චරිත රුක්ෂාන් +94 (0) 11 2 486 356
ඊ-මේල්: treasury@combank.net

**ණයකර නිකුතුවේ කළමණාකරුවන්:**
**ආයෝජන බැංකු කටයුතු අංශය - කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී**
දුරකතන: සුශාරා විද්‍යාසාගර +94 (0) 11 2 486 491, දුමින්ද ද සිල්වා +94 (0) 11 2 486 492, මිකයිල් මුෂින් +94 (0) 11 2 486 489
ඊ-මේල්: investment_banking@combank.net

COMMERCIAL BANK

ඔබේ ජය අපේ පැතුමයි

*නිකුත් කරන ආයතනයේ ශ්‍රේණිගත කිරීම: AA-(lka) ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් සෘණාත්මක ශ්‍රේණිගත කිරීමයි

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට
වැඩිම ගාණ King
රජ වෙන්නයි යන්නේ...



## අද දවස ඔබට

**රාහු කාලය 07.33-09.03**

### මේෂ
**සාර්ථක ප්‍රතිඵල**

තමන්ගේ වැඩ කටයුතු ඉතා උනන්දුවෙන් කරන දිනයකි. කරන්නට යන හැම කටයුත්තක්ම සාර්ථකව අවසන් කළ හැකිවේ. තරමක අසනීප තත්ත්වයක් මතු කළද එය සාර්ථක නොවේ.

### වෘෂභ
**කරදර**

ඇසුරු කරන්නන් නිසා විවිධ කරදර ඇතිවේ. ව්‍යාපාර කටයුතුවල දියුණුව තරමක් දුරට පසු බැසීමක් සිදුවේ. සුදුසු වයසේ පසුවන්නන්ට විවාහ යෝජනා ඉදිරිපත් වේ. උනන්දුව උත්සාහය මත දවසේ කටයුතු සාර්ථක වේ.

### මිථුන
**සමාජ සබඳතා**

සමාජ සබඳතා වර්ධනය වීමට හේතු යෙදේ. කරගෙන යන කටයුතුවල විශේෂ දියුණුවක් ඇති වේ. අලුත් රැකියා කටයුත්තකට සම්බන්ධ වීමෙන් දියුණුව සැලසේ. සතුරු උවදුරු වළකාගත යුතු තත්ත්වයක් පවතී.

### කටක
**ස්ථාන මාරු**

කාර්මික හා ඉංජිනේරු කටයුතුවල නිරතවූවන්ට යහපත්ය. නාට්‍ය හා සංගීත වැනි කලා කටයුතුවල යෙදුනු අයට සුබදායක වේ. ස්ථාන මාරු වීම් සඳහා කටයුතු යෙදේ.

### සිංහ
**බාධක දුරුවේ**

නව නිපයුම් ආශ්‍රිත කටයුතුවල කාර්යබහුල වේ. මුදල් යොදවා කරන කටයුතුවලට සුබදායක දිනයකි. සතුරු බාධක මැඩ කටයුතු කිරීමට හැකිවේ. සන්ධ්‍යා කාලයේ කෙටි ගමන් බිමන් යෙදේ.

### කන්‍යා
**වියදම් ඉහළට**

කරන කියන කටයුතුවලින් ප්‍රතිඵල ප්‍රමාද වනු ඇත. පෞද්ගලික ගුරු සේවයේ නිරතවූවන්ට කාර්යබහුල වේ. අසල්වැසියන් හා වැඩි සබඳතා ඇති වීමට හේතු යෙදේ. විනෝදජනක කටයුතු සඳහා වියදම් ඉහළ යයි.

### තුලා
**සිත් තැවුල්**

ධනය හීන වුවත් යම් බලවත් බවකින් යුතුව කටයුතු කරයි. ඇතැම් අයට තම භාර්යාවගේ බලපෑම්වලට යටත්වීමට සිදුවේ. චිත්ත පීඩා සහිත සිදුවීම් ඇතිවේ. සේවක සේවිකාවන්ගේ අප්‍රසාදයට හේතු යෙදේ.

### වෘශ්චික
**ව්‍යාපාර දියුණුව**

සේවක පක්ෂයේ ආධාර උපකාර වැඩියෙන් ලැබේ. හවුල් ව්‍යාපාර කටයුතු වැනි දියුණුවක් ඇතිවේ. අහිමි වූ රැකියා යළි ලැබීමට ඉඩ ඇත. තම අවශ්‍යතා අසීරුවෙන් ඉටුකර ගැනීමට සිදුවන දිනයකි.

### ධනු
**ලොතරැයි වාසනා**

ප්‍රසිද්ධියක් ලැබිය හැකි දෙයට ලැදිව කටයුතු කරයි. අනුන් අභිබවා කටයුතු කිරීමට හැකියාව ලැබේ. දරුඵලලාභීන්ට සුබඵල සහිත වේ. ලොතරැයි වාසනා ආදියට ඉඩ ඇත.

### මකර
**දේපළ වාසි**

පතල් හා කැණීම් ආශ්‍රිත කටයුතුවලින් සුබඵල හිමිවේ. බලාපොරොත්තු දේපළ ලාභයක් හිමිවේ. තරගකාරී දෙයින් පහසු ජය හිමිවේ. පුණ්‍යකාමී කටයුතු සඳහා වැඩි උනන්දුවක් දක්වයි.

### කුම්භ
**පාලන බලයක්**

විශ්වාසය සහ උනන්දුව මත තම බලාපොරොත්තු පහසුවෙන් ඉටුවේ. සත්නිවේදන කටයුතු සඳහා වැඩි රුචිකත්වයක් දක්වයි. නිර්මාණකරණයෙන් වැඩි ආදයම් හිමිවේ. ස්ථාන පාලන බලයකට හිමිකම් ඇත.

### මීන
**රැකියාවේ වෙනසක්**

වැඩිහිටියන් සඳහා වැඩියෙන් උපකාර කිරීමට පෙළැඹේ. රැකියා කටයුතුවල සුබදායක වෙනසකට ඉඩ ඇත. අයහපත් කටයුතු සඳහා යොමුවන්නන්ට නීති ප්‍රශ්න බලපානු ඇත. බලාපොරොත්තු මුදලක් ඉතිරිකර ගැනීමට හැකිවේ.

**ගම්පහ - අබේසේන හේරත්**

# සුපිරි වෙළෙඳසල්වලට සුද්දෙ දැමූ එකම පවුලේ තිදෙනෙක් අත්අඩංගුවට

## සොරකම්වලට ගිය ත්‍රිරෝදයේ ඩ්‍රයිවර්ටත් මාංචු

■ බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

**පාරිභෝගික වෙස්ගෙන සංවිධානාත්මකව සුපිරි වෙළෙඳසල්වලට ඇතුළුවී භාණ්ඩ සොරා ගැනීමේ නිරත එකම පවුලේ සහෝදරියන් දෙදෙනකු සහෝදරයකු සහ තවත් කාන්තාවක අත්අඩංගුවට ගත් බව බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසය කියයි**



සොරාගන්නා ලද භාණ්ඩ පොලිස් නිලධාරීන් පරීක්ෂාවට ලක් කරමින්.

එම කල්ලිය විසින් සොරාගෙන තිබූ රුපියල් එක් ලක්ෂ පනස් දහසකට ආසන්න වටිනා මිලෙන් අධික කිරිපිටි, ටින්, කුඩ, හිසකෙස් ගල්වන ආලේප, වේදනා නාශක පෙති, ඇතුළු භාණ්ඩ රැසක් මෙන්ම සොරකම් සඳහා පිරිස ගමන්ගත් ත්‍රිරෝද රථය ද පොලිස් භාරයට ගෙන ඇත.

හැඳ සිටින සායට යටින් කලවා ප්‍රදේශයට හොඳින් තද වන සේ මසන ලද ඇඳෙන සුලු විශේෂිත කොට කලිසමක් ඇඳ පාරිභෝගිකයන් සේ සුපිරි වෙළඳ සැල්වලට ඇතුළු වන කාන්තාවන් තිදෙනා එහි තිබෙන කූඩයක් රැගෙන මිලෙන් අධික භාණ්ඩ ඒ තුළට දමාගෙන වෙළඳසැල තුළ පාළු ස්ථානයකට ගොස් එම භාණ්ඩ හැඳ සිටින විශේෂ කලිසම තුළ රුවාගෙන භාණ්ඩ සොරා ගැනීම පුරුද්දක් කර ගෙන තිබූ බව පොලිසිය කියයි.

එක් අයකු භාණ්ඩ සඟවා ගන්නා අතරේ දී අනෙක් දෙදෙනා ඔත්තු බැලීම සිදු කර ඇතැයි ද පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකරු විසින් ත්‍රිරෝදයෙන් සොර කාන්තාවන් තිදෙනා වෙළෙඳසල් කරා රැගෙන ගොස් ඇතැයි ද පොලිසිය කියයි. අත්අඩංගුවට ගත් කාන්තාවන් අතරින් වැඩිමල් සහෝදරිය විසින් මෙම කල්ලිය මෙහෙයවා ඇති අතර, සොරකම් කරන සෑම භාණ්ඩයක්ම ඇය වෙත ලබා දීම සිදු සිදුකළ යුතුව ඇතැයි ද සෙසු සැකකාරියන් ගෙන් ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇත.

එම ප්‍රධාන සැකකාරියට එරෙහිව මහධිකරණයේ මත්කුඩු චෝදනාවක් ද විභාග වන බව පොලිසිය කියයි.

මෙම සංවිධානාත්මක කල්ලිය මීට පෙරද අවස්ථා කීපයක දී පොලිස් අත්අඩංගුවට පත් තැනැත්තියන් බව පොලිසිය කියයි.

බස්නාහිර පළාත( අපරාධ භාර) නියෝජ්‍ය පොලිස්පති ප්‍රශාන්ත ජයකොඩි, බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් අබේසේකර, සහකාර පොලිස් අධිකාරීවරුන් වන රොහාන් පෙරේරා, චන්දන ගමගේ මහත්වරුන්ගේ උපදෙස් මත ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ජයන්ත පෙරේරා මහතාගේ මෙහෙයවීමෙන්, පොලිස් පරීක්ෂක හේමන්ත කුමාර, උප පොලිස් පරීක්ෂක රුක්ෂාන් බණ්ඩාර, පොලිස් සැරයන් 40248 ප්‍රසන්න, 21284 බණ්ඩාර පොලිස් කොස්තාපල්වරුන් වන 69598 අනිල්, 84762 කුමාර, 72979 චමින්ද සහ මහත්වරු පරීක්ෂණ පවත්වති. පොලිස් කොස්තාපල් 104701 සිසිල, 104645 කේශර, 45321 රණතුංග, 10748 කෞශල්‍යා, 10818 තිලකසිරි කාන්තා පොලිස් කොස්තාපල් 11287 ලක්ෂාණි යන මහත්ම මහත්මීහු පරීක්ෂණවලට සහාය වූහ.

# අයවැය සම්මතවීමටත් පෙර භාණ්ඩ හා සේවාමිල ශීඝ්‍රයෙන් වැඩිවෙලා

## - මුජිබර් රහුමාන් කියයි

■ නිමල කොඩිතුවක්කු

**අයවැය සම්මතවීමටත් පෙරම ජනතාව තවත් අසරණ කරමින් එහි යෝජනා අනුව භාණ්ඩ හා සේවා මිල ශීඝ්‍රයෙන් වැඩිවෙමින් තිබෙන බව පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා කොළඹදී පැවසීය.**

ජනතාවගෙන් බදු ගැසීම හැර ආණ්ඩුවට වෙන වැඩපිළිවළක් නැතැයිද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

කොළඹ මාකස් ප්‍රනාන්දු මාවතේ විපක්ෂනායක කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින් ඔහු තවදුරටත් මෙසේ ද කීවේය.

"ජනාධිපති මුදල් ඇමැති වශයෙන් මෙවර අයවැය පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කළා. ආණ්ඩුවක් අයවැය ඉදිරිපත් කර සම්මත වුණාට පසුව තමයි සම්ප්‍රදයක් විදියට භාණ්ඩවල මිල වැඩි වුණේ. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා අයවැය ඉදිරිපත් කර සතියක කාලයක් තුළ ශීඝ්‍ර ලෙස භාණ්ඩවල මිල ඉහළ යාමක් පෙන්නුම් කළා. අත්‍යවශ්‍යය භාණ්ඩ, පාසල් උපකරණ ඇතුළු අනෙකුත් භාණ්ඩ සියල්ලකම මිල ශීඝ්‍රයෙන් ඉහළ ගියා. ඒ වගේම අයවැයෙහි තිබෙන සමහර දේවල් ආණ්ඩුව යෝජනා කළ පමණින්ම මිල ඉහළ දමලා. මුදල් අමාත්‍යාංශය එහි තිබෙන ආයතනවලට දැනුම් දීම සහ ගැසට් නිවේදන පළ කිරීම නිසා ඒ ආකාරයට මිල ඉහළ දමලා. විශේෂයෙන්ම විදේශීය ගමන් බලපත්‍ර ශීඝ්‍ර ලෙස මිල ඉහළ දැම්මා. රටේ අර්බුදය එන්න එන්න උත්සන්න වෙනවා. මේ අර්බුදය මැඩපවත්වා ගන්න ආණ්ඩුව පැත්තෙන් අසමත් කියන එක මින් පැහැදිලියි.

අයවැය විවාදය යන අතරතුර භාණ්ඩ සේවා මිල දවස ගාණේ වැඩිවීමත් ආණ්ඩුවේ අසාර්ථකත්වයක් මනාව පැහැදිලි වෙනවා. අයවැයෙන් පස්සෙ තත්වය මීටත් වඩා බරපතළ වෙනවා කියන එක මින් තහවුරු වෙනවා.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා පිළිගන්න පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් ගුවන් තොටුපළට ගිහිල්ලා. හරිනම් රටට කරපු අපරාධයට මෙතුමා අත්අඩංගුවට ගන්න ගුවන් තොටුපළට යන්න ඕන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්. ඒක රනිල් වික්‍රමසිංහ මහත්තයා ඉන්න කන් වෙන්නෙත් නෑ කියලා අපි දන්නවා. රටට මෙහෙම අපරාධ කරලා ආර්ථිකය විනාශ කරලා දරුවන්ගේ අනාගතය විනාශ කරලා, මන්දපෝෂණය වැඩි කරලා රටේ සමස්ත ජනතාවම විශාල අර්බුදකාරී තැනකට තල්ලු කරන්න එහි නායකත්වය ගෙන කටයුතු කරපු කෙනා රටට එනකොට මල් මාලා අරන් ගිහින් පිළිගන්න ගිය මිනිස්සුන්ගෙත් මොළේ පරීක්ෂා කරන්න ඕන කියලා මම කියනවා.

# එකම පොලිසියේ වසර තුනකට වඩා සිටි ඕ.අයි.සීලාට මාරුවක්

■ අජන්ත කුමාර අගලකඩ

**පොලිස් ස්ථානාධිපතිවරුන් ලෙස එකම පොලිස් ස්ථානයක වසර තුනකට වැඩි කාලයක් එක දිගට කටයුතු කළ ස්ථානාධිපතිවරුන් මාරු කිරීමට තීරණය කර ඇතැයි මහජන ආරක්ෂක ඇමැති ටිරාන් අලස් මහතා පැවසීය.**

පොලිස් ස්ථානාධිපතිවරුන් පත්කිරීම සඳහා අයැදුම්පත් කැඳ වූ බවත්, ඒ සඳහා අයැදුම්පත් 1,300ක් පමණ ලැබුණු බවත්, ඔහු සඳහන් කළේය.

අයැදුම්පත් ඉදිරිපත් කළ පොලිස් නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර, 1090 දෙනකු දැනටමත් තෝරාගෙන ඇති බවත්, ඔවුන් ඉතා ළඟදීම පොලිස් ස්ථානාධිපතිවරුන් ලෙස පත් කරන බවත් හෙතෙම සඳහන් කළේය.

දේශපාලන බලපෑම් මත හෝ හිතවත්කම් මත ස්ථානාධිපතිවරුන් පත් නොකරන බව කී ඇමැතිවරයා සුදුසුකම් මත ඔවුන් නිවැරැදි ස්ථානවලට පත් කිරීමට කටයුතු කරගෙන යන බව ද සඳහන් කළේය.

# දකුණේ අධ්‍යාපන ලොකු පුටුවලට පරිපාලන නිලධාරීන් රිංගවනවාට විරෝධය

■ රංජන් කස්තුරි

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරීන් පත්කිරීමට එරෙහිව අද (21) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඉදිරිපිට නිහඬ විරෝධතාවක් පවත්වන බව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා වෘත්තීය සංගමය සඳහන් කරයි.**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දෙදෙනකු සිටියදී එම තනතුරට රාජ්‍ය පරිපාලන සේවයේ තවත් නිලධාරියකු පත්කර රජයේ මුදල් නිස්කාරණේ වැයකරන බව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා වෘත්තීය සංගමයේ ලේකම් සම්පත් දේශප්‍රිය මහතා පැවසීය.




# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට නව පනතක් නුදුරේම මැතිසබයට

## - ඇමැති විජයදාස කියයි

■ සුජිත් හේවාජුලිගේ

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට නව පනතක් ඉදිරි මාස කිහිපය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා පැවසීය.**

විශේෂඥ කමිටුවක් පත්කර පනත් කෙටුම්පත සකස් කරගෙන යන බවද ඔහු සඳහන් කළේය.

එම පනත් කෙටුම්පත ගැන කිසිවකුටත් කන ගාටුවීමට හේතුවක් නැතැයි පැවසූ අධිකරණ අමාත්‍යවරයා නව පනතෙන් කරන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුළුමනින්ම ඉවත් කර ජාතික ආරක්ෂාව අවදානමකට ලක් කරන එක නොවේ යැයි ද ප්‍රකාශ කළේය.

අලුතෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පතට ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය සියලු ප්‍රතිපාදන ඇතුළත් කෙරෙන බව ද හෙතෙම සඳහන් කළේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දේශපාලන පළිගැනීම් සඳහා කිසිවිටකත් යොදා ගෙන නැතැයි පැවසූ, රාජපක්ෂ මහතා 2015 සිට පාස්කු ද ප්‍රහාරය තෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක නොකළ බව ද ප්‍රකාශ කළේය.

ඒ පනත යටතේ මෙතෙක් අත්අඩංගුවට ගෙන ඇත්තේ අරගලයේ දෙදෙනකු පමණක් බවද ඔහු කීවේය.

එම කාරණයත් දැන් නිරාකරණය කර ඇති බවත් එම දෙදෙනාට ද සාමාන්‍ය නීතිය යටතේ නීතිය ක්‍රියාත්මක කරන බවත් අධිකරණ අමාත්‍යවරයා පැවසීය.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තුලනාත්මක නීතියක් සකස් කරන බව විජයදස රාජපක්ෂ මහතා පැවසීය.

# හොර පාස්පෝට්වලින් ඉතාලි පනින්න හැදූ 8ක් කටාර්හිදී අල්ලා පිටුවහල් කර එවලා

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍ර උපයෝගී කරගනිමින් ඉතාලියට යෑමට උත්සාහ කළ බව කියන පුද්ගලයන් අට දෙනකු කටාර් ගුවන් තොටුපළේදී අල්ලාගෙන මෙරටට පිටුවහල් කිරීමෙන් පසුව කටුනායක ගුවන් තොටුපොළේදී පෙරේදා (19) අත්අඩංගුවට ගත් බව රහස් පොලිසිය කියයි.**

මෙසේ සැකපිට අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ වැල්ලම්පිටිය දන්කොටුව වෙන්නප්පුව ලුණුවිල සහ තොඩුවාව යන ප්‍රදේශවල පදිංචි අවුරුදු 21, 23, 26, 27, 41, 43, 51 සහ 58 යන වයස්වල පසුවන අයවෙති.

ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍ර උපයෝගී කරගනිමින් මොවුන් අටදෙනා කටාර් රාජ්‍යය හරහා ඉතාලියට යෑමට උත්සාහ කිරීමේදී එරට ගුවන්තොටුපළේ බලධාරීන් විසින් අල්ලාගෙන මෙරටට පිටුවහල් කරන ලදැයි රහස් පොලිසිය පවසයි.

මෙම සැකකරුවන් අටදෙනා අත්අඩගුවට ගනු ලැබුවේ රහස් පොලිසියේ කටුනායක ගුවන්තොටුපොළ ඒකකයේ නිලධාරීන් විසිනි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අටදෙනා මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට රහස් පොලිසිය කටයුතු යොදගෙන යයි.

## ජන හඬ

# පාසල විලාසිතා සලක් කරන්න එපා

**■ පාසල් ගුරුවරයා යනු සිසු දරුවන්ගේ අනාගතය සකසන නියමුවාය. එසේ නියමුවන්ව සිටින ඔවුන් ඉතාමත් ආදර්ශවත්ව හැසිරිය යුතුය. පාසල් ගුරුවරියන් අඳින සාරිය ඔසරිය පාසලට උචිතම ඇඳුමකි. එම ඇඳුමින් ගුරුවරියකගේ හැදියාව, ශීලාචාරබව මනාව පිළිබිඹුවේ. බස්රථයක ගියත් ගුරුවරිය හඳුනාගත හැකිය. ඒ ඇයගේ සංවර බවත් ඇඳුමින් දිස්වන වියත් බවත්ය.**

සමහරු කියන්නේ පවතින ආර්ථික අපහසුතාව මැද ඔවුනට කැමති ඇඳුමකින් සැරසී පාසලට පැමිණීමට ඉඩ දිය යුතු බවකි. එසේ වුවහොත් පාසල් ගුරුවරියන් කලිසමකින් හා ඊට උචිත උඩ ඇඳුමකින් හෝ ගවුමකින් සැරසී පාසලට එන්නට පුළුවනි. එසේ වූවිට සිදුවන්නේ සිසුන් තුළින් මේ ගුරුතුමියය යන හැඟීම ගිලිහෙන්නට වීමයි. එවිට ගුරුවරිය කෙරෙහි තිබූ භක්තිය සිසුන්ගෙන් හීනවන්නට පටන් ගනී. එසේ වන්නේ ගුරුතුමිය විලාසිතාවන්ට හසුවී ඉදීම නිසාය. එසේ නොව ගුරුවරිය මෙතෙක් හැදි සාරිය ඔසරිය පමණක් හැඳ පාසලට ඒමට ඉඩ සැළැස්විය යුතුය. එසේ නොවුණහොත් පාසල විලාසිතා සලක් වීමනම් නවත්වන්නට බැරිය.

රජයේ සේවකයන්ට තමන්ට කැමති ඇඳුමකින් රැකියාවට පැමිණීමට ලබාදී ඇති අවස්ථාව ගුරු මහත්මීන්ටත් ලබා දිය යුතු බව සමහරු කීවත් එවැනි අවස්ථාවක් අමාත්‍යාංශ මට්ටමින් ගුරුමහත්මීන්ටත් ලබාදුනහොත් ඒ "සමහරුම" මෙය දඩමීමා කරගෙන අහිංසක ගුරුවරිය ප්‍රාණ ඇපකරුවන් වශයෙන් ගෙන උද්ඝෝෂණ කරන්නට පෙළඹුණහොත් එය පුදුමයට කාරණායක් ද නොවේ. ඒ ඔවුන්ගේ "විලාසිතාව" නිසාය.

**එම්.ඩබ්ලිව්. ජයරත්න,**

**තියඩෝර්වත්ත.**

# ගණේවත්ත පහයි කාල ගිය විදියට යන්න දෙන්න

**කොළඹ කොටුව ගනේවත්ත දක්වා පස්වරු 5.15 ට ධාවනය වන ශීඝ්‍රගාමී කාර්යාල දුම්රිය කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාවට පිටත් වුව ද ගමනාන්තය දක්වා යාමේ දී බොහෝ වේලාවක් ප්‍රමාද වේ. එයට හේතුව දින කිහිපයක සිට මෙම දුම්රිය ගනේමුල්ල හා ගම්පහ යන දුම්රිය ස්ථානවල නතර කිරීමයි. මෙම දුම්රියෙහි ගමන් ගන්නා මගීහු (වේයන්ගොඩ සිට ගනේවත්ත දක්වා) ඉතා දුර බැහැර ප්‍රදේශ කරා ගමන් ගන්නා මගීහු වෙති. මෙම දුම්රිය මෙසේ ගනේමුල්ල හා ගම්පහ යන දුම්රිය ස්ථානවල නතර කර යාමෙන් සිදුවන ප්‍රමාදය වේයන්ගොඩ සිට ගනේවත්ත දක්වා ගමන් ගන්නා මගීන් හට ඉතා විශාල පාඩුවකි. මන්ද මෙම දුම්රියේ මගීන් වැඩිදෙනා දුම්රියෙන් බැස බොහෝ දුර බැහැරට ගමන් ගන්නා අය බැවිනි.**

මෙම දුම්රිය ප.ව. 6.00 ට වේයන්ගොඩ කරා ළඟා වීමට නියමිත වුවද පසුගිය දිනවල වේයන්ගොඩට පැමිණෙන විට පස්වරු 6.30 පමණ වේ. මේ ප්‍රමාදය හේතුවෙන් දුර බැහැර ප්‍රදේශ කරා ගමන් ගන්නා බස්රථ බොහොමයක් ඒ වන විට සිය දෛනික අවසන් ගමන් වාරය ආරම්භ කොට ඇති හෙයින් මගීන් මහත් හිරිහැර පීඩාවලට පත්වීම මේ දිනවල සුලබව දක්නට ලැබේ. සිය ගම්බිම් කරා යාමට කිලෝමීටර් 30- 40ක් ගමන් කරන මගීන් බොහෝ පිරිසකි.

ගනේමුල්ල ගම්පහ දක්වා ගමන් කරන මගීන් හට ප.ව. 4.40 පොල්ගහවෙල ශීඝ්‍රගාමී, 4.50 රඹුක්කන අර්ධ ශීඝ්‍රගාමී, 5.20 පොල්ගහවෙල අර්ධ ශීඝ්‍රගාමී 5.40 පොල්ගහවෙල මන්දගාමී, 5.45 මාතර මහනුවර ශීඝ්‍රගාමී යන දුම්රියයන් කිහිපයක් ගම්පහ ගනේමුල්ල දුම්රිය ස්ථානයන්හි නවත්වනු ලබන අතර මේ දිනවල මහව දුම්රිය ද බොහෝ වේලාවක් ප්‍රමාද වන හෙයින් කුරුණෑගලින් පසුව ගමන් ගන්නා මගීන් හට ගමන් කිරීමට ඇති එකම දුම්රිය කොළඹ කොටුව ගනේවත්ත දුම්රියයි. එබැවින් පස්වරු 5.15 දුම්රිය කොළඹ කොටුව ගනේවත්ත දුම්රිය සුපුරුදු පරිදි ධාවනය කර දෙන මෙන් ඉතා ගෞරවයෙන් හා කාරුණිකව ඉල්ලා සිටිමු.

**ප්‍රියන්ත කළුපහන,** පොල්ගහවෙල.

# ජල-විදුලි බිල්වලට තැපැල්හලෙනුත් බද්දක්

**දිනෙන් දින හිතුමතේ වැඩි වන බඩු මිලට අමතරව ජලය, විදුලිය හා දුරකථන සේවා ගාස්තු ද ඉහළ දැමීම අද රටේ හැම තැනෙකින්ම නැගෙන මැසිවිල්ලය.**

ඒ මදිවාට තැපැල් කන්තෝරුවලින් ජල හා විදුලිය බිල්පත් ගෙවීමේදී අමතර රු. 20.00 බැගින් අය කිරීමට පටන් ගෙන ඇත. නොදුරේදීම ටැලිපෝන් බිල්පත්වලට ද මෙසේ වීමට ඉඩ ඇත.

අමතර මුදලින් වැළකීම සඳහා ඒ ඒ ආයතනවලට බිල්පත් ගෙවීමට සිදුවුවහොත් පාරිභෝගිකයාට පමණක් නොව ඒ ආයතනවලට ද මහත් අපහසුවකි.

එබැවින් අමතර ගාස්තු අය කිරීමකින් තොරව බිල්පත් ගෙවීමට ස්ථාන ඇති කිරීම ඒ ඒ ආයතනවල වගකීමකි.

එමෙන්ම ජල හා විදුලිබල මණ්ඩලය මෙන්ම තැපැල් දෙපාර්තමේන්තුවද හුදු වෙළෙඳ ව්‍යාපාර බවට පත් නොකොට මහජන සේවා සපයන ආයතන ලෙසින් ද පවත්වා ගෙන යාම රජයේ වගකීමකි.

**ම.දෙ. මධුරසිරි**

**බටවත්ත ගෝවින්න.**

# දෙබරවැව ජාතික පාසලේ ඇති බැම්ම අබලන්

**තිස්සමහාරාම, දෙබරවැව ජාතික පාසලේ වටා ඇති තාප්පයේ තිස්ස - පන්නෙගමුව මහ මාර්ගයට මුණලා ඇති පැත්ත බලවත් සේ අනතුරුදායක තත්තවයක පවතින හෙයින් ඉක්මන් ප්‍රතිසංස්කරණයක් අවශ්‍යව පවතී.**

මහා මාර්ගයේ යනෙන සිසු දූ දරුවන්ගේ මෙන්ම වැඩිහිටි කාගෙත් පාහේ අවධානයට ලක්වන වටිනා අදහස් සහිත කවි සටහන් සහිත පුවරු ද මැකී ගැලවී තැන් තැන්වලින් ගොස් ඇතිබැවින් යළි තාප්පය සවිමත්ව සකසා සටහන් පුවරුද යළි සැකසීම සුදුසු යැයි හැඟේ.

ගුරු භවතුන්ගේත් පාසල් සංවර්ධන කමිටුවේ ඉක්මන් සැලකිල්ල යොමු කර ආණ්ඩුවට ද දන්වා මුදල් ප්‍රතිපාදන ලබාගෙන ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීම වටින්නේ යැයි ලියා දන්වා සිටීමට කැමැත්තෙමි.

**දිගාමඩුල්ල එස්. මහගෙදර**

# පොලිස් පරීක්ෂක නෝනාගේ දොළොස් හැවිරිදි දුවට අතවර කළැයි අනියම් සැමියා අල්ලන්න සොයයි

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය සහ ඉන්දිකා රාමනායක

**ගම්පහ දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානයක ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති තනතුර දරන පොලිස් පරීක්ෂකවරියකගේ 12 හැවිරිදි දැරියකට ලිංගික අපයෝජන කරන ලදැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් එම පොලිස් පරීක්ෂකවරියගේ අනියම් සැමියා බව කියන පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණයක් ආරම්භ කර ඇතැයි ප්‍රදේශයේ උසස් පොලිස් නිලධාරියෙක් 'ලංකාදීප' යට පැවැසීය.**

ලිංගික අපයෝජනයකට ලක් වූ බව කියන 12 හැවිරිදි දැරිය දුම්මලසූරිය පොලිසියේ භාරයට ගෙන වෛද්‍ය පරීක්ෂණයක් සඳහා රෝහල්ගත කරන ලදැයි පොලිසිය සඳහන් කරයි.

දැරියගේ පියා බන්ධනාගාර නිලධාරියකු වන අතර ඔහු හෙරොයින් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම සම්බන්ධයෙන් පුත්තලම ප්‍රදේශයේදී 2019 වසරේදී සැකපිට අත්අඩංගුවට ගෙන මේ වනවිටත් රිමාන්ඩ් භාරයේ පසුවන බව පොලිසිය පවසයි.

දැරියගේ පියා රිමාන්ඩ් භාරයට පත්වීමෙන් පසු පොලිස් පරීක්ෂකවරිය වෙනත් පුද්ගලයකු සමග අනියම් සම්බන්ධතාවක් පවත්වාගෙන මිනුවන්ගොඩ ප්‍රදේශයේ නිවසක පදිංචිව සිට ඇති බවට තොරතුරු හෙළිවී ඇතැයි එම උසස් පොලිස් නිලධාරියා කීය.

සැකකරු එම නිවසේදී දැරිය කිහිප අවස්ථාවකදීම ලිංගික අපයෝජනයට ලක්කර ඇති බවද පොලිස් ආරංචි මාර්ග පවසයි.

දැරිය මිත්තණියගේ නිවසේ සිටියදී පොලිස් 119 ඇමතුම් අංශයට ලැබුණු තොරතුරක් මත, දුම්මලසූරිය පොලිසියේ නිලධාරීන් කණ්ඩායමක් දැරිය පදිංචිව සිටින නිවස සොයාගෙන ගොස්, ඇය පොලිස් භාරයට ගෙන ප්‍රකාශයක් ලබාගෙන ඇත.

අත්අඩංගුවට ගැනීමට සොයන පුද්ගලයාගෙන් දැරියට සිදු වන ලිංගික අතවර ගැන ඇය මවට පවසා ඇතත්, පොලිස් පරීක්ෂක මව ඒවා ගණන් ගෙන නොමැති බවත් ඇය පසුව දැරිය දුම්මලසූරිය ප්‍රදේශයේ පදිංචිව සිටින සිය සැමියාගේ මවට බාරදී ඇති බවත් පොලිසිය සඳහන් කරයි.

පොලිස් පරීක්ෂකවරිය හා ඇයගේ අනියම් සැමියා බව කියන පුද්ගලයා මෙම බාලවයස්කාර දැරිය ලවා දැලිවලන්, ඉඳුල් පිඟන් ආදිය සෝදා ගැනීම ඇතුළු වැඩපොළ සිදු කරගෙන ඇතැයි ද පොලිසිය කියයි.

බාලවයස්කාර දැරිය පොලිසියට ප්‍රකාශයක් දෙමින් මෙම තොරතුරු හෙළිකර සිටියේ යැයිද පොලිසිය සඳහන් කරයි.

පොලිස් පරීක්ෂකවරියක වන මව, දැලි කුණු ගෑවෙනවා යැයි කියා වළං සෝදන්නේ හෝ ඉඳුල් පිඟන් සෝදන්නේ නැති බව දැරිය පොලිසිය හමුවේ ප්‍රකාශ කර ඇති බව ද පොලිස් ආරංචි මාර්ගවලින් දැන ගැනීමට ඇත.

දැරිය අනියම් සැමියා සමග කතාබහ කරන්නේ නැති බැවින්, පොලිස් පරීක්ෂවරිය මෙම දැරියට නිතර බැණ වැදී ඇති බවද පොලිසිය සඳහන් කරයි.

දැරියට සිදු වූ බව කියන ලිංගික අතවර හා වෙනත් අඩන්තේට්ටම් ගැන සවිස්තර ප්‍රකාශයක් සටහන් කරගත් බව ද පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි. දුම්මලසූරිය පොලිසිය මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

දැරිය ඇයගේ මව භාරයේ සිටියදී ලිංගික අපයෝජනවලට ලක් වී ඇති බව ද පොලිසිය පවසයි.


## ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය

### වෙළෙඳ ලකුණ පිළිබඳව අවවාදාත්මක දැනුම්දීමයි

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ප්‍රතිපාදන අනුව නිසි පරිදි ලියාපදිංචි කරන ලද පහත විස්තර කරනු ලබන වෙළෙඳ ලකුණු වල නීත්‍යනුකූල අයිතිකරු මොරටුව, රාවතාවත්ත පාරේ, අංක 98 දරන ප්‍රධාන කාර්යාලය පිහිටි ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය වන බව මහජනතාව වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

සර්වෝදය SARVODAYA

ඉහත සඳහන් වෙළෙඳ ලකුණු 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 104 (2) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව සුප්‍රසිද්ධ ලකුණු වේ.

ඉහත සඳහන් වෙළෙඳ ලකුණු ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයට ඉතා වැදගත් වන බැවින් 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ ප්‍රතිපාදන උල්ලංඝණය කරන ඕනෑම සමාගමකට, සමිතියකට, පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට විරුද්ධව නීතිමය පියවර ගැනීමට ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයට නීත්‍යනුකූල අයිතිය ඇති බව විධායක සභාවේ තීරණය අනුව මහජනතාව වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

නීතිඥ එස්. ගුණරත්න
ගරු ප්‍රධාන ලේකම්
ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය
අංක 98, රාවතාවත්ත පාර,
මොරටුව



විදේශ මුදල් හුවමාරුව
OSALAKA SENKADA
නො.466. යූනියන් පෙදෙස, කොළඹ-02.
0777 135 231 / 0112 672 085
0766 592 900



උකස් රත්තරං
උකසට තබා
සින්නවීමට යන රන් භාණ්ඩ
අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව
පවුම-236,000/-
072 0 489812



අලියා / මැස්කන්ස් ලකුණ සිමෙන්ති , OPC සිමෙන්ති SLS 107
අප 1939 සිට ගුණාත්මකභාවයෙන් හා ප්‍රමිතියෙන් ගොඩනැගුණෙමු




ESTD 1939
මැස්කන්ස් පුද්ගලික සමාගම
නො. 175, ශ්‍රී සුමනතිස්ස මාවත, කොළඹ 12
ටෙලි: +94 11 2325561-3 / Hot Line : 076-6733744, ෆැක්ස් +94 11 2449537, ඊ මේල්: mascons@eureka.lk
www.mascons.com Like Mascons



LOLC FINANCE

## වාහන විකිණීමක්

### අම්පාර — LOLC ඔටෝ මාර්ට්, නො. 223, නුවර පාර

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 173CC | 2010 | EP | YA | XXXX |

සමන්ත - 0635780880/881

### බදුල්ල — LOLC වාහන අංගනය, නො. 161A, කැප්පෙටිපොල පාර

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 198CC | 2011 | UP | YA | XXXX |
| බජාජ් | 198CC | 2012 | UP | YY | XXXX |
| පියාජියෝ APE | 395CC | 2011 | UP | YO | XXXX |

ලහිරු - 0554549948

### මහනුවර — නො. 290, D.S. සේනානායක මාවත

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 173CC | 2009 | CP | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QW | XXXX |
| බජාජ් | 200CC | 2011 | CP | YF | XXXX |
| බජාජ් | 198CC | 2011 | CP | YJ | XXXX |
| බජාජ් | 198CC | 2011 | CP | YU | XXXX |

නිමේෂ් - 0768592509

### කුරුණෑගල — LOLC වාහන අංගනය, නො. 472 F, මලව

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 198CC | 2012 | SG | AAC | XXXX |
| බජාජ් | 173CC | 2010 | SG | YD | XXXX |

කසුන් - 0762141246

### මතුගම — LOLC වාහන අංගනය, මහජන බැංකුව අසල, විජය මාවත

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 145CC | 2006 | SP | QE | XXXX |

විහඟ - 0774405024

### දඹුල්ල — LOLC වාහන අංගනය, ඇතාබැඳිවැව පාර, තලකිරියාගම

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 145CC | 2006 | CP | QH | XXXX |
| බජාජ් | 198CC | 2011 | NW | YJ | XXXX |

චමින්ද - 0665118181

### අනුරාධපුර — නො.04, 1 වන පටුමග, අභය පෙදෙස

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර් | | | | | |
| නිසාන් FB14 | 1490CC | 1994 | | 300 | XXXX |
| ලොරි | | | | | |
| ඉසුසු NKR55L | 2771CC | 1990 | | 42 | XXXX |

රොහාන් - 0773743431

### වව්නියාව — LOLC වාහන අංගනය, නො.363, මන්නාරම පාර, වෙප්පන්කුලම්

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 173CC | 2007 | NP | QL | XXXX |

ධනංජේයන් - 0772943362

### ගොතටුව — නො. 42/5, ගොතටුව ගම්සභා පාර, ගොතටුව

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 198CC | 2010 | WP | AAA | XXXX |
| බජාජ් | 198CC | 2010 | WP | AAD | XXXX |
| බජාජ් | 198CC | 2013 | WP | AAK | XXXX |
| බජාජ් | 198CC | 2014 | WP | AAQ | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QA | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QA | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QC | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QD | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QD | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QD | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QE | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QE | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QI | XXXX |
| බජාජ් | 173CC | 2007 | WP | QL | XXXX |
| බජාජ් | 173CC | 2008 | WP | QQ | XXXX |
| බජාජ් | 173CC | 2009 | CP | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QV | XXXX |
| බජාජ් | 173CC | 2009 | SG | QW | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | QZ | XXXX |
| බජාජ් | 198CC | 2010 | WP | YI | XXXX |
| බජාජ් | 200CC | 2011 | WP | YO | XXXX |
| පියාජියෝ | 395CC | 2011 | WP | YU | XXXX |

මහේෂ් - 0773493535

### වැල්ලම්පිටිය — නො.98 J/1, අවිස්සාවේල්ල පාර,මහබුත්ගමුව.

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍රීරෝද රථ | | | | | |
| බජාජ් | 145CC | 2002 | WP | GP | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HP | XXXX |
| බජාජ් | 150CC | 2003 | WP | HQ | XXXX |
| බජාජ් | 150CC | 2004 | WP | JF | XXXX |
| බජාජ් | 173CC | 2004 | WP | JF | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | JQ | XXXX |
| බජාජ් | 150CC | 2004 | WP | JY | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QA | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QB | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QB | XXXX |
| බජාජ් | 145CC | 2005 | WP | QC | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QF | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QG | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 145CC | 2006 | WP | QH | XXXX |
| බජාජ් | 173CC | 2008 | WP | QJ | XXXX |
| බජාජ් | 173CC | 2008 | WP | QO | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QT | XXXX |
| බජාජ් | 173CC | 2009 | WP | QW | XXXX |
| බජාජ් | 173CC | 2010 | WP | YD | XXXX |
| බජාජ් | 198CC | 2011 | SG | YM | XXXX |
| බජාජ් | 198CC | 2011 | SG | YS | XXXX |
| බජාජ් | 198CC | 2011 | WP | YT | XXXX |
| පියාජියෝ | 395CC | 2011 | WP | YP | XXXX |

චමත් - 0773199029

ටෙන්ඩර් කිරීම සඳහා වෙන්කර ඇති ඕනෑම වාහනයක් දැන්වීමකින් තොරව ඉවත් කිරීමේ අයිතිය අප සමාගම සතුයි.
ටෙන්ඩර් පත් රාජගිරිය ප්‍රධාන කාර්යාලයෙන් සහ ඉහත ලිපිනයන්ට අදාල ශාඛා වලින් ලබාගත හැක.
ටෙන්ඩර් භාර ගැනීම 2022 නොවැම්බර් මස 24 වන දින ප.ව. 12.30 න් අවසන් වේ.

LOLC ෆිනෑන්ස් පීඑල්සී
අංක: 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.



මෙදා සැරේ
නත්තල් සීයාගේ තෑගි කරත්තය
NDB බැංකුවේ...

හෝ! හෝ! හෝ!

මේ පාර නත්තලට NDB බැංකුවේ ශිල්ප ළමා ඉතුරුම් ගිණුමක
මුදල් තැන්පත් කරන පොඩිත්තන්ට අත පිරෙන්න තෑගියි
හිත පිරෙන්න සතුටයි නත්තල් සීයාගෙන්

NDB ශිල්ප ළමා ඉතුරුම් ගිණුමක රු.50,000ක්
ඉතිරි කරන පොඩිත්තන්ට තෝරාගන්නට තෑගි

ලස්සන බෝනික්කෙක් | Xylophone එකක් | ට්‍රක් එකක් | දොස්තර සෙල්ලම් කට්ටලයක් | ඉවුම් පිහුම් කට්ටලයක් | බිල්ඩින් බ්ලොක්ස් | බැඩ්මින්ටන් රැකට් | Paper Quilling සෙට් එකක් | Shot Champion | සෙල්ලම් වයලින් එකක් | Croco Launcher | Pet Care සෙට් එකක් | බාස්කට් බෝල් සෙට් එකක් | Hot wheels කාර් සෙට් එකක් | ලෙගෝ සෙට් එකක්

NDB ශිල්ප ළමා ඉතුරුම් ගිණුමක රු.100,000ක්
ඉතිරි කරන පොඩිත්තන්ට තෝරාගන්නට තෑගි

Udemy ඔන්ලයින් ඉගෙනුම් කට්ටලයක් | සෙල්ලම් Princess Castle එකක් | කී බෝර්ඩ් එකක් | Pictionary සෙට් එකක් | ස්ක්‍රැබල් සෙට් එකක්

QR කේතය
හරහා පොඩිත්තෝ ආසම
තෑගි පිළිබඳව
තවත් විස්තර දැනගන්න




011 744 8888 www.ndbbank.com

NDB බැංකුව
අනාගත බැංකුකරණයේ පෙරගමන්කරු

# වියපත් සම පැහැපත් කරන කාබන්පීල් ප්‍රතිකාර



**මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රිය සමයි. ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රිය හා බාහිර පරිසරය වෙන්වන්නේ මිනිස් සමෙනි. එබැවින් බාහිර පරිසරයෙන් ඇතිවන නොයෙකුත් අහිතකර බලපෑම් වලට, උදා. දැඩි හිරු කිරණ, නොයෙකුත් විකිරණ, දූෂිත වාත අංශු, මුලින්ම ප්‍රතිරෝධය දක්වන්නේ සමෙහි බාහිර කොටසයි. මෙම නිසා ශරීරයේ වියපත් වීම පළමුවෙන්ම බාහිරට පිළිබිඹු වන්නේ සමෙනි. සම රැළි වැටීම, අවපැහැ වීම, දුර්වර්ණ වීම, ලප කැළැල් ඇතිවීම සම වියපත් වීමේ ලක්ෂණයි. අප බොහෝ දෙනකුට ඇති ගැටලුව වන්නේ මෙසේ අකලට සම වයස්ගතවීම නිසා ඇතිවන වෙනස්වීම් නැවත ප්‍රතිස්ථාපනය කරගන්නේ කෙසේද යන්නයි. විශේෂයෙන්ම නවීන තාක්ෂණයේ දියුණුවත් සමග ලේසර් වැනි උපකරණ මගින් වයස්ගත වූ සමට නැවත තරුණ බවක් ලබා දීමට හැකියාව ලැබී ඇත.**



වෛද්‍ය
**හර්ෂ ජයකොඩි**

වයස්ගත වූ සමට අධෝරක්ත කිරණ තරංග පරාසයට අයත් යැග් ලේසර් උපකරණයක් මගින් කරනු ලබන කාර්බන් පීලින්ග් නොහොත් බ්ලැක් ඩොල් ප්‍රතිකර්මය මගින් නැවතත් තරුණ පෙනුමක් ලබාදිය හැකිය. එබැවින් ලෝකයේ බොහෝ රටවල මෙම ප්‍රතිකාර ක්‍රමය සමෙහි පැහැපත් බව වැඩි කර ගැනීම සඳහා වඩාත් පහසු ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවිත කරනු ලබයි. කාබන් පීල් ලේසර් ප්‍රතිකාරය අවසානයේ සම ඉතාම සුමුදු මෙන්ම මටසිලුටු ස්වභාවයක් ලබාදෙයි. මෙමගින් සමෙහි ඇති කොලජන් ප්‍රෝටීනය අලුතින් නිපදවීමටත්, අලුත්වැඩියාවටත් දායකත්වයක් දක්වයි. මීට අමතරව කාබන් පීල් ප්‍රතිකාරයේ ඇති අනෙක් වාසියක් වන්නේ සමෙහි ඇති අතිරික්ත තෙල් ස්වභාවය ඉවත් කිරීමයි. විශේෂයෙන්ම කුරුලෑ හා කැළැල් ඇති සමහට කාබන් පීල් ප්‍රතිකාර ක්‍රමය ඉතා වැදගත්ය.

මෙම ප්‍රතිකාර ක්‍රමයේ දී පළමුවෙන්ම සමට ගැළපෙන ක්ලේන්සරයක් භාවිතයෙන් සම නිවැරදිව පිරිසුදු කරනු ලැබේ. ඉන්පසුව තුනී කාර්බන් ලේයරයක් සම මත අලේප කර විනාඩි 15 - 20 ක කාලයක් තබනු ලැබේ. ඉන්පසුව ශරීරයේ අදාල කොටස හා සමෙහි ස්වභාවය අනුව යැග් ලේසරයේ සැකසීම් සිදුකොට ලේසර් කිරණ මගින් කාබන් අංශු සම මත දැවීමකට ලක්කරනු ලබයි. මෙසේ සම මත ඇති තුනී කාර්බන් අංශු දැවී යාමේ දී සමෙහි ඇති අහිතකර ටොක්සීන් හා හානිකර සංඝටක ද රික්තකයක් ලෙස චූෂනය වී ඉවත්වේ. මෙම ප්‍රතිකාරය මුහුණ වගේම බෙල්ල, පපුව, පිට, අත් හා කකුල් වලටත් භාවිත කිරීමට පුළුවන. උපරිම ප්‍රතිඵල ළඟාකරගනීම සඳහා කාබන් පීල් ප්‍රතිකාරය කිහිපවරක් කිරීම අවශ්‍යය. විශේෂයෙන්ම සති 3-4 කට වරක් මාස 4 හෝ 5 ක් ප්‍රතිකාර කිරීමෙන් මගින් ඔබට අවශ්‍ය ආකාරයට සම සකසා ගැනීමට හැකියාව ලැබේ. මෙම ප්‍රතිකාරය ඉතා සරල මෙන්ම කුඩා කාලයක දී කළ හැකි වුවද, රෝගාවාසය වෛද්‍ය ක්ෂේත්‍රයේ පළපුරුදු වෛද්‍යවරයකු අතින් සිදුකර ගැනීම අතුරු අබාධ අවම කරගැනීමටත්, උපරිම ප්‍රතිඵල ළඟාකරගැනීමටත් වැදගත් වේ.

# අනතුරුවලින් දරුවන් රැක ගනිමු

**මේ ගෙවීයන සමය දරුවන් ඇහේ තබාගෙන හැදිය යුතු රැකිය යුතු කාලයකි. මන්ද හදිසි අනතුරු ගතහොත් ඒවා බොහොමයකටම දරුවන් ගොදුරුව සිටින නිසාය. මවුපිය ආදරය, රැකවරණය මත දරුවාගේ ආරක්ෂාව සුරක්ෂිතය. ඒත් යම් දරුවකු ඉන් මිදුණහොත් අනතුරකට මුහුණ පෑමට ඇති හැකියාව වැඩිය.**



■ කොළඹ ජාතික රෝහලේ පුහුණු කිරීමේ හෙද නිලධාරිනී
**පුෂ්පා රම්‍යානි සොයිසා**

දරුවකුට තමන් ජීවත් වන වටපිටාව, සමාජය ගැන තවම නිසි අවබෝධයක් නොමැත. ඒත් මවුපිය මඟපෙන්වීම යටතේ ඔවුහු එය දැන ගනිති. එතෙක් දරුවන්ට සවිය, රැකවරණය නිබඳවම ලබා දිය යුත්තෙමු.

දරුවාගේ ආරක්ෂාව වන තැන් කිහිපයක්ම නාගරික සමාජයේදී බහුලව දැකිය හැකිය. ඇතැම් මවුපියෝ තම දරුවා වාහනයේ තනිවම තබා තමන්ගේ අනෙකුත් අවශ්‍යතා සඳහා පිටත්ව යති. තම පෞද්ගලික රථය වුවත් එහි දරුවා හුදෙකලා වීමම ජීවිතයට අනතුරකි. මෙසේ තනිවූ දරුවන් ස්වසන අපහසුතා මතු වී මිය යන අවස්ථා වාර්තා වී ඇත. තවද මෙවැනි අවස්ථා ළමයින් හොරකම් කරනා ජාවාරම්කරුවන්ට පෙරමං තනා දීමකි. එබැවින් දරුවන් කිසිදු අවස්ථාවක හුදෙකලාව තබනවා වෙනුවට තම ගමනට සහභාගී කර ගන්නේ නම් ඉදිරියට විය හැකිව තිබූ අනතුරක් වළක්වා ගැනීමක්ද වේ. එසේම දරුවා සමඟ දවසේ වැඩි කාලයක් ගත කිරීමෙන් දරුවන් හා මවුපියන් අතර බැඳීමද ශක්තිමත් කර ගැනීමට හැකිවනු ඇත.

කුඩා දරුවකු මවුපිය භාරකාරත්වයෙන් මිදී වෙනත් පාර්ශ්වයක් හරහා පාසල් ගමන සිදු කරන විටද මවුපිය භාරකරුගේ නම, ලිපිනය, දුරකතන අංකය ආදිය සටහන් කර කුඩා සටහනක් දරුවාගේ බෑගය තුළ රැඳවිය හැකිනම් හදිසි අවස්ථාවකදී දරුවා වඩාත් අසරණ නොවනු ඇත.

එවැනි සටහනක් ඇති බවට දරුවා දැනුම්වත් කර තිබීමද අත්‍යවශ්‍ය වේ. අනතුරු පෙර නිමිති පෙන්වමින් සිදු නොවන අතර එය ඕනෑම අවස්ථාවකදී විය හැකිය. එනිසා අවදානමට පෙර සූදානම උදෙසා දරුවාගේ ආරක්ෂාව සුරක්ෂිත කරවනු වස් ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම නොපමාව ගත යුතුය.

සටහන- මාධවී

# ලංකාදීප සුව සෙවණ

# දියවැඩියාවෙන් වැළකෙන්න මග මෙන්න



**අපේ ශරීරයේ ඇති හරිම අපූරු ඉන්ද්‍රියක් වශයෙන් දිව සැලකේ. විවිධ රස විඳීමටත්, ඒ රසවලට ඇබ්බැහි කිරීමටත් දිවට ඇති හැකියාව පුදුමසහගතය. අපේ පැරැණි ව්‍යවහාරයේ ඇති කට නිසයි මාළුවා නහින්නේ යන කියමන සාක්ෂාත් කරවීමටත් දිව බොහෝ ඉවහල් වේ.**

ළදරුවන්ගේ ආහාර පිළියෙළ කිරීමේදී අවුරුද්දක් යනතුරු ලුණු , සීනි එකතු නොකිරීමට වගබලා ගත්තද ඉන්පසුව ඒ පුරුද්දට අනුගතවීම කෙතරම්ද යන්න සිතීමට මේ සුදුසුම අවස්ථාවයි.

රූපවාහිනී හා සමාජ මාධ්‍ය දරුවන් ඉලක්ක කර ගනිමින් විවිධාකාර කෘත්‍රිම රසකාරක, තෙල් - ලුණු- සීනි යොදා තැනූ බයිට් වර්ග, සීනි අධික බීම වර්ග, ලුණු- තෙල් අධික රස කැවිලි වර්ග ප්‍රචාරය අරඹා තිබේ. මෙකී දේවල් ළමා පරපුරට හුරු කරවන්නෙත් වැඩිහිටි අපම නොවේද? කාර්ය බහුලත්වය මැද ඉලක්ක හඹා යන නූතන මවුපියෝ ලෙහෙසියට හෝ මුදල් ඇතිකම නිසා හෝ නොදැනුම්වත්භාවය මත හෝ මෙවැනි ආහාර දරුවන් ඉල්ලා සිටි පමණින්ම ලබා දීමට මැලි නොවෙති. මෙකී ආහාර නොකඩවා ගැනීමෙන් අපේ සිරුරේ නිරෝගීකමට එල්ලවෙන බලපෑම ,ප්‍රතිවිපාක ගැන ඔබ දැනුම්වත්ද?

අපේ රටේ සිදුවන මරණවලින් සියයට 83ක්ම දියවැඩියාව, අධික රුධිර පීඩනය, හෘදයාබාධ, අංශභාගය, පිළිකා, කාලික ස්වසන රෝග වැනි බෝනොවන රෝග නිසාවෙනි. අවුරුදු 18ත් 69ත් අතර වියේ පසුවන්නන්ගෙන් සියයට 10ක් අධි රුධිර පීඩනයෙන් පෙළෙන අතර සියයට 10ක් දියවැඩියාවෙන් පෙළන බව සමීක්ෂණ වාර්තා පෙන්වා දේ. ඒවගේම තවත් සැලකිය යුතු ප්‍රතිශතයක් පූර්ව දියවැඩියාව එනම් දියවැඩියාව හැදෙන්න ආසන්න තත්ත්වයේ පසුවන බවද අනාවරණය වේ. මේ සියලුම රෝගවලට ගොදුරු වන්නන් මහලු පුද්ගලයන් නොව තරුණ වයසේ පසුවන්නන් වීම රටක ශ්‍රම දායකත්වයට කෙතරම් පාඩුවක්ද?

## මේවාට හේතු ?

කුඩා කාලයේ සිටම දරුවන්ට දෙන නුසුදුසු ආහාර පාන, ක්‍රියාශීලී වයසේ පසුවන දරුවන්ට දුව පැන සෙල්ලම් කිරීමට ඉඩ නොදීම, තරඟකාරී අධ්‍යාපන රටාව මගින් ඇති කරන ආතතිය, පෞරුෂත්ව දුර්වලතා යනාදිය හඳුන්වා දිය හැකිය.


ඒ අනුව කුඩා කාලයේ සිටම අපි දරුවන්ගේ දිව හුරු කරවන රස වර්ග මොනවාද යන්න දැන් බලමු. ඒවා නම් පිටි කෑම, සීනි - තෙල් - ලුණු රසයි. ඒ රසවලට ඇබ්බැහි වීමෙන් ඇතිවන ප්‍රතිවිපාක කවරේද?

## ඇබ්බැහියේ ප්‍රතිඵල

පිටි- සීනි- තෙල් රසට ඇබ්බැහි වූ විට නොදැනුම්වත්වම සිරුර තරබාරු වීමට පටන් ගැනේ. බර වැඩි - තරබාරු ළමයින් දැන් ක්‍රම ක්‍රමයෙන් වැඩි වීමට පටන් ගෙන ඇත. ඒ අතුරිනුත් පාසල් ළමයින්ගෙන් සියයට 90ක් පමණ බර වැඩි- තරබාරු ගණයට වැටේ. මොවුන් ඉතා අඩු වයසින්ම දියවැඩියාව, හෘද රෝග, පිළිකාවලට ගොදුරු වීමේ අවදානමත් වැඩිය.

## ලුණු වැඩි කෑම කෑවොත් ප්‍රෙෂර්

ලුණු වැඩි ආහාර ගත්තොත් එනම් කෘත්‍රිම ආහාර, සෝස් වර්ග, රෝල්ස්, පැටිස්, පීට්සා, බේකරි නිෂ්පාදන, කොත්තු මේ ආහාරවලට කුඩා අවදියේ පටන්ම හුරු වුණොත් ප්‍රෙෂර්' එක නැත්නම් අධි රුධිර පීඩනය ඇති වීමට හේතු වේ. තරුණ වියේදීම ඒ නිසා හෘදයාබාධ, අංශභාගය, ආමාශයේ පිළිකා, ඇදුම, වකුගඩු අකර්මණ්‍ය වීමටද ඇති අවදානම වැඩි වේ.





■ සෞඛ්‍ය අමාත්‍යංශයේ බෝනොවන රෝග ඒකකයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ
**ශාන්ති ගුණවර්ධන**

දිනකට අවසි ලුණු පරිමාව වැඩිහිටි පුද්ගලයකුට නම් ලුණු තේ හැඳි 01කි. එනම් ග්‍රෑම් 05කි. දරුවකුට නම් ඉන් භාගයකි. එහෙත් අපේ නොදැනුම්වත්භාවය හරහා දිනකට ලුණු තේ හැඳි 2ක් 3ක් - ග්‍රෑම් 9ක් 12ක් ආහාරයට එකතු කර ගනී. ඒත් බත් පිසීමේදී පවා ලුණු එකතු කරනවා නම් එයද කාලයක් තිස්සේ සිට සිදුවීමෙන් ශරීරයේ රුධිර පීඩනය වැඩි කිරීමට හේතු වේ.

## දියවැඩියාවට මුල

දිනකට එක් පුද්ගලයකුට නිර්දේශ කරන්නේ සීනි තේ හැඳි 06කට අඩු ප්‍රමාණයකි. එහෙත් බොහෝ දෙනෙක් සීනි තේ හැඳි 10ක් 12ක් භාවිත කරන බව තහවුරු වී ඇත. මේ සියල්ලේම බර දරන්නට අපේ අග්න්‍යාශයට සිදු වේ. පැණි රස කෑම බීම, පිරිපහදු කළ පිටිවලින් තැනූ ආහාර නිතර ගැනීමෙන් රුධිරයේ සීනි මට්ටම ඉහළ යාම පාලනය කිරීමට වැඩි වැඩියෙන් ඉන්සියුලින් නිපදවීමට අග්න්‍යාශයට සිදු වේ. කුඩා කාලයේ සිටම මේ ක්‍රියාව සිදු වුවහොත් අග්න්‍යාශය ඉක්මනින් දුර්වල වී ඉන්සියුලින් නිපද වෙන ක්‍රියාවලියට බාධා පැමිණීම නිසා ඉන්සියුලින් අඩු වේ. එවිට රුධිරයේ සීනි මට්ටම නිසි අයුරින් සිදු නොවේ. එවිට දියවැඩියා රෝගය ඇති වේ.

## වැළැකීමට කළ යුතු දෑ

ලුණු - තෙල් -පිටි-සීනි කෑමට පුරුදු වීමම ඇබ්බැහියකි. මේ වැරැදි පුරුද්ද ක්‍රම ක්‍රමයෙන් අඩු කර ගත යුතුය.

ඕනෑම පුරුද්දකින් මාසයක් දෙකක් යන විට මිදිය හැකිය. ඒ උදෙසා මේවායෙහි හානි කර ප්‍රතිඵල ගැන දැනුම්වත් වන්න.

බත් පිසීමේදී ලුණු දැමීම ටිකෙන් ටික අඩු කර සති 2ක් 3ක් ඇතුළත ලුණු එකතු නොකරම බත පිස ගත හැකිය.

පලතුරු ආහාරයට ගන්නා විට ලුණු එකතු කර නොගන්න. ඒවායෙහි නැවුම් රසයට දිව හුරු කර ගන්න.

ක්ෂණික ආහාර රෝල්ස්- පැටිස් ආදිය ආහාරයට ගන්නා විට සෝස් එකතු කිරීමේ පුරුද්ද අත්හරින්න. සෝස්වල ලුණු, සීනි සහ තෙල් අඩංගු වේ. ක්ෂණික ආහාර වුවද ඉඳහිට ගන්නා කෙටි කෑමක් කර ගත හැකිය.

පැකට් කළ ආහාරවල ඇති ලුණු, තෙල්, සීනි ලේබලය දෙස හොඳින් බලන්න. දරුවන්ද ඒවා තෝරා ගැනීමේදී දැනුම්වත් කළ හැකිය.

රතු ලේබල් එකක් හෝ ඇත් නම් එවැනි ආහාර මිලට ගැනීමෙන් හැකිතාක් වළකින්න.

කහ ලේබල් එකක් හෝ වැඩි ගණනක් තිබේ නම් ඒවාද මිලට ගැනීම අවම කළ හැකිය.

අපේ ස්වාභාවික රසකාරක වන ගොරකා, කුරුඳු, ඉඟුරු, සුදු ළූනු, සියඹලා, කරඳමුංගු, කරාබු නැටි, තුනපහ, කහ ආදිය ආහාර රස ගැන්වීමට යොදා ගන්න.

කුඩා කාලයේ පටන්ම දරුවන්ව ස්වාභාවික රසවලට හුරු කරවන්න.

අප ලබා දෙන රසයට දිව හුරු වේ. දරුවන්ට විවිධ රස ඇති ආහාර හඳුන්වා දීමේදී කුඩා කල සිටම සැලකිලිමත් වන්න. ලුණු - තෙල්- සීනි අඩුවෙන් රස බැලීමට හුරු වන්න. අලුත් එළවළු- නැවුම් පලතුරු කෑමට දරුවන් හුරු කරවන්න.

නිරෝගී දරුවකු රටට දයාද කිරීම උදෙසා අදම ක්‍රියාත්මක විය යුතුය. අනාගතයේදී දරුවා බෝ නොවන රෝගවල ගොදුරක් නොවීමේ වගකීම ඒ අතර ප්‍රධානයි. සොබා දහමට පිටු පා දිව ඉල්ලන රස ඔස්සේ හඹා යාමට දරුවන්ට ඉඩ නොතබන්න.

සටහන - මාධවී ධර්මරත්න

# රුධිරයේ සීනි පාලනයට රටකජු

**මිනිසාගේ ශාරීරික මානසික පැවැත්මට එකසේ ඉවහල් වන කෙටි ආහාර රෝගව්‍යාධීන්ද තුරන් කරන බව විත්වත්හු පෙන්වා දෙති. ඒ අනුව, කොලෙස්ටරෝල් පාලනය කරන පොලිපෙනෝල් බහුල රටකජු හෘද රෝග ඇති කරන දැවිල්ල අවම කරන බව විද්වත්හු පවසති.**

රටකජුවල ඇති කැලරි ඉතා ඉහළ නමුත් ඒවා බර වැඩිවීම වෙනුවට බර අඩුකර ගැනීමට දායකවේ. රටකජු ආහාර වේලකට වඩා කෙටි ආහාරයක් ලෙස පරිභෝජනය පිත්තාශයේ ගල් ඇතිවීම වළක්වා සීනි පාලනයට උපකාරීවේ. රටකජු හෝ රටකජු බටර් උදෑසන ආහාර වේලකට එකතු කිරීමෙන් දවස පුරා රුධිරයේ සීනි මට්ටම පාලනය වී ස්ථාවර වේ. ඇමරිකා දියවැඩියා සංගමය රටකජු දියවැඩියා සුපිරි ආහාරයක් ලෙස නම් කර ඇති අතර රටකජුවල ඇති පිළිකා නාශක ගුණය හේතුවෙන් අතර්වහරණයෙන් පසු පිළිකා ඇති වීමේ අවදානම හා මහබඩවැලේ පිළිකා අවම කරන බව පෙන්වා දෙයි.

අන්තර්ජාලය ඇසුරින්

- ප්‍රියන්ති තිරාණගම



# මානසික ලෙඩට සුවය දෙන විද්‍යුත් කම්පන ප්‍රතිකාර

**මානසික රෝග විවිධාකාරය, රෝගියාගේ මානසික රෝගය අනුව ප්‍රතිකාරත් විවිධ වේ. අද මෙම රෝගය පෙරට වඩා වැඩි බවක් පෙනේ. ඒ මනසට ඇතුළුවන විවිධ ගැටලු විසඳා ගැනීමට නොහැකිව ඇතැම් දරුවන් රෝගී වීම නිසාය. කෙසේ වුවද මානසික රෝගයකට කරන ප්‍රතිකාර රෝගියාගේ හැසිරීම් අවස්ථා හා සම්බන්ධ වේ. මෙම රෝගයට ගොදුරු වූ ඇතැම් රෝගීන් කෙනකුට පෙනෙන නොපෙනෙන දේ ගැන කතාකරයි. ඒ සමහරුන්ට ඒවා පෙනෙන නිසාය.**

සමහරු නිතර අත්සෝදති. එයත් මානසික රෝගයකි. තවත් සමහරුන්ට ලිංගික සැකය නිතර ඇතිවේ. සමහරු රාත්‍රී නින්දට ගොස් ඉක්මනින් නැගිට ගෙදර දොර ජනේල වැසුවාදැයි බලති. තවත් අය බලාගත් අත බලාගෙන සිටිති. තවත් අය හේතු නැතිව මනසින් තැවි තැවි අඬති. මෙසේ මානසික රෝගවලට හේතුවන දෑ විවිධ ය.

ඉහත රෝගීන්ට අමතරව ප්‍රචණ්ඩ වන රෝගීහු ද සිටිති. සමහරු අධික්‍රියාකාරී වෙති. තවත් සමහරු කතා නොකරම සිටිති. එනිසා මානසික රෝගයකට හේතු වන්නේ කෙනකුට දැනෙන දේ දකින දේ සහ අසන දේ යනාදියයි. ඒ අනුව මෙම රෝගයට කරන ප්‍රතිකාරත් විවිධය. එනිසාම එම රෝගයට ප්‍රතිකාර කරන ආකාරය පිළිබඳ දැනුවත්වීමත් වැදගත් වේ.

මෙම රෝගයට ගොදුරු වූ කෙනකුට මූලිකවම දෙන්නේ ඖෂධ ප්‍රතිකාරයි. ඉන්පසු මනෝ උපදේශනය ලබා දෙයි. මෙම ප්‍රතිකාරවලට සුවය නොලබන අයට විද්‍යුත් කම්පන ප්‍රතිකාර කිරීමට සිදුවේ.

විද්‍යාත්මක පරීක්ෂණ අනුව මෙම ප්‍රතිකාර මගින් බොහෝ දුරට රෝගය පාලනය වේ. එහෙත් විද්‍යුත් කම්පන ප්‍රතිකාර ගැන බොහෝ දෙනා සැකයෙන් බියෙන් පසුවෙති. එනිසාම අත්‍යවශ්‍ය වුවත් වෛද්‍යවරයා නියම කළත් එම ප්‍රතිකාර නොදී සිටින අය බෙහෙවින් සිටිති. එහෙත් තදබල මානසික රෝගයකින් පෙළෙන අයට විද්‍යුත් කම්පන ප්‍රතිකාර බෙහෙවින් වැදගත්ය.

## ප්‍රතිකාරය සුදුසු කාටද?

මෙම ප්‍රතිකාරය සෑම මානසික රෝගියකුටම ලබා දෙන්නේ නැත. පහත සඳහන් රෝගීන්ට මෙම ප්‍රතිකාර මගින් සාර්ථකව සුවය ලබා ගත හැකිය.

විශාදය රෝගයෙන් තදින්ම පෙළෙන රෝගීන්

හින්නෝන්මාද රෝගීන්

ඖෂධ මගින් සුව නොවන උන්මාද රෝගීන්

මෙම රෝගීන් සඳහා ECT ප්‍රතිකාර (විද්‍යුත් කම්පන) ප්‍රතිකාර කිරීමේ බොහෝ සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවට අතීතයේ එතරම් සිතුවේ නැත. උදාහරණ ලෙස දක්වතොත් එදා දියවැඩියා රෝගීන්ට කුස පිරෙන්න ආහාර දුන්නේ නැත. නියම කළේ සුළු කෑම පමණි. අද ඒ ක්‍රමය වෙනස් වී තිබේ. අද එම රෝගීන්ට පැණි රස කෑම හැර ඕනෑම ආහාරයක් ගත හැකිය. එසේ මෙම ප්‍රතිකාරයත් වෙනස්වී තිබේ.

## ප්‍රතිකාර කරන්නෙ කොහොමද?

මෙය ඉතාම සරල විද්‍යුත් ප්‍රතිකාර ක්‍රමයකි. මෙයට බොහෝ දෙනා කියන්නේ 'කරන්ට්' අල්ලනවා කියාය. එනිසා රෝගියා බිය වේ. ඒ වේදනාකාරීවෙයි හෝ පිළිස්සෙයි යැයි සිතන නිසාය. ඒ නිසා බොහෝ දෙනා මෙම ප්‍රතිකාරයට යොමුවීමට අකමැතිය.



මෙම ප්‍රතිකාර ලබාදීමට රෝගියා පහසුකම් තිබෙන රෝහලකට ඇතුලත් කළ යුතුය. ඒ වගේම මෙම ප්‍රතිකාර ලබාදීමට විශේෂඥ වෛද්‍ය දැනුම අවශ්‍ය වේ.

මෙම ප්‍රතිකාරය ලබාදීමට රෝගියා නිර්වින්දනය කළ යුතුය. ප්‍රතිකාරය සඳහා ඉතා කෙටි කාලයක් වැය වේ.

■ මහාචාර්ය
**ශවේන්ද්‍ර ඩයස්**

මෙහිදී කරන්නේ නිර්වින්දනය කළ රෝගියා විශේෂිත යන්ත්‍රයකට සවි කර විද්‍යුත් අග්‍ර දෙකක් රෝගියාගේ හිසට සවි කිරීමය. ඒ බොහෝ විට හිස දෙපසටය. සමහර අවස්ථාවලදී හිසේ එක පසෙකට පමණක් තබා එම අග්‍ර දෙක හරහා විද්‍යුත් ධාරාවක් රෝගියාගේ හිස තුළට ලබාදෙයි. මෙයින් කරන්නේ හිසේ මාංශපේශි ගැස්ම අවම කිරීමය.

මෙම ප්‍රතිකාර මගින් ස්නායුවල අවසන් තැන්වල තිබෙන ස්නායු ආවේග පිට කරයි. එසේම රෝගය සුව කිරීමට අවශ්‍ය රසායන ද්‍රව්‍ය පිට කරයි. ඉන් රෝගය සුව වේ.

ඉහත ප්‍රතිකාර කරන්නේ සුළු වේලාවකටය. ප්‍රතිකාරයෙන් පසු රෝගියා පියවි සිහිය ලබයි. සාමාන්‍යයෙන් රෝගියකුට මෙම ප්‍රතිකාර සතියකට දෙතුන් පාරක් ලබාදිය යුතුවේ.

තදබල ලෙස මානසික රෝගයෙන් පෙළෙන අයට දවසක් හැර දවසක් විද්‍යුත් කම්පන ප්‍රතිකාරය ලබාදිය යුතුය.

ඖෂධ ප්‍රතිකාරවලටත් රෝගය සුව කළ හැකි වුවත් ඊට වඩා මෙම ප්‍රතිකාර මගින් රෝගියා ඉක්මනින් සුවපත් වේ. ඖෂධ ප්‍රතිකාර මගින් සුවය ලැබීමට කල්ගතවේ. එනිසා විද්‍යුත් ප්‍රතිකාර ක්‍රමය බරපතළ මානසික රෝගීන්ට ඉතාම සුදුසු ප්‍රතිකාර ක්‍රමයකි.

## ප්‍රතිකාරයට රෝගියා සූදානම් කරන්නේ කොහොමද?

මෙම ප්‍රතිකාරයට පෙර රෝගියා ඊට යොමු කිරීමට හැකිදැයි දැන ගැනීමට වෛද්‍යවරයා විසින් මූලික පරීක්ෂණ කිහිපයක් සිදු කරයි.

ප්‍රතිකාරයට පෙර නිර්වින්දනය කිරීම සඳහා රෝගියා පැය 6ක් පමණ නිරාහාරව තබයි. ප්‍රතිකාරයට යාමට පෙර රෝගියාගේ කෘත්‍රිම දත් දමා තිබේ නම් ඒවා ගැලවිය යුතුය. එසේම පැළඳ සිටින සියලු ආභරණ ගැලවිය යුතුය. මුත්‍රාශය හිස්ව තැබීමත් අවශ්‍යය.

## අතුරු ආබාධ තිබේද?

මෙම ප්‍රතිකාරයට අතුරු ආබාධ ඉතාම අවම වේ. මෙම ප්‍රතිකාරය ලබා දෙන්නේ මානසික රෝගියෙන් බරපතළ තත්ත්වයේ පසුවෙන රෝගීන්ටය. එනිසා මෙම ප්‍රතිකාරය ගැන බිය යුතු නැත.

මෙම ප්‍රතිකාරයෙන් පසු රෝගියාට සුළු වශයෙන් අමතකවීම් ඇතිවේ. එය පැය 12-48 ක කාලයක් තිබිය හැකිය. එසේම සුළු හිස කැක්කුම, නිදිමත, මස්පිඩු වේදනා වැනි ගැටලු ඇතිවිය හැකිය. ඒ හැර වෙනත් බරපතළ ගැටලු ඇති නොවේ.

## ප්‍රතිකාරයෙන් පසු

ප්‍රතිකාරයෙන් පසු රෝගියා පියවි සිහිය ලබයි. ඉන්පසු වෛද්‍යවරුන් රෝගියා පරීක්ෂා කරයි. එහිදී රුධිර පීඩනය ගැන විශේෂයෙන් සැලකිලිමත් වේ

මෙම ප්‍රතිකාර කළත් ඊට පෙර පටන් වෛද්‍යවරයා ඖෂධ ප්‍රතිකාර කර තිබේ නම් ඒවා නිසි ලෙස ගැනීමට ඉඩ සලස්වයි.

සියදිවි නසා ගැනීමට තරම් බරපතළ ලෙසට පත්ව සිටින රෝගීහු මෙම ප්‍රතිකාරයෙන් පසු නිරෝගීව සුවදායි ලෙස පවුල් ජීවිත ගත කරති. ඒ නිසා බරපතළ මානසික රෝගීන්ට මෙම ප්‍රතිකාරය ඉතාම සුදුසු ප්‍රතිකාර ක්‍රමයක් බව කිව යුතුය.

සටහන - ශිරානි ගල්ලෑල්ල

# රට ගොඩගන්න පුළුවන් මහින්ද රාජපක්ෂට පමණයි


සහභාගි වූ මහා සංඝරත්නය

## 77වන ජන්ම දිනයදා රැකව ජිනරතන හිමියෝ පවසති

■ රන්න - චන්ද්‍රසේන ගමගේ සහ තංගල්ල - ආරියදාස කොඩිතුවක්කු

**"හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දුර්භික්ෂයක්ව පැවැති ත්‍රස්තවාදී යුද්ධය පරාජයට පත්කොට මේ රටට සාමය ගෙන ආවා. ඒ වගේම සුළු විපතක් දැන් රටට ඇතිව තිබෙන බව පෙනෙනවා. මේ සුළු විපතෙන් ද මේ රට ගලවා ගත හැකි වන්නේ ඔබතුමාට පමණයි. ඒ නිසා කරුණාකර පෙරට ඇවිත් රටේ පවතින මේ ගැටලුවලින් ද මේ රට මුදවා ගන්න කියා මම අද ඉල්ලීමක් කරනවා." යැයි වයඹ පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක රැකව ජිනරතන හිමියෝ ඉකුත් 18 වැනි දින තංගල්ල නගර ශාලාවේ පැවැති ආශිර්වාද ජය පිරිත් දේශනයට ප්‍රථම අනුශාසනාවක් කරමින් පැවසූහ.**

හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ 77 වැනි උපන් දිනය පසු ගිය 18 වැනි දිනට යෙදී තිබුණු අතර, ඒ වෙනුවෙන් මෙම ආශිර්වාද ජය පිරිත් දේශනය පැවැත්විණි.

රැකව ජිනරතන හිමියන් එහිදී අනුශාසනාව සිදු කරමින් වැඩිදුරටත් පැවසුවේ, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ කෘතහස්ත දේශපාලකයකු බවයි.

"අපි දන්නවා මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන ජීවිතය තුළ ඔබතුමා අභියෝග රැසකට මුහුණ දුන්නා. අද 77 වැනි උපන් දිනය සමරන එතුමාට නැවත වරක් මේ රට ගොඩගන්න අවස්ථාව තිබෙනවා. එතුමා ඒ දේ කරයි කියා බලාපොරොත්තුව සිටිනවා.

මේ රටේ මහා සංඝරත්නය ඔබතුමාට හදවතින්ම ආශිර්වාද කරනවා. මෙතනට වැඩම කොට තිබෙන්නේ මේ රටේ මහා සංඝරත්නයෙන් ඉතාම සුළු කොටසක් පමණයි. ඔබතුමා මේ රට මුදවා ගැනීම පිළිබඳව අපේ මහා සංඝරත්නය තුළ ඔබතුමා කෙරෙහි ගෞරවයක් තිබෙනවා. ඊට කෘතවේදිත්වය පළ කරන්න තමයි මේ මහා සංඝරත්නය අද මෙතනට පැමිණ තිබෙන්නේ.

බුදුන් වහන්සේ දේශනා කොට තිබෙනවා, විපතකදී තමන් තුළ ආත්ම ශක්තිය වඩාත් ඇති කරගත යුතුයි කියා. ඒ ආත්ම ශක්තිය ඔබතුමා ළඟ තිබෙනවා. ඒ නිසා රට තුළ තිබෙන මෙම සුළු විපතෙන් ද මේ රට ඔබතුමා මුදවා ගන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී සිදු කරනවා."

ශ්‍රී පාද විහාරස්ථානයේ විහාරාධිපති බෙංගමුවේ ධම්මදින්න හිමි:

"ඔබතුමා මේ රටට ආදරය කරපු කෙනෙක්. මේ රටේ ජනතාවට ආදරය කරපු කෙනෙක්. එම නිසා මේ රටේ ජනතාවගේ පියා වශයෙනුයි ඔබතුමා සලකන්නේ. පියකුට කරන ගෞරවයක් හැටියටයි අපි මේ කටයුත්ත සලකන්නේ."

තංගල්ල වනවාසල කුඩා විහාරයේ විහාරාධිපති, ශාස්ත්‍රපති මණ්ඩාඩුවේ ධීරානන්ද හිමි:

"අපි මීට කලින් අවස්ථා ගණනාවකදී කාල්ටන් නිවස ආශ්‍රිතව ආගමික වතාවත් සිදු කොට තිබෙනවා. ඔබතුමා ආගම දහමට ලැදි නායකයකු බවට ප්‍රචලිතයි. ඔබතුමා 77 වැනි වියට පා තබන මේ මොහොතේ මහා සංඝරත්නයේ ආශිර්වාදය ඔබතුමාට හිමි වෙනවා."

මෙම ජය පිරිත් දේශනාව සඳහා රටේ සිවු දිසාවෙන් මහා සංඝරත්නය දහසකට ආසන්න සංඛ්‍යාවක් වැඩම කොට තිබුණි. තංගල්ල ඇන්නපිටිය ජයසුමනාරාමයේ සිට විචිත්‍රවත් පෙරහරකින් මහා සංඝරත්නය තංගල්ල නගර ශාලාව දක්වා වැඩම කරවන ලදී.

ඉන් අනතුරුව මූලික ආගමික වතාවත්වලින් පසුව ජය පිරිත් දේශනාව සිදු කෙරිණි.

මෙම අවස්ථාවට හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා එම මැතිනිය ද සහභාගි වී සිටියහ. එමෙන්ම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නියෝජනය කරනු ලබන දේශපාලකයෝ රැසක් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.


ජය පිරිත් දේශනාව ශ්‍රවණය කරනු ලබන මහින්ද රාජපක්ෂ මහතා හා එම මැතිනිය සහ ගෝඨාභය රාජපක්ෂ මහතා හා එම මැතිනිය ප්‍රමුඛ පිරිස

# ගල් ඇල්ලූ රන් කරඬුවක් වෙල්යායකින් සොයාගනී



■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**ගල් අල්ලන ලද චෛත්‍යයක හැඩයකින් යුතු අඟල් 12ක් පමණ උස රන් කරඬුවක් ගනේමුල්ල කැහැලිපස්මුල්ල ප්‍රදේශයේ වෙල් යායක තිබී පෙරේදා (19) සොයා ගන්නා ලදැයි කිරිබත්ගොඩ පොලිසිය පවසයි.**

ගණේමුල්ල තිබ්බොටුගොඩ ප්‍රදේශයේ පදිංචි ඕ.ජී. උදය ප්‍රසන්න නමැති අයකු මෙම රන් පැහැති කරඬුව දැක එය අහුලා ගෙන කිරිබත්ගොඩ පොලිසියට බාරදී ඇත.

කවුරුන් හෝ විහාරස්ථානයකින් හෝ වෙනයම් ස්ථානයකින් මෙය සොරාගෙන කිසියම් හේතුවක් මත වෙල්යායේ අතහැර දමා යන්නට ඇති බවට පොලිසිය සැක කරයි.

කැලණිය සහකාර පොලිස් අධිකාරී පී. පද්මනාදන් මහතාගේ උපදෙස් මත කිරිබත්ගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුසන්ත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පැවැත්වේ.

# හමුදා සෙබළෙක් නර්තන ශිල්පියකුගේ ගෙට පැන ලක්ෂ ගණනක බඩු කඩලා

■ බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

**මිල්ලනිය කිම්මන්තුඩාව නර්තන ශිල්පියකුගේ නිවෙසට පෙරේදා (19) රාත්‍රියේ යකඩ පොලු අතැතිව පැමිණි හමුදා සෙබළකු සහ ඔහුගේ සහෝදරයා එල්ල කළ ප්‍රහාරයෙන් රුපියල් ලක්ෂ ගණනක දේපළවලට අලාබ සිදු වී ඇතැයි මිල්ලනිය පොලීසිය කියයි.**

එම පුද්ගලයන් දෙදෙනා මරණීය තර්ජනය කරමින් නර්තන ශිල්පියාට පහරදීමට සොයන අවස්ථාවේදී ඔහු නිවෙසින් පලාගොස් සැඟවී ඇති අතර, ඉඩම් ආරවුලක් මුල් කරගනිමින් මෙම ප්‍රහාරය එල්ල කර ඇතැයි පොලීසිය කළ පරීක්ෂණවලින් හෙළි වී ඇත.

නර්තන ශිල්පියා පදිංචි ඉඩම මුල් අයිතිකරුගේ ඇවැමෙන් පැවැරීමට කටයුතු කරන බවට බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිපිය ලැබී දින කිහිපයකට පසු මෙම ප්‍රහාරය එල්ල කර ඇත.

හමුද සෙබළා සහ ඔහුගේ සහෝදරයා එල්ල කළ ප්‍රහාරයෙන් නිවෙසේ වීදුරු ජනෙල්වලට, නිවෙස ඉදිරිපිට තාප්පයේ සවිකර තිබෙන විදුලි බල්බවලට, ආරක්ෂිත කැමරාවලට මෙන්ම, ඉදිරිපස ගේට්ටුවට ද බරපතළ අලාබ සිදු වී ඇත.

නර්තන ශිල්පියා එම අවස්ථාවේදී දිව ගොස් සැඟවී පණ බේරා ගෙන ඇත.

මැර පිරිස එල්ල කළ ප්‍රහාරය ආරක්ෂිත කැමරාවේ සටහන් වී ඇත.

පානදුර කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන්ත වෙදගේ, සහකාර පොලිස් අධිකාරි උපාලි තලගල මහත්වරුන්ගේ උපදෙස් මත, මිල්ලනිය පොලීසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ගයාන් කහටපිටිය මහතා ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වයි.


කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය

ජාතික සමාජ සංවර්ධන ආයතනය

## ලංසු ආරාධනය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නව යෝජිත සීදුව ගොඩනැඟිල්ලේ ශ්‍රවණාගාරය සඳහා පුටු මිලදී ගැනීම,

කොන්ත්‍රාත් අංකය - NISD/ACC/සීදුව/02/2022

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශයේ ලේකම් වෙනුවෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සීදුව Wing A ගොඩනැඟිල්ලේ ශ්‍රවණාගාර පුටු 400ක් සැපයීමට සුදුසුකම්ලත් ලංසු කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | භාණ්ඩ | ලංසු ගාස්තු (රු.) ආපසු නොගෙවන | ලංසු ගාස්තු (රු.) ආපසු ගෙවන |
| --- | --- | --- | --- |
| 1. | ශ්‍රවණාගාර පුටු (400) | 2000.00 | 500,000.00 |

කොන්දේසි :-

- ඉහත භාණ්ඩ සැපයීමට කැමති ලංසුකරුවන් හා ආනයනය කරන ලද ලංසුකරුවන්ටද ලංසු ඉදිරිපත් කළ හැකිය.
- මේ සඳහා ලංසු ලේඛණ නිකුත් කිරීම 2022.11.23 දින සිට 2022.12.20 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව.10.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් සිදු කෙරේ. මෙම භාණ්ඩ සඳහා ඉහත ලේඛණයේ දැක්වෙන පරිදි ආපසු නොගෙවන රු. 2000.00 ක ලංසු ගාස්තු අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට් පත් ඉදිරිපත් කර අදාල ලංසු ලේඛණ ලියනගේමුල්ල, සීදුව පිහිටි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ගිණුම් අංශයෙන් ලබා ගත හැක.
- ලංසුව සමඟ ඉහත සඳහන් වටිනාකමෙන් යුතුව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණය රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් ඉදිරිපත් කළ යුතු අතර ලංසු සුරක්ෂණය ලංසු විවෘත කළ දින සිට දින 91 ක් ඉදිරියට වලංගු විය යුතුය.
- අනු පිටපතක්ද සහිතව මුද්‍රා තබන ලද ලංසු 2022.12.20 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික සමාජ සංවර්ධන ආයතනය, ලියනගේමුල්ල, සීදුව. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක. මිල ගණන් විවෘත කිරීම 2022.12.20 දින පෙ.ව. 10.00ට ආයතනයේ ශ්‍රවණාගාරයේදී සිදු කෙරේ. මිල ගණන් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රවණාගාර පුටු මිලදී ගැනීම සඳහා මිලගණන් ඉදිරිපත් කිරීම හෝ NISD/ACC/සීදුව/02/2022" යනුවෙන් සඳහන් කළ යුතුය.
- ඉදිරිපත් කරන ලද ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ප්‍රසම්පාදන කමිටුවේ අභිමතය පරිදි වේ. ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය.
- ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මේ සම්බන්ධව වැඩි විස්තර අවශ්‍ය නම් කාර්යාල වේලාවන් තුල 011- 2256049 ඇමතීමෙන් අධ්‍යක්ෂ (පාලන හා මුදල්) හෝ ගණකාධිකාරී වෙතින් ලබා ගත හැකි බව දන්වමි .

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල, සීදුව.



LOLC ෆිනෑන්ස් LOLC ෆිනෑන්ස් පීඑල්සී LOLC GENERAL INSURANCE

# දැවැන්ත වාහන වෙන්දේසිය

(අබලි වාහන සහ කොටස්ද ඇතුළුව)

2022 නොවැම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා

LOLC වාහන අංගනය, ඇතාබැඳිවැව පාර, තලකිරියාගම, දඹුල්ල

පෙ:ව: 10.00 සිට පැවැත්වේ.

| | | | | |
| --- | --- | --- | --- | --- |
| **බස්** | | | | |
| ටාටා LP1510 | 5675CC | 2004 | HY | XXXX |
| **කාර්** | | | | |
| සුසුකි ESCUDO | 1590CC | 1996 | 300 | XXXX |
| **රෝද හතරේ ට්‍රැක්ටර්** | | | | |
| මහින්ද්‍රා 595DI | 2523CC | 2018 | RF | XXXX |
| POWERTRAC EURO50 | 2761CC | 2018 | RG | XXXX |
| ටැෆේ 45DI | 2500CC | 2019 | RG | XXXX |
| **හාවෙස්ටර්** | | | | |
| DANXIA SUPER COMBINE | | | | |
| MUBOTA COMBINE CLASSIC | | | | |
| MUBOTA COMBINE | | | | |
| CROP MASTER (SUMO) 68G COMBINE | | | | |
| DN-XIA GRAND V COMBINE | | | | |
| LAND MARK 4LZ-2.2 COMBINE | | | | |
| MUBOTA AC 70'S PRO | | | | |
| MUBOTA AC70 S PRO COMBINE | | | | |
| MUBOTA AC70'S PRO | | | | |
| YANMAR SUMO HEAVY DUTY COMBINE | | | | |
| **මෝටර් බයිසිකල්** | | | | |
| DEMAK DZR | 120CC | 2017 | BFV | XXXX |
| TVS NTORD | 125CC | 2019 | BIR | XXXX |
| බජාජ් PULSARC | 150CC | 2015 | BDN | XXXX |
| බජාජ් PULSAR | 150CC | 2017 | BFL | XXXX |
| **ට්‍රක්** | | | | |
| මහින්ද්‍රා MAXXIMO | 909CC | 2012 | PT | XXXX |
| මහින්ද්‍රා BOLERO | 2523CC | 2016 | DAF | XXXX |
| **ලොරි** | | | | |
| ටාටා LPT713 CAR CARRIER | 5675CC | 2010 | LH | XXXX |
| **ට්‍රැක්ටර්** | | | | |
| MASSEY FERGUSON | 2955CC | 2018 | RG | XXXX |
| **ත්‍රීරෝද රථ** | | | | |
| බජාජ් | 173CC | 2009 | QS | XXXX |
| බජාජ් | 198CC | 2014 | AAS | XXXX |
| බජාජ් | 173CC | 2010 | QZ | XXXX |
| TVS KING | 200CC | 2010 | YB | XXXX |
| බජාජ් | 173CC | 2010 | YD | XXXX |
| බජාජ් | 150CC | 2005 | JY | XXXX |
| බජාජ් | 198CC | 2013 | AAH | XXXX |
| බජාජ් | 173CC | 2009 | QV | XXXX |
| බජාජ් | 173CC | 2009 | QW | XXXX |
| බජාජ් | 173CC | 2009 | QU | XXXX |
| බජාජ් | 173CC | 2009 | QT | XXXX |
| බජාජ් | 198CC | 2011 | YL | XXXX |
| බජාජ් | 173CC | 2008 | QR | XXXX |
| බජාජ් | 173CC | 2009 | QT | XXXX |
| බජාජ් | 173CC | 2010 | QX | XXXX |
| බජාජ් | 173CC | 2010 | QX | XXXX |
| බජාජ් | 145CC | 2006 | QJ | XXXX |
| බජාජ් | 173CC | 2005 | QO | XXXX |
| බජාජ් | 173CC | 2007 | QJ | XXXX |
| බජාජ් | 173CC | 2007 | QL | XXXX |
| බජාජ් | 173CC | 2008 | QP | XXXX |
| බජාජ් | 173CC | 2008 | QQ | XXXX |
| බජාජ් | 173CC | 2010 | QZ | XXXX |
| බජාජ් | 173CC | 2007 | QM | XXXX |

| | | | | |
| --- | --- | --- | --- | --- |
| **ත්‍රීරෝද රථ** | | | | |
| බජාජ් | 173CC | 2009 | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | QS | XXXX |
| බජාජ් | 173CC | 2009 | QU | XXXX |
| බජාජ් | 173CC | 2009 | QU | XXXX |
| බජාජ් | 173CC | 2010 | QX | XXXX |
| බජාජ් | 173CC | 2010 | QZ | XXXX |
| බජාජ් | 173CC | 2010 | YA | XXXX |
| බජාජ් | 173CC | 2010 | YB | XXXX |
| බජාජ් | 173CC | 2010 | YD | XXXX |
| බජාජ් | 174CC | 2007 | QJ | XXXX |
| බජාජ් | 174CC | 2007 | QK | XXXX |
| බජාජ් | 174CC | 2007 | QK | XXXX |
| බජාජ් | 174CC | 2007 | QL | XXXX |
| බජාජ් | 174CC | 2007 | QN | XXXX |
| බජාජ් | 174CC | 2007 | QN | XXXX |
| බජාජ් | 174CC | 2008 | QO | XXXX |
| බජාජ් | 174CC | 2008 | QP | XXXX |
| බජාජ් | 174CC | 2008 | QS | XXXX |
| බජාජ් | 174CC | 2009 | QS | XXXX |
| බජාජ් | 174CC | 2009 | QS | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QT | XXXX |
| බජාජ් | 174CC | 2009 | QU | XXXX |
| බජාජ් | 174CC | 2009 | QU | XXXX |
| බජාජ් | 174CC | 2009 | QU | XXXX |
| බජාජ් | 174CC | 2009 | QU | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QV | XXXX |
| බජාජ් | 174CC | 2009 | QW | XXXX |
| බජාජ් | 174CC | 2010 | QW | XXXX |
| බජාජ් | 174CC | 2010 | QZ | XXXX |
| බජාජ් | 174CC | 2010 | QZ | XXXX |
| බජාජ් | 174CC | 2010 | QZ | XXXX |
| බජාජ් | 174CC | 2010 | YB | XXXX |
| බජාජ් | 174CC | 2010 | YD | XXXX |
| බජාජ් | 198CC | 2009 | QT | XXXX |
| බජාජ් | 198CC | 2010 | YI | XXXX |
| බජාජ් | 198CC | 2011 | YH | XXXX |
| බජාජ් | 198CC | 2011 | YK | XXXX |
| බජාජ් | 198CC | 2012 | AAD | XXXX |
| බජාජ් | 198CC | 2012 | YY | XXXX |
| බජාජ් | 198CC | 2013 | AAI | XXXX |
| බජාජ් | 198CC | 2013 | AAM | XXXX |
| බජාජ් | 198CC | 2014 | AAP | XXXX |
| බජාජ් | 198CC | 2014 | AAS | XXXX |
| බජාජ් | 198CC | 2015 | AAW | XXXX |
| බජාජ් | 200CC | 2010 | YE | XXXX |
| බජාජ් | 200CC | 2010 | YG | XXXX |
| බජාජ් | 173CC | 2009 | QV | XXXX |
| බජාජ් | 198CC | 2011 | YX | XXXX |
| බජාජ් | 173CC | 2010 | QW | XXXX |

**අබලි වාහන**

| | | | |
| --- | --- | --- | --- |
| **ජීප්** | | | |
| හොන්ඩා VEZEL | 2018 | CBD | XXXX |
| **කාර්** | | | |
| හයිහුන්ඩායි EON | 2015 | CAN | XXXX |

| | | | |
| --- | --- | --- | --- |
| **හාවෙස්ටර්** | | | |
| හාවෙස්ටර් | HODECP2213 | | |
| හාවෙස්ටර් | HODECP2723 | | |
| හාවෙස්ටර් | HODECP4291 | | |
| **ලොරි** | | | |
| මිට්සුබිෂි Fe445e | 1993 | 68 | XXXX |

| | | | |
| --- | --- | --- | --- |
| **මෝටර් බයිසිකල්** | | | |
| බජාජ් PULSAR 150 | 2018 | BGZ | XXXX |
| යමහා RAY | 2017 | BGO | XXXX |
| බජාජ් PULSAR 150 | 2013 | BAN | XXXX |
| යමහා FZ | 2016 | BER | XXXX |

වාහන පරීක්ෂා කිරීම:

## 2022 නොවැම්බර් මස 22 සහ 23 දිනවලදී

LOLC වාහන අංගනය, ඇතාබැඳිවැව පාර, තලකිරියාගම, දඹුල්ල

පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා (වෙන්දේසි දින වාහන පරීක්ෂා කල නොහැක)

**විකුණුම් කොන්දේසි:**

- මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් පැවැත්වේ.
- වෙන්දේසි දින ඇතුළුවීම එක් අයෙකුට රු. 2000/- බැගින් වන ආපසු නොගෙවනු ලබන ප්‍රවේශ පත්‍රයක් සහ රු.25000/ බැගින් වන ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් මඟිනි.
- වැඩිම ලංසුවට හිමිකම් කියනු ලබන පුද්ගලයා ගැණුම්කරු වන අතර විකුණුම අවසන් වූ වහාම ඔහු හෝ ඇය විසින් අදාල ගැණුම් මිලෙන් 25% ක් වන ආපසු නොගෙවනු ලබන මූලික තැන්පතුවක් මුදලින් ගෙවිය යුතුවේ.
- මිටිය පහත් වනවාත් සමඟම 25% ක ආපසු නොගෙවනු ලබන මූලික තැන්පතුවක් මුදලින් ගෙවිය යුතු අතර ඉතිරි 75% ක ගෙවීම නො. 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය ස්ථානයේ පිහිටි LOLC ෆිනෑන්ස් පීඑල්සී වෙත ගෙවීම සහ වාහන ඉවත් කරගෙන යෑම 2022 නොවැම්බර් 30 වන බදාදා දින ප.ව. 3.00 ට පෙර සිදුකල යුතුය.
- මිලදී ගන්නා ලද වාහන වෙන්දේසි භූමියෙන් ඉවත් කරගෙන යාම සාර්ථක ගැනුම්කරුවන් විසින් ඔවුන්ගේ වියදමෙන් 2022 නොවැම්බර් 30 වන බදාදා ප.ව. 3.00 ට ප්‍රථම සිදු කල යුතුයි.
- 2022 නොවැම්බර් 30 වන බදාදා දිනෙන් පසු ගෙවන ලද මුදල් සඳහා වෙන්දේසිකරු හෝ LOLC ෆිනෑන්ස් PLC හි කළමණාකාරිත්වය වග කියනු නොලැබේ.
- මිලදී ගත් මොහොතේ සිට වාහනයේ ආරක්ෂාව පිලිබඳ වගකීම අදාල ගැනුම්කරු සතුය.
- සියලුම වාහන දැනට පවතින තත්වයෙන්ම විකුණනු ලබන අතර ලංසු තැබීමට පෙර අදාල ගැණුම්කරු අයිතම පිලිබඳ තෘප්තිමත් නම් පමණක් තම ලංසුව ඉදිරිපත් කල යුතුය. භාණ්ඩ විකිණීමෙන් පසු කිසිදු ආකාරයක පැමිණිල්ලක් අවලංගු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.
- කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර ලංසුවක් භාර නොගෙන සිටීමට වෙන්දේසිකරුට අයිතිය ඇත.
- ඕනෑම වාහනයක් පෙර දැනුම් දීමකින් තොරව වෙන්දේසියෙන් ඉවත්කරගැනීමේ අයිතිය කළමණාකාරිත්වය සතුයි.
- වෙන්දේසිකරුගේ/කළමනාකාරිත්වයේ තීරණය අවසාන තීරණය වේ.

# ෂොක්මන් සහ සමරවික්‍රම

එකම රටක්. එකම වෙන්දේසිකරුවෙක්. වසර 130 සේවා විශිෂ්ඨත්වය සමරමින්

**ප්‍රධාන කාර්යාලය**
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුර: 081 2227593, දුර:/ෆැක්ස්: 0812224371
Email: schokmankandy@sltnet.lk

**නගර ශාඛාව හා ප්‍රදර්ශණාගාරය**
අංක 6A, ෆෙයාෆීල්ඩ් ගාර්ඩින්ස්, කොළඹ 08
දුර: 2671465, 2671468 ෆැක්ස්: 0112671469
Email: schokman@samera1892.com

Web: www.sandslanka.com

## නිලවරණ කමිටුව ගෙදර යයි

# එල්ලේ සම්මේලනය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් බාරයට

■ නාමල් පතිරගේ

**ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ නිලවරණය (2021-23) පවත්වා අවසන් කිරීමට දැරූ උත්සාහය අසාර්ථක වීමෙන් පසුව එල්ලේ සම්මේලනය සිය බාරයට ගැනීමට ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතා තීරණය කර තිබේ.**

එහි අරමුණ ඔහුගේ බාරයේ නිලවරණය පවත්වා, නැවත එල්ලේ සම්මේලනය ස්ථාපිත කිරීමය. එල්ලේ සම්මේලනය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා බාරයට ගැනීමේ ගැසට් නිවේදනය ඒ අනුව ඉදිරියේදී ප්‍රකාශයට පත් කෙරේ.

මේ වන විට විධායක සභාවේ පාලනයෙන් ගිලිහී තිබෙන එල්ලේ සම්මේලනය මෙතෙක් සභාපති ධුරය දැරුවේ වසර 2020 අගෝස්තු 29 වැනිද කඩවතදී පැවැති නිලවරණයේදී පත්වීම් ලැබූ ව්‍යාපාරික ජයතිස්ස රුද්‍රිගු මහතායි. කෙසේ වුවත්, එල්ලේ සම්මේලනය පැවැත්වීමට නියමිතව තිබූ නිලවරණය (2020-22) සඳහා ඔහු නාමයෝජනා බාරදීමෙන් වැළකී සිටියේය.



ඒ පිළිබඳව ඔහු පැවසුවේ, සිය පාලන කාලයේදී විධායක සභාවේ ඇතැම් නිලධාරීන්ගේ හැසිරීම් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බැවින්, එල්ලේ සම්මේලනයෙන් මෙතැන් සිට ඉවත්ව සිටීමට තමා තීරණය කළ බවයි.

එල්ලේ සම්මේලනයේ නිලවරණය පැවැත්වීමට නියමිතව තිබියදී එය අත්හිටුවූයේ නිලවරණ කමිටුව ඉල්ලා අස්වීමට ගත් තීරණයත් සමගය.

එහිදී සභාපති ධුරයට හිටපු සභාපතිවරයකු වන, හිටපු පළාත් සභා මන්ත්‍රී ආනන්ද හරිස්චන්ද්‍ර මහතා සමග නාමල් සුරංග මහතා නාමයෝජනා බාර දී තිබුණි.

කෙසේ වුවත්, භාණ්ඩාගාරික ධුරය ඇතුළුව තනතුරු කිහිපයක් සඳහා එහිදී නාමයෝජනා ඉදිරිපත්ව නොතිබූ බව ද වැඩිදුරටත් වාර්තා වේ.

එල්ලේ සම්මේලනයේ විධායක සභාව අත්හිටුවන විට ජාතික එල්ලේ ශූරතා තරගාවලියේ අවසන් වටය පැවැත්වෙමින් තිබුණි.

මේ අතර, එල්ලේ සම්මේලනයේ හිටපු ලේකම්වරයකු වන සිරිල් පෙරේරා මහතා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතාට ලිපියක් යොමු කරමින් ඉල්ලා සිටින්නේ, වත්මන් ප්‍රශ්නයට විසඳුමක් ලෙස සුදුස්සන්ගෙන් සමන්විත අතුරු පරිපාලන කමිටුවක් පත් කිරීමට පියවර ගන්නා ලෙසයි.

ක්‍රීඩා ඇමැති රොෂාන් රණසිංහ, ජාතික ක්‍රීඩා සභාවේ සභාපති අර්ජුන රණතුංග යන මහත්වරුන්ටද එහි දී සිරිල් පෙරේරා එම ලිපිය යොමු කර තිබේ.

එහිදී ඔහු වැඩිදුරටත් පෙන්වා දෙන්නේ, 1990 හා 2000 යන දශකවල එල්ලේ සම්මේලනයේ වගකීම් දැරූ නිලධාරීන් හැටියට එල්ලේ ක්‍රීඩාවේ වත්මන් පරිහානියට වගකිව යුතු නිලධාරීන් පරිපාලනයෙන් ඉවත් කිරීම ක්‍රීඩා ඇමැතිවරයාගේ වගකීමක් ලෙස තමන් සලකන බවයි.

එල්ලේ සම්මේලනයේ නිලවරණයෙන් (2020-22) පත්වූ එහි ලේකම් ප්‍රියන්ත මද්දුමගේ මහතා කලින්ම එම ධුරයෙන් ඉල්ලා අස්වීමට කටයුතු කළේය.

හිටපු සභාපති ජයතිස්ස රුද්‍රිගු මහතා එල්ලේ සම්මේලනයේ සභාපති ධුරයට පත්වීමෙන් පසුව ඔහු පෞද්ගලික වියදම් දරා එතෙක් ඇනහිට තිබූ 2018 ජාතික එල්ලේ තරගාවලියේ අවසන් මහා තරගය පවත්වා අවසන් කිරීමට ද කටයුතු කළේය.

කෙසේ වුවත්, දැනට අත්හිටුවා තිබෙන ජාතික එල්ලේ තරගාවලියේ මුල් වටයේ තරගයකදී කණ්ඩායමක ක්‍රීඩකයන් පිරිසක් විසින් විනිසුරුවරයකුට පහරදීමක් සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ද විභාග වෙමින් පැවැතුණි.

එහිදී චෝදනාලාභී ක්‍රීඩා සමාජයට එරෙහිව ලබාදුන් තහනමට එරෙහිව එකී ක්‍රීඩා සමාජය එල්ලේ සම්මේලනයට එරෙහිව අධිකරණයේ පැවැරූ නඩුව මෑතකදී ඉල්ලා අස්කරගැනීමට කටයුතු කළේය.

මේ අතර, ජයතිස්ස රුද්‍රිගු මහතාගේ විධායක සභාවේ සංවිධායක ධුරයක් දැරූ නිලධාරියකුට එරෙහිව එල්ල වූ දූෂිත චෝදනා සම්බන්ධයෙන් එල්ලේ විධායක සභාව විසින්ම ක්‍රීඩා ඇමැතිවරයාට පැමිණිලි කර තිබිණි.

## ප්‍රවේශපත් නිකුත් කිරීම හෙට සිට

■ දමින්ද විජේසූරිය

**ශ්‍රී ලංකාව සහ ඇෆ්ගනිස්ථානය අතර පැවැත්වෙන එක්දින ක්‍රිකට් තරගාවලිය සඳහා වන ප්‍රවේශපත් ලබන අඟහරුවාදා (22 වැනිදා) සිට මිලදීගත හැකි බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිවේදනය කරයි. තරග 3 කින් සමන්විත මෙම එක්දින තරගාවලියේ සියලුම තරග පල්ලෙකැලේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.**

මෙම තරග, ලෝක කුසලාන සුපිරි ලීගයට අයත් තරග 3 කි. ලබන වසරේදී (2023) පැවැත්වෙන එක්දින ලෝක කුසලාන තරගාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායම එක් එල්ලේම ප්‍රධාන තරගාවලියට ඇතුළත් වන්නේද නැතහොත් සුදුසුකම් ලැබීමේ තරගාවලියට ක්‍රීඩා කරන්නේද යන්න තීරණය කිරීම සඳහා ඇෆ්ගනිස්ථානයට එරෙහිව පැවැත්වෙන මෙම තරගාවලිය ඉතා වැදගත් වනු ඇත.

තරග සඳහා ප්‍රවේශපත් ශ්‍රී ලංකා ක්‍රිකට් මූලස්ථානයෙන් හෝ පල්ලෙකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයෙන් නැතහොත් පල්ලෙකැලේ අනිත ක්‍රීඩාංගණයෙන් ලබාගත හැකිය. ප්‍රවේශපත් රුපියල් 500, රුපියල් 2000, රුපියල් 4000 සහ රුපියල් 5000 යන මිලගණන් වලින් ලබාගත හැකිය.

තරග නොපැවැත්වෙන දිනවලදී පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයෙන් ප්‍රවේශපත් ලබාගත හැකිය. තරග පැවැත්වෙන දිනවලදී පස්වරු 6.00 දක්වා පල්ලෙකැලේ අනිත ක්‍රීඩාංගණයෙන් ප්‍රවේශපත් මිලදී ගත හැකිය.

මෙම මස 25, 27 සහ 30 යන දිනයන්හිදී තරග පැවැත්වේ. සියලුම තරග දිවාරාත්‍රී තරග වන අතර පස්වරු 2.30 ට තරග ආරම්භ වීමට නියමිතය.

# අසීරු ඉලක්කය හඹා ගිය සී.සී.සී පිල වාර්තාපොතට

■ ශානුක අරවින්ද

**නායක අශාන් ප්‍රියන්ජන් (100) සහ චමිඳු විජේසිංහ (139) එක්ව 6 වැනි කඩුල්ල වෙනුවෙන් ගොඩනැගූ ලකුණු 219 ක විශිෂ්ට සම්බන්ධතාව හේතුවෙන් අන්තර් සමාජ පළමු පෙළ ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනාගැනීමට සී.සී.සී. කණ්ඩායම ඊයේ (20 වැනිදා) සමත් විය.**



ජයග්‍රාහී සී.සී.සී. පිල

අවසන් මහ තරගයේදී ද්‍රවිඩ සංගම් කණ්ඩායමට එරෙහිව පළමු ඉනිමේ ජයක් වාර්තා කරමින් සී.සී.සී. කණ්ඩායම මෙවර ශූරතාවට හිමිකම් කීවේය. සී.සී.සී. කණ්ඩායම පිට පිටම අන්තර් සමාජ පළමු පෙළ ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනාගත් අවස්ථාව මෙයයි. මේ දක්වා පළමු පෙළ ක්‍රිකට් ඉතිහාසයේ දක්ෂතාවක් දැක්වූ පළමු කණ්ඩායම ලෙසද සී.සී.සී. කණ්ඩායම වාර්තා අතරට එක්වනු ඇත.

කොළඹ එස්.එස්.සී. ක්‍රීඩාංගණයේදී පැවැති අවසන් මහ තරගයේදී පළමුවෙන් පන්දුවට පහර දුන් ද්‍රවිඩ සංගම් කණ්ඩායම සිය පළමු ඉනිම වෙනුවෙන් සියලු දෙනා දැවී ලකුණු 588 ක් ලබාගත්තේය.

ඒ අනුව පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ සී.සී.සී. පිලට පිට පිටම දෙවැනි වරටත් පන්දුවට පහර දීමේ අවමානයෙන් ගැලවීමට සඳහා ලකුණු 388 ක් ලබාගැනීමට සිදුවිය. ලකුණු 288 ක් තුළ කඩුලු 5 ක් බිඳ වැටීමෙන් පසුව තරගයේ ග්‍රහණය දැඩි කිරීමට ද්‍රවිඩ සංගම් කණ්ඩායමට තවත් ලකුණු 100 ක පමණ වාසියක් තිබිණ.

එහෙත් නායක අශාන් ප්‍රියන්ජන් සමග එක්වූ යොවුන් ක්‍රීඩක චමිඳු විජේසිංහ අනර්ඝ සම්බන්ධතාවක් ගොඩනගමින් ද්‍රවිඩ සංගම් කණ්ඩායමේ බලාපොරොත්තු සුනුවිසුණු කර දැමුවේය. සී.සී.සී. ඉනිමේ 6 වැනි කඩුල්ල ලෙස දැවී යන විට ප්‍රියන්ජන්, සිය 13 වැනි පළමු පෙළ ශතකය සම්පූර්ණ කර තිබූ අතර ඔහුගේ ඉනිමට හතරේ පහර 9 ක් ඇතුළත් වී තිබිණ.

අවසන් තරගයේ වීරයා බවට පත් වූ චමිඳු හයේ පහර 2 කින් සහ හතරේ පහර 13 කින් සිය ශතකය සැරසූ අතර එය ඔහුගේ දෙවැනි පළමු පෙළ ශතකයද විය. පළමු ඉනිමේදී ද්‍රවිඩ සංගම් කණ්ඩායම ලබාගත් ලකුණු සංඛ්‍යාව පසුකර යෑම සඳහා ප්‍රියන්ජන්ගේ දැවී යෑමෙන් අනතුරුව චමිඳුට අනගි සහායක් දුන් පවන් රත්නායක හයේ පහර 4 ක් සහ හතරේ පහර 7 ක් සමග ලකුණු 85 ක් රැස්කළේය.

**ද්‍රවිඩ සංගම් ක්‍රීඩා සමාජය - පළමු ඉනිම සියලු දෙනා දැවී 588** (ෆවාද් පෙරේරාවත්ත 54, සදීර සමරවික්‍රම 188, රොන් චන්ද්‍රගුප්ත 48, දිලුම් සුධීර 32, රවිඳු ප්‍රනාන්දු 45, ඉසුරු උදාන 88, කවිඳු නදීශාන් 46, විශ්ව ප්‍රනාන්දු 102/4, දුෂාන් හේමන්ත 128/4)

**සී.සී.සී. - පළමු ඉනිම සියලු දෙනා දැවී 669** (නිමේෂ් ගුණසිංහ 33, මිනොද් භානුක 75, කමිඳු මෙන්ඩිස් 105, ලසිත් අබේරත්න 48, අශාන් ප්‍රියන්ජන් 100, චමිඳු විජේසිංහ 139, පවන් රත්නායක 85, රවිඳු ප්‍රනාන්දු 160/6)

**ද්‍රවිඩ සංගම් ක්‍රීඩා සමාජය - දෙවැනි ඉනිම කඩුලු 4 ක් දැවී 145** (සදීර සමරවික්‍රම 43, රවිඳු ප්‍රනාන්දු 56, ශිරාන් ප්‍රනාන්දු 28, සොනාල් දිනූෂ 52/2)

# ගුල්බදින් නයිබ්ට යළි කැඳවීමක්

■ දමින්ද විජේසූරිය


**ශ්‍රී ලංකාවට එරෙහිව පැවැත්වීමට නියමිත තරග තුනකින් සමන්විත එක්දින තරගාවලිය සඳහා වන ඇෆ්ගනිස්ථානු සංචිතයට තුන් ඉරියව් ක්‍රීඩක ගුල්බදීන් නයිබ් සහ වමත් දඟ පන්දු යවන ක්‍රීඩක නූර් අහමඩ් යළි කැඳවා තිබේ. ඔවුන් දෙදෙනාම මේ වසරේ ජුනි මාසයේ සිම්බාබ්වේහි සංචාරය කළ ඇෆ්ඝනිස්තානු කණ්ඩායමට අයත් නොවූහ.**

කණ්ඩායමේ නායකයා වශයෙන් හෂ්මතුල්ලා සයිඩි නම්කර තිබේ. එක්දින තරග 50 කට ක්‍රීඩා කර ඇති හෂ්මතුල්ලා, ඇෆ්ඝනිස්තානු කණ්ඩායමේ අවසන් එක්දින තරගාවලිය වූ සිම්බාබ්වේ පිලට එරෙහි තරගාවලියේදීත් කණ්ඩායමේ නායකයා විය. එම තරගාවලිය 3-0 ක් ලෙසින් ජයගත් හෂ්මතුල්ලගේ ඇෆ්ඝනිස්ථානු කණ්ඩායම මේ වන විට අන්තර්ජාතික එක්දින ශ්‍රේණිගතකිරීම් අතරේ 10 වැනි ස්ථානය ගෙන සිටී.

"මෙම තරගාවලිය සඳහා ඇෆ්ඝනිස්තානු කණ්ඩායමට තරුණ මුහුණු කිහිපයක් ඇතුළත් කරලා තිබෙනවා. එය ලබන වසරේදී පැවැත්වෙන එක්දින ලෝක කුසලානය තරගාවලියට පිවිසීමට පෙර ඔවන් ගැන බලාගැනීමට අපට හොඳ අවස්ථාවක්" යයි ඇෆ්ඝනිස්ථානු ක්‍රිකට් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී නසීබ් ඛාන් මහතා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේය.

"ඒ වගේම ලබන වසරේ පැවැත්වෙන, ක්‍රිකට් ලෝකයේ දැවැන්තම තරගාවලිය සඳහා සුදුසුකම් ලබාගැනීමටත් මෙම තරග මාලාව අපට ඉතා වැදගත්" යයි ද නසීබ් ඛාන් මහතා පැවසීය.

ශ්‍රී ලංකාව සහ ඇෆ්ඝනිස්ථානය අතර පැවැත්වෙන මෙම තරගාවලිය ලෝක කුසලාන සුපිරි ලීගයට අයත් තරගාවලියකි.



**ශ්‍රී ලංකා සංචාරය සඳහා වන ඇෆ්ගනිස්ථාන එක්දින සංචිතය:**

හෂ්මතුල්ලා ෂාහිඩි (නායක), රහමට් ෂා (උප නායක), අස්මතුල්ලා ඕමාර්සායි, ෆරීඩ් මලික්, ෆසාල් හක් ෆාරුක්, ගුල්බදීන් නයිබ්, රමනුල්ලා ගුර්බාස් (කඩුලු රකින්නා), නජිබුල්ලා සද්‍රාන්, ඉබ්‍රාහිම් සද්‍රාන්, ඉක්‍රම් අලිකායිල් (අතිරේක කඩුලු රකින්න), මොහොමඩ් නබී, මුජිබුර් රහමන්, නූර් අහමඩ්, රෂීඩ් ඛාන්, රියාස් හසන්, ෂහිදුල්ලා කමාල්, යමින් අහමඩ්සායි සහ සියාවුර් රහමන් අක්බාර්

# මිසයිල අත්හදා බලන්න නායක කිම් ජොන් උන්ගේ දියණියත් ඇවිල්ලා

■ සෝල්හිදීය (ඒ.එෆ්.පී.)

**උතුරු කොරියානු නායක කිම් ජොන් උන්, සියදියණිය ලොවට හඳුන්වා දුන්නේය. ඒ, මිසයිල අත්හදා බැලීමේ නිරීක්ෂණයකට ඔහු දියණිය රැගෙන ආ අවස්ථාවේදීය.**


38 හැවිරිදි උතුරු කොරියානු නායක කිම් ජොන් උන් දියණිය කිම් චූ ඒගේ අතින් අල්ලා ගනිමින්, මිසයිල අත්හද බැලීමට පැමිණි අයුරු දැක්වෙන ඡායාරූප පෙළක් උතුරු කොරියානු රාජ්‍ය මාධ්‍ය ප්‍රසිද්ධියට පත් කළේ ඊයේ (20) ය. මිසයිල අත්හද බැලීමට කිම් ජොන් උන්ගේ බිරිඳ රී සොල් ජූ ද එක්වී සිටීම ද විශේෂත්වයකි.

මාධ්‍ය වාර්තා අනුව, කිම් ජොන් උන්ට දියණියන් දෙදෙනකු සහ පුතෙක් සිටී. දියණිය කිම් චූ ඒගේ වයස අවුරුදු 12 ක් හෝ 13 ක් විය හැකි බවට බටහිර මාධ්‍ය අනුමාන කර ඇත.

දියණිය කිම් චූ ඒ ගැන මාධ්‍ය හරහා පළමු වරට වාර්තාවක් පළ වූයේ 2013 වසරේ දී ඇමෙරිකන් විශ්‍රාමික බාස්කට් බෝල් ක්‍රීඩකයකු මෙන්ම හොලිවුඩ් නළුවකු ද වන ඩෙනිස් රොඩ්මන් උතුරු කොරියාවේ සංචාරයකට ගිය අවස්ථාවේදීය. රොඩ්මන්, පසුව මාධ්‍ය හමුවේ පවසා තිබුණේ තමන් කිම් ජොන් උන්ගේ සිඟිති දියණිය වඩාගෙන සුරතල් කළ බවය.

International News





## ලොව වටා

### මැලේසියා මහ මැතිවරණය:

# කාටවත් බහුතරය නෑ: මහතීර් මොහොමඩ්ට අන්ත පරාජයක්

■ ක්වාලාලම්පූර්හිදීය (ඒ.එෆ්.පී.)

**මැලේසියානු මහ මැතිවරණයේ ප්‍රතිඵල ඊයේ (20) නිකුත් වුණු අතර, තනිව රජයක් පිහිටුවීමට අවශ්‍ය බහුතර බලය දිනා ගැනීමට කිසිදු පක්ෂයක් සමත් වූයේ නැත.**

මැලේසියානු පාර්ලිමේන්තුව ආසන 222 කින් සමන්විතය. ප්‍රතිඵල නිකුත් වී අවසන් වෙද්දී 'පක්ටාන් හරප්පාන්' සන්ධානය ආසන 82 ක් දිනාගෙන සිටි අතර 'ජාතික සන්ධානය' දිනා ගෙන සිටියේ ආසන 73 කි.

වත්මන් මැලේසියානු අග්‍රාමාත්‍ය ඉස්මයිල් සබ්රි යාකුබ් සහ ඔහුගේ 'බරිසියන් ජාතික සන්ධානය' දිනා ගත්තේ ආසන 30 ක් පමණි. අග්‍රාමාත්‍ය ඉස්මයිල් සබ්රි යාකුබ් සහ ඔහුගේ 'බරිසියන් ජාතික සන්ධානය' ජනතා අප්‍රසාදයට පත් වූයේ එල්ල වී ඇති දූෂණ චෝදනා හේතුවෙනි. මේ අතර, මැලේසියාවේ කෘතහස්ථ දේශපාලනඥයකු වන හිටපු අග්‍රාමාත්‍ය මහතීර් මොහොමද් ද මෙම මැතිවරණයට ඉදිරිපත් විය. ඒ, ඔහු විසින් පිහිටුවා ගත් 'හෝම්ලැන්ඩ් ෆයිටර්ස්' පක්ෂයෙනි. කෙසේ නමුත්97 හැවිරිදි මහතීර් මොහොමද් මෙම මැතිවරණයේ දී දරුණු පරාජයක් ලැබුවේය. මහතීර් මොහොමඩ් ට ඔහුගේ ලංග්කාවී ආසනය පවා අහිමි විය. අඩ සියවසකට පසු මහතීර් මොහොමද් ලැබූ පළමු මැතිවරණ පරාජය වන්නේ මෙයයි. මහතීර් මොහමොඩ් වසර 22 ක් මැලේසියානු අග්‍රාමාත්‍ය ධුරය හෙබවීය. ඒ, 1981 සිට 2003 තෙක් කාලයේය. පසුව ඔහු දේශපාලනයෙන් විශ්‍රාම ගියේය. කෙසේ නමුත් මීට වසර දෙකකට පසු ඔහු යළි දේශපාලනයට පිවිසියේය. ඒ, දූෂණ චෝදනා හේතුවෙන් මැලේසියානු දේශපාලනයේ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වූ බැවිනි. 2018 වසරේ දී, 93 වැනි ජන්ම දිනයට ඔන්න මෙන්න කියා තිබියදී මහතීර් මොහොමද් යළි මැලේසියානු අග්‍රාමාත්‍ය ධුරයට පත්විය.

## දිනය 2022.11.18 සිකුරාදා නිල ප්‍රතිඵල

www.nlb.lk

**මහජන සම්පත** — දිනුම් වාරය : 4943
දිනා ඇති මුළු මුදල රු. 9,640,030.00
ජයග්‍රාහී අක්ෂරය K ජයග්‍රාහී අංක 1 3 2 3 9 9
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 47,065,859.00

**ගොවි සෙත** — දිනුම් වාරය 3185 — දිනා ඇති මුළු මුදල රු. 4,692,060.00
ඉංග්‍රීසි අක්ෂරය E ජයග්‍රාහී අංක 02 26 58 76
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,577,442.80

**ජාතික සම්පත** — දිනුම් වාරය : 1398
දිනා ඇති මුළු මුදල රු. 2,124,740.00
ජයග්‍රාහී ලග්නය මීන ජයග්‍රාහී අංක 9 0 0 3 1 9
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,895,620.40

**ධන නිධානය** — දිනුම් වාරය : 973
දිනා ඇති මුළුත්‍යාග මුදල රු. 2,466,320.00
ඉංග්‍රීසි අක්ෂරය H ජයග්‍රාහී අංක 24 28 64 70
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 133,687,652.00

**හඳහන** — දිනුම් වාරය 252 — දිනා ඇති මුළු මුදල රු. 8,173,940.00
ජයග්‍රාහී ලග්නය මකර ජයග්‍රාහී අංක 16 31 41 44
විශේෂිත ලග්නය මකර — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,024,133.40

**කෝටි 28+ Mega Power මෙගා පවර්** — දිනුම් වාරය : 1291
දිනා ඇති මුළු මුදල රු. 3,552,000.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 280,932,046.00
ඉංග්‍රීසි අකුර T සුපිරි අංකය 13 ජයග්‍රාහී අංක 31 44 46 54
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board — දු.ක. : 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475 Email : info@nlb.lk Web : www.nlb.lk
අංක 32, දේශමාන්‍ය එන්.එච්.ඩබ්ලිව්.පේ. මුදලිගේ මාවත, කොළඹ 01.

## දිනය 2022.11.19 සෙනසුරාදා නිල ප්‍රතිඵල

www.nlb.lk

**මහජන සම්පත** — දිනුම් වාරය : 4944
දිනා ඇති මුළු මුදල රු. 9,415,410.00
ජයග්‍රාහී අක්ෂරය H ජයග්‍රාහී අංක 3 7 6 6 9 8
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 47,711,159.00

**ගොවි සෙත** — දිනුම් වාරය 3186 — දිනා ඇති මුළු මුදල රු. 4,411,300.00
ඉංග්‍රීසි අක්ෂරය C ජයග්‍රාහී අංක 37 46 71 77
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,899,798.80

**ජාතික සම්පත** — දිනුම් වාරය : 1399
දිනා ඇති මුළු මුදල රු. 1,939,020.00
ජයග්‍රාහී ලග්නය කටක ජයග්‍රාහී අංක 5 1 1 1 5 3
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,950,434.40

**ධන නිධානය** — දිනුම් වාරය : 974
දිනා ඇති මුළුත්‍යාග මුදල රු. 3,465,160.00
ඉංග්‍රීසි අක්ෂරය K ජයග්‍රාහී අංක 16 53 65 78
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 133,687,652.00

**හඳහන** — දිනුම් වාරය 253 — දිනා ඇති මුළු මුදල රු. 7,918,560.00
ජයග්‍රාහී ලග්නය මිථුන ජයග්‍රාහී අංක 08 12 28 52
විශේෂිත ලග්නය මිථුන — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,059,861.40

**කෝටි 28+ Mega Power මෙගා පවර්** — දිනුම් වාරය : 1292
දිනා ඇති මුළු මුදල රු. 4,443,880.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 280,948,750.00
ඉංග්‍රීසි අකුර L සුපිරි අංකය 17 ජයග්‍රාහී අංක 19 60 62 77
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board — දු.ක. : 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475 Email : info@nlb.lk Web : www.nlb.lk
අංක 32, දේශමාන්‍ය එන්.එච්.ඩබ්ලිව්.පේ. මුදලිගේ මාවත, කොළඹ 01.




කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 නොවැම්බර් මස 21 වැනිදා සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.